# සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්




**සාර්ථකත්වය මත**

**ව්‍යාප්ත වෙමින්**

වාර්ෂික වාර්තාව

**2018**

# අන්තර්ගතය


## ආයතනික දළ විශ්ලේෂණය

01 දැක්ම හා මෙහෙවර
02 අප ගැන
05 කාර්ය සාධන විශේෂ අවස්ථා - 2018
06 වසර දෙස බැල්මක්
08 සම්මාන හා ප්‍රදානයන්

## අපේ නායකත්වය

09 සභාපතිතුමාගේ පණිවිඩය
11 කළමණාකාර අධ්‍යක්ෂවරයාගේ පණිවිඩය
13 අධ්‍යක්ෂ මණ්ඩලය
16 කළමණාකාරණ කණ්ඩායම

## කළමණාකරණ සාකච්ඡා හා විග්‍රහය

19 මූල්‍ය ප්‍රාග්ධනය
23 නිශ්පාදිත ප්‍රාග්ධනය
28 මානව ප්‍රාග්ධනය
07 සමාජීය හා සම්බන්ධතා ප්‍රාග්ධනය
35 ස්වභාවික ප්‍රාග්ධනය

## පාලනය හා අනුකූලතාවය

38 ආයතනික පාලනය
46 අවදානම් කළමණාකරණය
53 අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
55 විගණන හා කළමණාකරණ වාර්තාව

## මූල්‍ය තොරතුරු

58 විගණාධිපති වාර්තාව
64 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
65 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
66 ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය
67 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
68 මූල්‍ය ප්‍රකාශන වලට සටහන්
92 විස්තරාත්මක ආදායම් ප්‍රකාශය
93 වසර පහක මූල්‍ය සාරාංශය
ආයතනික තොරතුරු

# දැක්ම

දකුණු ආසියාවේ වඩාත්ම කාර්යක්ෂම තෙල් ක්‍රියාකරවුම් පර්යන්තය බවට පත්වීම.

# මෙහෙවර

පාර්ශව කරුවන්ගේ අපේක්ෂාවන් ඉටු කරමින් දිවයිනේ වඩාත්ම කාර්යක්ෂම හා ක්‍රියාකාරී සේවාවක් පවත්වා ගැනීමටත්, පාරිභෝගික අවශ්‍යතා සපුරාලමින් සපයන්නා වූ ඛණිජ තෙල් නිෂ්පාදන ධාරිතාවේ ගුණාත්මකභාවය සහතික කරමින්, අඛණ්ඩව වර්ධනයකින් යුතු පාරිභෝගිකයා තෘප්තිමත් කරන්නා වූ සේවයක් සැලසීමටත්, කැපවීමටත්, මහජන හා පාරිභෝගිකයන්ගේ ප්‍රතිචාර හා මාර්ගෝපදේශකත්වය මත පදනම් වූ පරිසරයට ගෞරවය දක්වමින් හා එහි ප්‍රමිතීන් සුරකිමින්, නීතිගරුක තෘප්තිමත් මනා පුහුණුවක් හා කැපවීමකින් යුත්, ශ්‍රම බලකායේ සහභාගිත්වය ලබාදීමත්, අපගේ මෙහෙවරය.



# අප ගැන

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාරික ආයතන පොදු සමාගම්වලට හැරවීමේ පනතේ 2 (1) වගන්තිය ප්‍රකාරව විධිමත් ලෙස සංස්ථාපනය කරන ලද සමාගමක් වන අතර එයට 2003 ඔක්තෝබර් 13 දිනැති අංක 1310/8 දරණ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ වඩාත් පූර්ණ ලෙස විස්තර කර ඇති තෙල් පර්යන්ත, ගබඩා පහසුකම්, නළ මාර්ග සහ ඉන්ධන ප්‍රවාහන වාහන යනාදියෙන් සමන්විත පොදු භාවිත පහසුකම්වල අයිතිය ඇත.

ශ්‍රී ලංකාවේ ඛණිජ තෙල් නිෂ්පාදන හැසිරවීම සඳහා වූ උසස් තත්ත්වයේ යටිතල පහසුකම්වලින් සමන්විත ඛණිජ තෙල් තොග ගබඩා කිරීමේ හා බෙදා හැරීමේ නියුක්ත සමාගමක් වන්නෙමු. තරඟකාරී සහ යහපත් ලෙස ඉන්ධන ගබඩා කිරීම හා බෙදාහැරීම ගොඩ නැගීම තුළින් ශ්‍රී ලංකා සංවර්ධන ගමන්මඟට සහයවීම සඳහා අපගේ බැඳීම පෙන්වා දෙමින් අපගේ පාර්ශවකාර වටිනාකම් කොටස අඛණ්ඩව ශක්තිමත්කරමින් සිටින්නෙමු.

මෙම සමාගම එහි ප්‍රාග්ධන කොටසින් 2/3 ක් අයත් ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන අතර ඉතිරිය ඉන්දියන් තෙල් සමාගමට අයත් වේ. බලශක්ති ක්ෂේත්‍රය තුළ පාරිසරික තිරසාරත්වය සහතික කරමින් කොටස්කරුවෙක් වීමට මව් සමාගමේ ආසන්න වශයෙන් අත්දැකීම සහ පළපුරුද්ද තුළින් සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ප්‍රතිලාභ ලබයි.

රටේ සිල්ලර පාරිභෝගිකයින්ගේ සහ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ සම්බන්ධ විවිධ කාර්මික අංශයන් හී තොග පාරිභෝගිකයින් විශාල සංඛ්‍යාවකගේ බලශක්ති සපුරාලීම ලංකා ඛණිජ තෙල් සංස්ථාවට සහ ඉන්දියන් තෙල් සමාගමට අයත් දිවයින පුරා පිහිටි ඉන්ධන පිරවුම්හල් දහසකට පමණ අපි සේවය කරන්නෙමු. මේ සඳහා සමාගමේ විවිධ කටයුතුවල ක්‍රියාකාරී ලෙස සහභාගිවන 3000ක පමණවන සේවකයින් සමගින් ගබඩා කිරීමේ, බෙදාහැරීම් ජාලයේ නියුක්ත තොග ගබඩා 11ක් ප්‍රධාන පර්යන්ත දෙකට සහය වේ.

### ප්‍රධාන පර්යන්තයන්

- කොලොන්නාව නිමාව හා මුතුරාජවෙල පර්යන්තය

### තොග ගබඩා

- අනුරාධපුර
- මඩකලපුව
- හපුතලේ
- බදුල්ල
- ගාල්ල
- කන්කසන්තුරේ
- කොටගල
- මාතර
- සරසවි උයන
- කුරුණෑගල
- පේරාදෙනිය



කොලොන්නාව නිමාව පෙට්‍රෝලියම් නිෂ්පාදන 12ක් මෙහෙයවන අතර මුතුරාජවෙල පෙට්‍රෝලියම් නිෂ්පාදන 5ක් මෙහෙයවයි.

කොලොන්නාව හා මුතුරාජවෙල ප්‍රධාන පර්යන්තයන් දෙක මෙහෙයවන ලංකා බණිජ තෙල් සංස්ථාව සහ ඉන්දියන් තෙල් සමාගම යන අලෙවිකරණ සමාගම් වෙනුවෙන් පෙට්‍රෝලියම් නිෂ්පාදන බෙදාහැරීම සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි බෙදාහැරීමේ කාර්යය භාරගන්නා අතර දිවයින පුරා පෙට්‍රෝලියම් නිෂ්පාදන බෙදාහැරීම ශක්තිමත් කරයි. CPSTL විසින් බාහිර තොග ගබඩා 11ක් සහ අභ්‍යන්තර දුම්රිය ගබඩා මෙහෙයවමින් සිටී. මෙවැනි ස්ථානවලට සහ අභ්‍යන්තර දුම්රිය ගබඩාව වෙත නිෂ්පාදන නැවත පිරවීම CPSTL සහ ප්‍රධාන පර්යන්තයන්හී කුලියට ගත් මාර්ග බවුසර් භාවිතයෙන් කොලොන්නාව නිමාව තුළ පිහිටි දුම්රිය බොගී තුළින් සිදුවේ. ගුවන්යානා ඉන්ධන කොලොන්නාවේ නිමාවේ පමණක් ගබඩා කරන අතර දුම්රිය මගින් කටුණායක බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපලට මාරු කරනු ලැබේ. ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් මෙහෙයවනු ලබන රත්මලාන සහ අනෙකුත් ගුවන් ක්ෂේත්‍රයන් ඔවුන්ගේ අවශ්‍යතාවය මාර්ගයෙන් ලබා ගනී. සල්ප අඩු දැවි තෙල් මුතුරාජවෙල නිමාවේ පමණක් ගබඩා කරන අතර විශේෂ නළ මාර්ගයක් තුළින් කෙරවලපිටිය බලශක්ති පිරියතට මාරු කරනු ලැබේ.

කොලොන්නාවේ නිමාවට පිරිපහදුවෙන් සහ කොළඹ වරායේ ඩොල්පින් ජැටියේදී මුදාහරින ලද ආනයනික තෙල් පටවන නැව් තුළින් නිෂ්පාදන ලැබේ. මුතුරාජවෙල පර්යන්තය වෙත කෙරවලපිටිය තීරය පිට ආසන්න වශයෙන් කිමී 6ක් දුර පිහිටි SPBM තුළින් ආනයනික කාර්ගෝ පමණක් ලැබේ.

| ව්‍යාපාරික සිරස | ස්ථානගතකිරීම |
|---|---|
| ඔටෝමෝටිඩ් ඉන්ධන ගබඩාව | මෙට්‍රික් ටොන් 450,000ක් පමණ වන ආනයන සහ පිරිපහදු විවිධ වර්ගයේ පෙට්‍රෝලියම් කොලොන්නාව සහ මුතුරාජවෙල සහ දිවයින පුරා ගබඩාවල අපි තැන්පත් කරමු. |
| ඔටෝමෝටිව් ඉන්ධන බෙදාහැරීම | වර්තමානයේ අපි දිවයින පුරා මෙරට ඔටෝමෝටිඩ් පෙට්‍රෝලියම් නිෂ්පාදනවලින් 85%ක් අපි ලබා දෙන්නෙමු. |
| මාර්ග ටැන්කර් | ප්‍රධාන බෙදාහැරීම් මාර්ගය මාර්ග ටැන්කර් වන අතර එය දිවයින පුරා පෙට්‍රෝලියම් නිෂ්පාදන ප්‍රවාහනයෙන් 66%කට ආසන්නව දායක වේ. |
| දුම්රිය වැගන් | දෙවන ප්‍රධාන බෙදාහැරීම් මාර්ගය වන්නේ දුම්රිය මාර්ග ප්‍රවාහනය වන අතර එය දිවයින පුරා පෙට්‍රෝලියම් නිෂ්පාදන ප්‍රවාහනයෙන් 17%කට ආසන්නව දායක වේ. |
| නළ මාර්ගය | අනෙක් බෙදාහැරීමේ මාර්ගය නළ මාර්ග මාරුකිරීම් වන අතර එය ප්‍රධාන වශයෙන් කැලණි තිස්ස සහ කෙරවලපිටිය සහ සපුගස්කන්ද පිරිපහදුව සඳහාය. |





කන්කසන්තුරේ තොග ගබඩාව
අනුරාධපුර තොග ගබඩාව
මඩකලපුව තොග ගබඩාව
කුරුණෑගල තොග ගබඩාව
මුතුරාජවෙල පර්යන්තය
පේරාදෙනිය තොග ගබඩාව
සරසවි උයන තොග ගබඩාව
කොලොන්නාව පර්යන්තය
කොටගල තොග ගබඩාව
බදුල්ල තොග ගබඩාව
හපුතලේ තොග ගබඩාව
ගාල්ල තොග ගබඩාව
මාතර තොග ගබඩාව

# කාර්යසාධන
## වැදගත් අවස්ථා

| | | | 2018 | 2017 | 2016 |
|---|---|---|---|---|---|
| | **ක්‍රමෝපායික ප්‍රමුඛතාව : මූල්‍ය වර්ධනය** | | | | |
| මූල්‍ය ප්‍රාග්ධනය | ආදායම | ශ්‍රීලංරු | **13,130** | 14,176 | 12,663 |
| | මෙහෙයුම් ලාභය | ශ්‍රීලංරු | **1,405** | 3,208 | 2,406 |
| | බදු පෙර ලාභය/අලාභය | ශ්‍රීලංරු | **1,522** | 3,273 | 2,330 |
| | බදු පසු ලාභය/අලාභය | ශ්‍රීලංරු | **254** | 2,717 | 1,949 |
| | ස්කන්ධය මත ඉපයීම | % | **1%** | 11% | 9% |
| | **මූල්‍ය ස්ථාවරත්වය** | | | | |
| | මුළු වත්කම් | ශ්‍රීලංරු | **30,322** | 29,991 | 28,059 |
| | මුළු වගකීම් | ශ්‍රීලංරු | **5,556** | 4,828 | 5,208 |
| | කොටස්හිමි අරමුදල | ශ්‍රීලංරු | **24,766** | 25,163 | 22,851 |
| | මුදල් හා මුදලට සමාන දෑ | ශ්‍රීලංරු | **3,149** | 1,474 | 2,455 |
| | **කොටස්හිමියන්ගේ තොරතුරු** | | | | |
| | කොටසක ඉපයීම | ශ්‍රීලංරු | **0.26** | 3.73 | 2.32 |
| | කොටසක ලාභාංශය (ගෙවූ) | ශ්‍රීලංරු | **0.868** | 0.54 | 0.65 |
| | කොටසක ශුද්ධ වත්කම් අගය | ශ්‍රීලංරු | **33** | 33 | 30 |
| මූල්‍ය ප්‍රාග්ධනය | ආර්ථික අගය එකතු කිරීම | ශ්‍රීලංරු.මි | **673** | 1,394 | 799 |
| | **ක්‍රමෝපායික ප්‍රමුඛතාව : මෙහෙයුම් අනර්ඝත්වය** | | | | |
| | **දේපල, පිරියත හා උපකරණ** | | | | |
| | පර්යන්ත ගබඩා | ගණන | **13** | 14 | 14 |
| | ප්‍රාග්ධන වියදම | ශ්‍රීලංරු | **375** | 833 | 913 |
| | **ක්‍රමෝපායික ප්‍රමුඛතාව : ජනතාව තුළ ආයෝජනය** | | | | |
| මානව ප්‍රාග්ධනය | මුළු සේවකයින් | ගණන | **2932** | 3,045 | 3,118 |
| | කාන්තා නියෝජනය | ගණන | **334** | 343 | 351 |
| | සේවකයින්ට ගෙවීම් | ශ්‍රීලංරු.මි | **6853** | 5,570 | 5,782 |
| | සේවක බෙදීම් අනුපාතය | % | **6%** | 1% | 1% |
| | පුහුණු තුළ ආයෝජනය | ශ්‍රීලංරු.මි | **22** | 32 | 30 |
| | මුළු පුහුණු පැයගණන | පැය | **12609** | 21,832 | 26,088 |
| සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය | සාමාන්‍ය පුහුණු පැය/සේවකයා | පැය | **7** | 9 | 11 |
| | සේවකයෙකුට ආදායම | ශ්‍රීලංරු.මි | **4.48** | 4.67 | 4.06 |
| | සේවකයෙකුට ශුද්ධ ලාභය (අලාභය) | ශ්‍රීලංරු.මි | **0.09** | 0.9 | 0.63 |
| | වක්‍ර සේවකයින් (ආසන්න වශයෙන්) | ගණන | **63** | 105 | 114 |
| | පාරිභෝගික ස්පර්ශක ස්ථාන | ගණන | **40** | 40 | 40 |
| | ආයතනික සමාජීය වගකීම් තුළ ආයෝජනය | ශ්‍රීලංරු.මි | **2.1** | 6.1 | 5.7 |
| | ප්‍රතිලාභීන් ගණන (ආසන්න වශයෙන්) | ගණන | **8700** | 8,500 | 7,000 |
| | රජයට දායකත්වය | ශ්‍රීලංරු.මි | **2579** | 2,175 | 1,895 |
| ස්වාභාවික ප්‍රාග්ධනය | **ක්‍රමෝපායික ප්‍රමුඛතාව : තිරසාරත්වය** | | | | |
| | බලශක්ති පරිභෝජනය | කි.වොට් | **3,286,631** | 2,904,300 | 2,914,112 |
| | ජල පරිභෝජනය | කි.ලී | **333** | 276 | 270 |

# වසර දෙස බැල්මක්

**ආදායම**

13
බි.

**විකුණුම් පරිමාව**

5,277,925
කි.කි.

**බදු පසු ලාභය**

197
මි.

**වත්කම් පදනම**

30.3
බි.

ආදායම (ශ්‍රීලං. රු.මි.)




බදු පසු ලාභය (ශ්‍රීලං. රු.මි.)




විකුණුම් පරිමාව (කි.ලි)




මුළු වත්කම් (ශ්‍රීල. රු.බි)



පිරිවැටුම් වත්කම් (%)




වර්තක අනුපාතය (කාලය)




කොටස්හිමි අරමුදල (ශ්‍රීලං රුපි.)




ස්කන්ධය මත ඉපයීම




තෝලන අනුපාතය (කාලය)




කොටසක ශු.ව.අගය (ශ්‍රීලං රු)



# සම්මාන සහ ප්‍රදානයන්

**අපගේ බැඳීම නැවත තහවුරු කරමින්, මූල්‍ය වර්ෂය පුරාම ගෞරව ප්‍රදානයන් කිහිපයක් සමඟ අප පිළිගෙන ඇත.**

- අඛණ්ඩව දෙවන වරටත්, ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය විසින් සංවිධානය කරන ලද කර්මාන්ත අනර්ඝත්වය සඳහා ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලයේ කර්මාන්ත අනර්ඝත්ව උත්සවයේදී ජාතික මට්ටමේ රාජ්‍ය අංශය සහ ඉහළම ජයග්‍රහකයා පිළිබඳ ලෝකඩ සම්මානය සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් විසින් දිනා ගන්නා ලදී.

- කම්කරු අමාත්‍යංශයේ මානව සම්පත් සංවර්ධන අංශයේ සමාජ සංවාදය සහ සේවා ස්ථානවල සහයෝගිතා ඒකකය විසින් සංවිධානය කළ සමාජ සංවාදය සහ සේවා ස්ථානවල සහයෝගිතා සම්මානය 2017 මහා පරිමාණ සේවා අංශය යටතේ ලෝකඩ සම්මානය සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් විසින් දිනා ගන්නා ලදී.










# සභාපතිතුමාගේ
## පණිවිඩය

"රුපියල් බිලියන 13ක් වූ වසර සඳහා මුළු ආදායම 2017 සිට 7%කින් පහත වැටී ඇත. දළ ලාභය රුපියල් මිලියන 5,227ක් වූ අතර, එය පසුගිය වසරට වඩා 23%ක අඩුවීමකි. රුපියල් මිලියන 254ක් වූ ශුද්ධ ලාභය 2017 සිට 91%කින් පහත වැටී ඇත. 2018 වසරේදී තාවකාලික බාධාවන්ට අපි මුහුණ දෙනු ලැබුවත්, අපගේ සමාගම 2017 සඳහා රුපියල් 0.80ක කොටසක ලාභාංශයක් ප්‍රකාශ කළ අතර, 2018 දී එය ගෙවනු ලැබිය."



අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හී වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම මාහට සතුටකි. සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ අපගේ සේවාවන් අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයකට මුහුණ දුන්හ. ඒවා දේශීය සහ සාර්ව මෙහෙයුම් පරිසරය තුළ සංවර්ධනයන්ගෙන් ඇති වූ අතර රටතුළ මෙන්ම පෙට්‍රෝලියම් අංශයට විශේෂිත අභියෝග විය.

### මෙහෙයුම් පරිසරය

මූල්‍ය ප්‍රතිපත්තිය, සංකෝචිත මූල්‍ය ක්‍රියාමාර්ග, BOP වෙළෙඳ හිඟය පුළුල්වීම, සහ දේශපාලන අස්ථාවරත්වය තුළ තවදුරටත් ශක්තිමත් කළ දුර්වල ගෘහස්ථ ඉල්ලුම 2018 දී වර්ධන අනුපාතය කෙරෙහි බලපාන ලද ප්‍රධාන හේතු ලෙස දැකිය හැකිය. ශ්‍රී ලංකා ආර්ථිකය 2018 වසර තුළ 3.2%ක මධ්‍යස්ථ ප්‍රමාණයකින් වර්ධනය වී ඇති බවට තක්සේරු කරන ලදී. 2018 වසර තුළ රුපියලේ අගය ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව ආසන්න වශයෙන් 16%කින් අඩු වී ඇති අතර ඒ තුළින් පසුගිය 2017 වසර තුළ 2%ක අඩුවීමට සාපේක්ෂව වසරේ අගභාගයේදී වේගවත් නැග්මක් පෙන්නුම් කරන ලදී.

ඉහළ ගිය ඉන්ධන මිල ගණන් හේතු කොට ගෙන ප්‍රවාහන අංශය තුළද ගැටළුවකට මුහුණ දුන් අතර, 2018 වසර අවසානයේදී සංචාරක කර්මාන්තයද අහිතකර සංචාරක උපදේශකයන්ගේ හා දේශපාලන අස්ථාවරත්වයෙහි ප්‍රතිඵලයක් ලෙස අභියෝගවලට මුහුණු දුන්හ.

සමස්ත පාරිභෝගිකයින් තමන්ගේ අභිමතානුකූල වියදම් කිරීම සීමාකිරීම එහි ප්‍රතිඵලය වූ අතර එය ශ්‍රී ලංකා ආර්ථිකයට සෘජුවම බලපාන ලදී. වසර තුළ පැවති හිතකර කාලගුණ තත්ත්වය හේතු කොට ගෙන, විදුලි බල උත්පාදන අංශයේ ඉල්ලුම පසුගිය වසරේ සිට 38%කින් පහත වැටී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් විසින් මෙහෙයවන සමස්ථ පරිමාව 2017 වසරේ සිට 3%කින් පහත වැටී ඇති අතර එම ප්‍රමාණය ලීටර් මිලියන 169ක් විය.

CPSTL යනු අපගේ අවසාන පරිශීලකයා - පාරිභෝගිකයා වෙත ඛණිජතෙල් නිෂ්පාදන සුමටව හා බාධාවක් නොමැතිව සැපයීම සඳහා ප්‍රධාන වගකීම සහිතව රට තුළ ඛණිජතෙල් නිෂ්පාදන මෙහෙයවන ප්‍රධාන සමාගමය. මෙම නිෂ්පාදන ආරක්ෂිතව, උසස් තත්ත්වයෙන් ලබාගැනීමේ හැකියාව සහතික කිරීමේ තනි වගකීම CPSTL සතුවන අතර එය අප රටේ සියලුම පුරවැසියන්ගේ ජීවිතයේ අවශ්‍ය සහ අත්‍යවශ්‍ය කොටසකි,

එමෙන්ම නිවැරදි ප්‍රමාණවලින් අපගේ බෙදාහරින්නන්, පර්යන්ත පහසුකම පරිශීලනය කරන්නන් සහ අපගේ පාරිභෝගිකයින් වෙත අපගේ නිෂ්පාදන බෙදාහැරීම සහතික කිරීම සඳහා අපි වගකීමට බැඳී සිටිමු. අපගේ මනාව පුහුණුවලත් ශ්‍රම බලකායේ කැපවීම නොමැතිව මෙම අරමුණු මුදුන්පත්කර ගැනීම සිදුකළ නොහැක. අපගේ පාරිභෝගිකයින් සහ අපගේ සේවකයින් ආරක්ෂා කිරීම, පරිසරය සුරක්ෂිත කිරීම සහ රටේ ආර්ථිකයට දායකවීම අප ගොඩ නගන සහ අපගේ ව්‍යාපාරය පවත්වාගන්නා ප්‍රධාන කුළුණු තුන වේ.

# සභාපතිතුමාගේ
## පණිවිඩය

### අපගේ කාර්යසාධනය

සැලකිල්ලට භාජනය වන කාලසීමාව තුළ අපගේ සමාගම විසින් මුහුණ පෑ අනෙකුත් ප්‍රධාන අභියෝගය වූයේ පසුගිය වසරේ සිට කාර්ය මණ්ඩල පාරිශ්‍රමික 23%කින් එනම් පසුගිය වසරට වඩා ඉහළ අගයක් වන බිලියන 1.24 දක්වා ඉහළ නැගීමයි. මේ තුළින් මූල්‍ය ප්‍රතිඵල කෙරෙහි ඉහළ ගමන් මඟක් සහ ඛණිජතෙල් නිෂ්පාදන ඉල්ලුම තුළ ක්‍රමික පහත වැටීමක් පෙන්නුම් කරන ලදී. ඉහත කරුණු අපගේ ආන්තිකයන් කෙරෙහිද බලපාන ලද අතර එය පහළ මූල්‍ය ප්‍රතිඵල කරා හේතු විය.

දේශපාලන අවිනිශ්චිතතාවයට අමතරව, ලීටරයකට රු. 0.13 කින් මුළු ආදායම අඩුවීම ආදායම පහත වැටීම කරා දායක වූ ප්‍රධාන සාධකය වන අතර එය රුපියල් මිලියන 700ක අහිතකර බලපෑමක් ව පැවතින.

රුපියල් බිලියන 13ක් වූ වසර සඳහා මුළු ආදායම 2017 සිට 7%කින් පහත වැටී ඇත. දළ ලාභය රුපියල් මිලියන 5,227ක් වූ අතර, එය පසුගිය වසරට වඩා 23%ක අඩුවීමකි. රුපියල් මිලියන 254ක් වූ ශුද්ධ ලාභය 2017 සිට 91%කින් පහත වැටී ඇත. 2018 වසරේදී තාවකාලික බාධාවන්ට අපි මුහුණ දෙනු ලැබූවත්, අපගේ සමාගම 2017 සඳහා රුපියල් 0.80ක කොටසක ලාභාංශයක් ප්‍රකාශ කළ අතර 2018 දී එය ගෙවනු ලැබීය.

2018 දී, අපි ක්‍රමෝපායික සංවර්ධන වැඩසටහන් ගණනාවක් සිදුකළ අතර, ඒවායින් අනාගතයේදී CPSTL හී මෙහෙයුම් කෙරෙහි සැලකියයුතු බලපෑමක් ඇති විය හැක.

කොලොන්නාව නිමාවේ ඝණ මීටර් 15,000 ටැංකියෙන් 60%ක් නිම කිරීම, කලාප 6 හි නළමාර්ග පද්ධතිය උසස් කිරීම, කලාප අංක 03 හි මෙහෙයුම්කරුවන් සඳහා පහසු සහ ආරක්ෂිත සේවා පරිසරයක් ලබාදීමට වැගන් පිරවුම් ගැන්ට්‍රි ඉදිකිරීම, කොලොන්නාව නිමාවේ ටැංකි කිහිපයක් සඳහා අභ්‍යන්තර පාවෙන වහල ස්ථාපනය කිරීම, මුතුරාජවෙල ටැංකි තුනක් සඳහා අභ්‍යන්තර පාවෙන වහල සැලසුම් කිරීම, සැපයීම සහ ස්ථාපනය කිරීම හා මුතුරාජවෙල නිමාවේ නිෂ්පාදන පිරවුම් පහසුකම වැඩිදියුණු කිරීම වසර තුළ සිදුකරන ලද ප්‍රධාන ව්‍යාපෘතිවලට ඇතුළත් වේ.

ප්‍රජාවන් සමඟ සහභාගිත්වය තුළින් සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය ගොඩ නැගීමට උත්සාහ ගනිමින්, විවිධ ක්ෂේත්‍ර කරා පැතිරී යන වඩාත් බලපෑම්සහගත ආයතනික සමාජ වගකීම් වැඩසටහන් කීහිපයක් තුළින් ප්‍රජාවගේ වර්ධනය සඳහා අපි දායක වී ඇත.

CPSTL අභ්‍යන්තර සහ බාහිර යන දෙයාකාර විගණන කාර්යයන් ස්ථිර සමාලෝචනය යටතේ වගවීම විධිමත් පරිදි මුදා හරිමින් යහපාලන මූලධර්මවලට බැඳී සිටී.

CNCI කර්මාන්ත අනර්ඝත්ව ප්‍රදාන උත්සවයේදී මහා පරිමාණ සේවා - රාජ්‍ය අංශය යටතේ ජාතික රිදී සම්මානයෙන් අපි පිදුම් ලැබුවෙමු.

### පිළිගැනීම

ඵලදායි ලෙස අවංකව ආයතනික පාලන ව්‍යවහාරයන්ට අනුකූලව CPSTL මෙහෙයවන බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය උත්සාහ ගනී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ මගේ සහය සාමාජිකයින් සියලූම දෙනා විසින් මා වෙත ලබාදෙන ලද අප්‍රමාදී සහ අමිල මඟපෙන්වීම සහ සහයෝගය නොමැතිව CPSTL සාර්ථකත්වය කරා ගෙනයාමට මාහට නොහැකි වනු ඇත. 2018 අභියෝගාත්මක වසරක් තුළ මා සමඟ සිටිමින් මා වෙත දෙන ලද අප්‍රමාදී සහ අමිල දායකත්වය වෙනුවෙන් සියලූම දෙනා වෙත ස්තූතිය පුදකිරීමට මම කැමැතිවන අතර ස්ථාවරත්වය සහ ශක්තිය සමඟ අභියෝගාත්මක වසර තුළ ඔවුන්ගේ උත්සාහයන් සඳහා CPSTL කණ්ඩායමට මම ස්තූතිවන්ත වෙමි.

CPSTL හි කාර්ය මණ්ඩලය ඔවුන්ගේ නොසෙල්වෙන වැඩ සදාචාර සහ සේවාවට කැපවීම සමඟ අභියෝගාත්මක කාලයන් තුළ සමාගම වෙත දායකත්වය ලබාදී ඇත. ඔවුන් සියලූම දෙනා වෙත ස්තූතිය පුදකර සිටින අතරම ඔවුන්ගේ බැඳීම සම්බන්ධයෙන් මගේ අගය කිරීම මෙසේ සටහන් කරමි. අවසාන වශයෙන්, අපගේ හැකියාවන් කෙරෙහි විශ්වාසය තබන ලද අපගේ කොටස් හිමියන් දෙදෙනාට, ව්‍යාපාර හවුල්කරුවන්ට සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට ස්තූතිය පුදකිරීමට මම කැමැත්තෙමි. අපගේ ඉදිරි වර්ධන ගමන්මඟ අඛණ්ඩව ඉදිරියට ගෙන යමින් ඔබගේ විශ්වාසයට අප තවදුරටත් ගෞරව කරන අතරම ආයතනික පාලන ප්‍රමිති පවත්වා ගැනිම තුලින් සංස්ථාපිත ආයතනයක් ලෙස අපගේ අවංකභාවය තවදුරටත් ශක්තිමත් කරමු.

ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය ගරු කබීර් හසීම් මැතිතුමාට සහ නියෝජ්‍ය අමාත්‍ය ආචාර්ය අනෝමා ගමගේ මැතිතුමියට අප කෙරෙහි තබන ලද විශ්වාසයට සහ ලබාදෙන ලද මඟපෙන්වීම වෙනුවෙන් මාගේ අවංක කෘතඥතාවය පළකිරීමට මම මෙය අවස්ථාව කරගනිමි. එමෙන්ම මගේ සහය අධ්‍යක්ෂවරුන්ට, CPSTL හී කලමනාකාරිත්වයට හා සේවකයින්ට මෙන්ම ව්‍යාපාර හවුල්කරුවන්ට ඔවුන්ගේ පක්ෂපාතිත්වය සහ අනුග්‍රහය වෙනුවෙන් ස්තූතිය පුද කිරීමට මෙය අවස්ථාව කර කරගනිමි. ඉදිරි වර්ෂවලදී එකමුතුකම පිළිබඳ හැඟීමෙන් සහ කැපවීම් පිළිබඳ උනන්දුවෙන් නව අභියෝග යන්ට මුහුණ දෙමු.



**පී.එස්. විතානගේ**
සභාපති

# කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ
## පණිවිඩය

**“ වසරේ දුර්වල මූල්‍යමය කාර්යසාධනය හමුවේ වුවත්, 2018 මූල්‍ය වර්ෂය තුළ, ශ්‍රී ලංකා රජයට සහ ආර්ථිකයට සැලකියයුතු දායකත්වයක් අපි විසින් සිදුකර ඇති බව වාර්තා කිරීමට ලැබීම අපට සතුටකි. 2018 වර්ෂය තුළ, සෘජු බදු තුළ රු. මිලියන 563 ක් රජයේ බදු ආදායමට දායකවෙමින් සහ පරිභෝජන බදු තුළ රු. මිලියන 2,016 ක් අයකරමින් CPSTL දායකත්වය දක්වා ඇති අතර එහි එකතුව රු. මිලියන 2,576ක් වන අතර එය වාර්ෂිකව 19%ක වැඩිවීමක් නියෝජනය කරයි. ”**



2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන තුළින් ඔබත් සමඟ මාගේ අදහස් හුවමාරුකර ගැනිමට අවස්ථාව ලැබීම මා ලද ගෞරවයක් මෙන්ම වරප්‍රසාදයකි. අනුකූලතාවය, යහ පාලනය සහ තිරසාරාත්මක වර්ධන මූලධර්ම මත පදනම් වූ සමාගමේ පාර්ශ්වකාර කේන්ද්‍රීය ක්‍රමෝපායන් සහ කාර්යයන් පිළිබඳ ගැඹුරු අවබෝධයක් අපගේ වාර්තාවෙන් ඔබ වෙත ලැබෙන බව මම විශ්වාස කරමි. ඛණිජ තෙල් නිෂ්පාදන පර්යන්ත කර්මාන්තය තුළ අඛණ්ඩව පැවති වෙළෙඳපොල කොන්දේසිවල විවිධ අභියෝග හමුවේ වුවත්, වසර තුළ රුපියල් බිලියන 13ක ආදායමක් සහ රුපියල් බිලියන 0.197ක ලාභයක් සමාගම විසින් උපයාගෙන ඇති බව වාර්තා කිරීමට ලැබීම මට සතුටකි.

ආර්ථිකය, වෙළෙඳපොල උච්චාවචනය සහ මිලකරණ ගැටළු හමුවේ, ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය 3.2% දක්වා තරමක් ඉහළ ගිය අතර, හිතකර කාලගුණ තත්ත්වයන් කර්මාන්ත ක්ෂේත්‍රය කෙරෙහි ශුභවාදී බලපෑම් සමඟ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඉහළ කාර්යසාධනයකට හේතු විය. රුපියලේ තියුණු පහත බැසීම සහ ගෘහස්ථ ඛණිජතෙල් මිලගැලපීම් සඳහා මිල සූත්‍රය හඳුන්වාදීම හමුවේ වුවත්, වසර තුළ ප්‍රධාන සහ මධ්‍ය උද්ධමනය තනි එක් අංකයන් මත රඳාපැවතුනු අතර එයට සක්‍රීය මූල්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග, වර්ධිත ගෘහස්ථ සැපයම් තත්ත්වයන් සහය වූ අතරම මැඩපවත්වන ලද එකතුකළ ඉල්ලුම් තත්ත්වයන්ද හේතු විය.

වසර තුළ පැවති හිතකර කාලගුණ තත්ත්වයන් නිසා 2018 දී ආහාර මිල ගණන් බොහෝ සෙයින් පහත වැටුණ බැවින් ආහාර වර්ගවල මිලෙහි වෙනස්වීමට සමගාමීව උද්ධමනය ඉහළ පහළ යාම හේතු කොට ගෙන වසර තුළ උද්ධමනය 2017 දී පැවති 6.5 සිට 4.3 දක්වා අඩුවිය.

ඛණිජතෙල් සඳහා ශ්‍රී ලංකාවේ ඉල්ලුම ප්‍රධාන වශයෙන්ම ප්‍රවාහන අංශයෙන් මෙහෙයවන අතර එය පරිභෝජනයෙන් 60%කට වඩා දායක වේ. පෙට්රල් සහ ඩීසල්වල ඉල්ලුම පිළිවෙලින් 10%කින් සහ 2%කින් වැඩිවීමත් සමඟ වසර තුළ ස්වයංක්‍රිය ඉන්ධන සඳහා ඉල්ලුම 5%කට ආසන්නව වැඩිවිය.

### කාර්යසාධන දළ විශ්ලේෂණය

අභියෝගාත්මක කර්මාන්ත භූ දර්ශනය සහ ආර්ථික හා වෙළෙඳපොල උච්චාවචනය හමුවේවුවත්, ලීටර් බිලියන 5.27 කට ආසන්න ප්‍රසංශනිය ඛණිජතෙල් නිෂ්පාදන පරිමාවක් අපි අත්කර ගත් අතර, එය පසුගිය වසරට වඩා 3%ක අඩුවීමකි. මෙම හේතුව නිසා, ආදායම ද 7%කින් පහත වැටුණ අතර එය වසර සඳහා ලාභයට බලපාන ලදි. වාර්ෂිකව 7%ක පහත වැටීමක් නියෝජනය කරන රුපියල් බිලියන 13.1ක ආදායමට අපගේ ඛණිජතෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදාහැරීමේ පරිමාවන් හී අඩුවීම හේතු වී ඇත. 2018 ජනවාරි 01 දින සිට සැම වසර තුනකට වරක් ක්‍රියාත්මක CPSTL කාර්ය මණ්ඩලයේ පාරිශ්‍රමිකවල වැඩිවීම හා සම්බන්ධ

# කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ
## පණිවිඩය

ආදායම පහත බැසීම 2018 මූල්‍ය වර්ෂය සඳහා රුපියල් මිලියන 1,522ක වාර්තා කරමින් වාර්ෂිකව CPSTL හී බදු පෙර ලාභය 53% කින් පහත වැටීමකට මඟ පාදන ලදී.

රු.0.13 කින් මුළු ආදායම් අනුපාතය අඩුවීම, පසුගිය වසරේ සිට 38%කින් කෙටිකාලීන පොලී ආදායම තුළ අඩුවීම සහ 23%කින් (රු. මිලියන 1,243) පාරිශ්‍රමික පිරිවැය වැඩිවීම සහ 2017 දී පැවති 10% සිට 2018 දී 28% දක්වා බදු අනුපාතයෙහි වැඩිවීම හේතු කොට ගෙන 180%කින් (රු. මිලියන 851) බදුකරණය තුළ ඉහළයාම වැනි 2018 වසර තුළ සමාගමේ කාර්යසාධනය කෙරෙහි සෘණාත්මකව බලපාන ලද වැදගත් සාධක කිහිපයක් තිබුනද, රු. මිලියන 197ක ශුද්ධ බදු පසු ලාභයක් අපි අත්කරගත්තෙමු.

CPSTL හී අපගේ යටිතල පහසුකම් අපි පුළුල්කළ බැවින් ප්‍රාග්ධන වියදම රු. මිලියන 573ක් විය. රටතුළ වර්ධනය වන බලශක්ති ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමට මව් සමාගම වන ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව (CPC) සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම සමඟ කටයුතු කරමින් සමාගම තුළ මෙන්ම රටතුළ දිගුකාලීන තිරසාර වර්ධනය සඳහා ආයෝජනය කිරීමට අපි බැඳී සිටිමු.

### කොටස්හිමියන්ට ලාභාංශ

වසරේ දුර්වල මූල්‍යමය කාර්යසාධනය හමුවේ වුවත්, 2018 මූල්‍ය වර්ෂය තුළ CPSTL හි අධ්‍යක්ෂ මණ්ඩලය රුපියල් මිලියන 651ක් නිර්දේශකරන ලද අතර එය කොටසකට ශත අසූව (80) බැගින් ලාභාංශයකට හේතු විය. ලාභාංශවල වැඩිවීම 61%ක් වූ අතර එය 2017 වසරට සාපේක්ෂව 330%කි.

### ශ්‍රී ලංකා රජයට දායකත්වයන්

වසරේ දුර්වල මූල්‍යමය කාර්යසාධනය හමුවේ වුවත්, 2018 මූල්‍ය වර්ෂය තුළ, ශ්‍රී ලංකා රජයට සහ ආර්ථිකයට සැලකියයුතු දායකත්වයක් අපි විසින් සිදුකර ඇති බව වාර්තා කිරීමට ලැබීම අපට සතුටකි. 2018 වර්ෂය තුළ, සෘජු බදු තුළ රු. මිලියන 563ක් රජයේ බදු ආදායමට දායකවෙමින් සහ පරිභෝජන බදු තුළ රු. මිලියන 2,016ක් අයකරමින් CPSTL දායකත්වය දක්වා ඇති අතර එහි එකතුව රු. මිලියන 2,576ක් වන අතර එය වාර්ෂිකව 19%ක වැඩිවීමක් නියෝජනය කරයි.

### අනාගත දැක්ම

2019 අනාගත දැක්ම වැදගත් මෙන්ම උනන්දුකාරී වසරකි. ආදායම් උත්පාදනයේ සම්පූර්ණ මූලාශ්‍ර සඳහා අපගේ යටිතල පහසුකම් සංවර්ධන ක්‍රමෝපාය අපි ඉදිරියට ගෙන යන අතර පිරිවැය අවම කරගැනීම සඳහා මෙහෙයුම්වල කාර්යක්ෂමතාව සහ සඵලත්වය වැඩිකරන්නෙමු.

අපගේ පාර්ශ්වකරුවන් වෙත වඩා යහපත් සේවා පිරිනැමීමට සහ ඔවුන්ට අවශ්‍ය පහසුකම් නිර්මාණය කරදීමට CPSTL තවදුරටත් බැඳී සිටී. පහළ උද්ධමන අනුපාතය සහ වැඩිවන ආර්ථික වර්ධනයන් වැනි දේශීය ආර්ථික පරිසරය තුළ ධනාත්මක ප්‍රවණතා දැකිය හැකි අතරම මධ්‍ය කාලිනව වඩාත් විශ්වාසී ව්‍යාපාර පරිසරයක් අපි අපේක්ෂා කරමු.

සමාගමේ මුදල් සංචිත සංවර්ධනය සඳහා සහයවීමට ප්‍රමාණවත් වන අතර, ඛණිජතෙල්වල වැඩිවන ඉල්ලුම සපුරාලීමට ගබඩා පහසුකම් පුළුල් කිරීමට අපට හැකියාව ඇති බව ශක්තිමත් ශේෂ පත්‍රය මඟින් සහතික කරයි.

අපගේ සමාගම සහ අපගේ සේවකයින් මව් සමාගම වන ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව සමඟ වර්තමාන ව්‍යාපාර පරිසරයේ අභියෝග ජයගැනීමට කටයුතු කරනු ඇති බවට සහ දකුණු ආසියාවේ වඩාත් කාර්යක්ෂම ඛණිජතෙල් ක්‍රියාකරවුම් පර්යන්ත්‍රය බවට පත්වීම යන අපගේ දැක්ම එහි සියලුම පාර්ශ්වකරුවන් වෙනුවෙන් අත්කර ගනු ඇති බවට මම විශ්වාස කරමි.

### අගය කිරීම

CPSTL වෙනුවෙන් අගය කිරීම තුළ, සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හී සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය සහ අනෙකුත් නිලධාරීන් විසින් අප වෙත දෙන ලද සහයෝගය වෙනුවෙන් ස්තූතිය පුද කිරීමට මම කැමැත්තෙමි.

CPSTL හී සාමාජිකයින් සියලුම දෙනා විසින් මා වෙත ලබාදෙන ලද පහසු සහ මිලකළ නොහැකි මඟපෙන්වීම සහ සහයෝගය නොමැතිව CPSTL සාර්ථකත්වය කරා ගෙනයාමට මාහට නොහැකි වනු ඇත. ඔවුන්ගේ පහසු සහ මිලකළ නොහැකි සහයෝගය සහ 2018 අභියෝගාත්මක වසර පුරා මා සමඟ සිටගැනීම වෙනුවෙන් සියලුම දෙනාට මම ස්තූතිය ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය ගරු අර්ජුන රණතුංග මැතිතුමාට සහ ඛණිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ආචාර්ය අනෝමා ගමගේ මැතිතුමියට සහ ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යංශයේ නිලධාරීන්ට මාගේ අවංක කෘතඥතාවය පළකිරීමට මම මෙය අවස්ථාව කරගනිමි.

එමෙන්ම, අපගේ සභාපති පී.එස්. විතානගේ මහතාට මෙන්ම සමාගම ඉදිරියට ගෙන යාම සඳහා දැඩි කැපවීමෙන් අප්‍රතිහත ධෛර්යයෙන් කටයුතු කළ CPSTL හි කාර්ය මණ්ඩලය ඇතුළුව ස්ථිර වැඩ සදාචාර සහ සේවාවට කැපවීම වෙනුවෙන් ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වයට මගේ කෘතඥතාව පළකර සිටිමු.

සියලුම පාර්ශ්වකරුවන් වෙත.
ඔබට ස්තූතියි

මෙයට විශ්වාසී වූ



**එම්.ආර්.එම්. ආබිදීන්**
**කළමනාකාර අධ්‍යක්ෂ**

# අධ්‍යක්‍ෂ මණ්ඩලය




1

**පී.එස් විතානගේ මහතා**
**සභාපති**

පී.එස්. විතානගේ මහතා 2018 නොවැම්බර් 13 දින ශ්‍රී ලංකා ගුවන් සේවා සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලයට පත් කරන ලද අතර, පසුව ශ්‍රී ලංකා කේටරින් සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලයට පත් කරන ලදී.

ඔහු ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති ලෙසද සේවය කරයි. ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ කීර්තිමත් නිලධාරියෙකු වන අතර, ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබාගෙන ඇත. එමෙන්ම ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය ද ලබාගෙන ඇත.

1984 දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට බැඳුණු පී.එස්. විතානගේ මහතා රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයේ සහකාර අධ්‍යක්‍ෂවරයෙක් ලෙස ඔහුගේ වෘත්තිය ආරම්භ කළේය. පසුව 1990 දී ශ්‍රී ලංකා සීනි සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරට පත්කරන ලද අතර ඉන් පසුව ආරක්ෂක අමාත්‍යංශයේ සහකාර ලේකම් තනතුරට පත්කරන ලදී. 1995 දී, විතානගේ මහතා ජනමාධ්‍ය, සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යංශයට සහකාර ලේකම් ලෙස පත් කරන ලද අතර, පසුව ජ්‍යේෂ්ඨ සහකාර ලේකම් තනතුරට උසස් කරනු ලැබ ඇත. 2002 දී, ප්‍රවාහන, මහා මාර්ග සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යංශයේ අතිරේක ලේකම් තනතුරට පත්කර ඇති අතර 2004 දී, ඔහු සිවිල් ගුවන්සේවා අමාත්‍යංශයේ අතිරේක ලේකම් තනතුරට පත්කරන ලදී. 2012 දක්වා එම තනතුරේ සේවය කරමින් සිටි පී.එස්. විතානගේ මහතා  පුනරුත්ථාපන සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශයේ ලේකම් ලෙස රාජකාරි භාරගැනීමට උසස් කරන ලදී. ඉන්පසුව 2015 දී, විදේශ රැකියා අමාත්‍යංශයේ ලේකම් ලෙස පත්කරන ලද අතර, 2017 දී ප්‍රවාහන සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යංශයේ ලේකම් තනතුරට පත්කරන තුරු එම තනතුරේ රාජකාරි කළ අතර 2018 දෙසැම්බර් 20 දින ඔහු රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

ඉහත තනතුරු ගණනාවක් දරමින් සිටි, විතානගේ මහතා විදේශ රාජ්‍යයන්හී ශ්‍රී ලංකා රජයේ නියෝජිතයින් මෙහෙයවීම සඳහා පත්කරන ලදී. 2006 මැයි කොළඹ පවත්වන ලද සාර්ක් කලාපීය බහුමාධ්‍ය ප්‍රවාහන සම්මන්ත්‍රණයේ සභාපති ලෙස පත්කරනු ලද අතර, ඔහු 2016 දී කොළඹ ක්‍රියාවලිය (ශ්‍රමිකයින් යවන රටවල් අතර කලාපීය උපදේශන ක්‍රියාවලිය) පිළිබඳ 5ස් වැනි අමාත්‍යංශ්‍ය උපදේශනය සංවිධානය කර ඇති අතර, 2003 සිට දෙවන වරටත් සභාපතිත්තිවය ශ්‍රී ලංකාව වෙනුවෙන් දිනාගෙන ඇත. තවද, විතානගේ මහතා 2017 ජනවාරි 24 දින කොළඹ දී කැඳවනු ලැබූ අබුදාබි සාකච්ඡාව පිළිබඳ හතරවැනි අමාත්‍යංශ උපදේශනය සංවිධානය කිරීමේදී මැදිහත් වී ඇති අතර ශ්‍රී ලංකාව වෙනුවෙන් සභාපතිත්තිවය රැකගෙන ඇත.

# අධ්‍යක්ෂ
## මණ්ඩලය (ඉතිරි කොටස)

2

**එම්.ආර්.එම්. ආබිදීන් මහතා**
**කළමනාකාර අධ්‍යක්ෂ**

මහනුවරින් පැමිණි ආබිදීන් මහතා මහනුවර ත්‍රිත්ව විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා ඇත. දොලොස්බාගේ පැනිලෑන් එස්ටේට් හී ආබිදීන් කොටසේ දේපල හිමි වැවිලිකරුවෙක් වන ආබිදීන් මහතා දැනට ඇබ්ස්ටැක්සන් පුද්ගලික සමාගමේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ ලෙස සේවය කරන අතර එම සමාගම මෘදුකාංග සංවර්ධනය තුළ විශේෂඥතාවය දක්වයි. එමෙන්ම රිලයන්ට් ට්‍රේඩර්ස් කැන්ඩි බෝල් සහ රෝලර් බෙයාරින් හි හිමිකරුද වේ.

එමෙන්ම ඔහු ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ හිටපු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ලිට්රෝ ගෑස් ටර්මිල් ලංකා පුද්ගලික සමාගමේ හිටපු සභාපති සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ හිටපු සභාපතිවරයාද වේ.

3

**නිමල් ජයසුන්දර මහතා**
**අධ්‍යක්ෂ**

මූල්‍ය වෘත්තිකයෙක් වන, නිමල් ජයසුන්දර මහතා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ත මූල්‍ය කටයුතු පිළිබඳ වසර 38කට වැඩි පළපුරුද්දක් ඇති අතර, විස්තීර්ණ දැනුම හා පළපුරුද්ද අත්කර ගෙන ඇත. විවිධ මූල්‍ය සහ මෙහෙයුම් හැකියාවන් හී ඔහුගේ ශක්තිමත් පළපුරුද්ද අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය තවදුරටත් ශක්තිමත් කරයි.

ජයසුන්දර මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ බලපත්‍රලාභියෙක් මෙන්ම සහ ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාධාරියෙක්ද වේ. එමෙන්ම ඔහු AAT හි සාමාජිකයෙක් මෙන්ම මූල්‍ය, විගණනය හා සංවර්ධන ගිණුම්කරණය (එක්සත් ජනපදය) හි අධි සාමාජිකයෙක් ද වේ.

2017 ජූනි සිට සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හී අධ්‍යක්ෂ ලෙස ඔහු සේවය කරමින් සිටින අතර ඔහු ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙසද ඔහු සේවය කර ඇත. තවද, ශ්‍රී ලංකා - චීන සංගමයේ භාණ්ඩාගාරික ලෙස මෙන්ම ශ්‍රී ලංකා - බෙල්ජියම් සංගමයේ භාණ්ඩාගාරික ලෙස සේවය කරමින් සිටී.

4

**කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය**
**අධ්‍යක්ෂ**

කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය රාජ්‍ය අංශයේ සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුළුල් පළපුරුද්ද ඇත. ඇය ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට 1990 වසරේදී බැඳි ඇත. එතැන් සිට, විවිධ රජයේ ආයතනවල ඇය සේවය කර ඇත. දැනට, ඇය මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුර දරයි.

පළමු පන්තියේ ගෞරව සාමාර්ථයක් සහිතව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලනය) විශේෂ උපාධියක් ඇය සතුය. 1987 දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පවත්වන ලද වරලත් අවසරලාභි විභාගය සමත් වී ඇත.

2015 මාර්තු සිට ඇය සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. ඊට අමතරව, ඇය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සහ මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනයේ අධ්‍යක්ෂිකාවකි. එමෙන්ම ඇය ඉහත ආයතන තුනේ විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපතිවරියද වේ.

5

**ප්‍රමෝද් ජයින් මහතා**
**ජ්‍යේෂ්ඨ උප සභාපති (මූල්‍ය)**

ඉන්ධන හා ගෑස් අංශයේ මූල්‍ය ක්ෂේත්‍රය, බදුකරණය හා වාණිජ අංශය පිළිබඳ ඉන්දියන් තෙල් සමාගමේ දශක දෙකකට අධික කාලයක් පුරා විවිධ සේවා පළපුරුද්ද ප්‍රමෝද් ජයින් සතු වේ. එමෙන්ම ඔහු අභ්‍යන්තර විගණනය, INDAS ක්‍රියාත්මක කිරීම, වංචා වැලැක්වීම සහ අභ්‍යන්තර පාලනය යනාදී විශේෂ පැවරුම් මෙහෙයවා ඇත. ආයතනයේ අපේක්ෂිත ක්‍රමෝපායන් අත්කර ගැනීම පිණිස මූල්‍ය පරමාර්ථ ව්‍යාපාර පරමාර්ථ සමඟ සහසම්බන්ධ කිරීමට මෙම පුළුල් පළපුරුද්ද ඔහුව ශක්තිමත් කර ඇත. ජ්‍යේෂ්ඨ උප සභාපති (මූල්‍ය) ලෙස, සමාගමේ සමස්ථ මූල්‍යමය කරුණු ඔහු පාලනය කරයි.

ඔහු ඉන්දියානු වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICAI), මෙන්ම ඉන්දියාවේ පිරිවැය සහ කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (ICMAI) සාමාජිකයෙක් වන අතර, දිල්ලි විශ්ව විද්‍යාලයේ වාණිජවේදී (ගෞරව) උපාධිය ලබාගෙන ඇත. එමෙන්ම ඔහු තොරතුරු පද්ධති විගණනය (DISA) පිළිබඳ ඩිප්ලෝමාව සාර්ථකව අවසන් කර ඇති අතර, එය ICAI (ඉන්දියානු වරලත් ගණකාධිකාරී ආයතනය) විසින් අනුග්‍රහය දක්වන තොරතුරු තාක්ෂණ විගණන වෘත්තිකයින් සඳහා වෘත්තීමය සහතික කිරීමකි.

# අධ්‍යක්ෂ
## මණ්ඩලය (ඉතිරි කොටස)

ඉන්දීය තෙල් සමාගම තුළ ඔහුගේ උත්සාහය තුළ, විවිධ මට්ටම්වල අලෙවිකරණ මූලය, සෘජු සහ වක්‍ර බදුකරණය, අභ්‍යන්තර විගණනය, SAP ERP පද්ධති යනාදිය වැනි විවිධ මූල්‍ය ක්ෂේත්‍රයන් හී පළපුරුද්ද ඔහු ලබාගෙන ඇත. එමෙන්ම ජයින් මහතා ලංකා පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හී අධ්‍යක්ෂවරයෙක් මෙන්ම එම සමාග මේ විගණන කමිටුවේ සාමාජිකයෙක් ද වේ.

6

### සුරාජ් කුමාර් පට්නෙයික් මහතා
අධ්‍යක්ෂ

සුරාජ් කුමාර් පට්නෙයික් මහතාට ඛණිජ තෙල් ක්ෂේත්‍රය තුල වසර 25කට වැඩි පළපුරුද්ද ඇති අතර දැනට ඔහු ලංකා ඉන්දියන් තෙල් සමාගමේ ජ්‍යේෂ්ඨ උප සභාපති (මෙහෙයුම්, ආනයන හා බන්කර් අලෙවි) ද වේ. ඔහු 1994 දී කළමනාකරණ අභ්‍යාසලාභියෙක් ලෙස ඉන්දියන් තෙල් සමාගමට බැඳී ඇති අතර, එතැන් සිට නාවික කටයුතු මෙහෙයුම්, සැපයුම් දාම කළමනාකරණය මෙන්ම ඉන්දියන් තෙල් සමාගමේ විවිධ ඉන්ධන පර්යන්තයන්හී සේවය කර ඇත. කොල්කටා හි ඔහුගේ කාලසීමාව තුළ, පට්නෙයික් මහතා නේපාලය සහ භූතානය මෙන්ම ගිනිකොණ ඉන්දියාවේ බොහෝ ඈත ස්ථානකරා ඛණිජ තෙල් නිෂ්පාදන සැපයීම සහ බෙදාහැරීම පාලනය කර ඇත. වර්තමානයේ ඔහු ලංකා ඉන්දියන් තෙල් සමාගම පීඑල්සී හි ඉන්ධන සැපයීම් ව්‍යාපාරය පුළුල් කරමින් සිටී.

පුහුණුවෙන් M.B.A වන පට්නෙයික් මහතා මුම්බායි හී නාවික කටයුතු පිළිබඳ කීර්තිමත් නරෝටම් මොරාර්ජී හි සභය සාමාජිකයෙක් ද වේ. CPSTL හී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් ලෙස, පට්නෙයික් මහතා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ගැනීම තවදුරටත් වඩා සඵල කිරීම සඳහා ඉන්ධන පර්යන්ත මෙහෙයුම් සහ නාවික කටයුතු මෙහෙයුම් පිළිබඳ ඔහුගේ අප්‍රමාණ පළපුරුද්ද ලබා දේ.

7

### ප්‍රසන්න ශ්‍යාමල් සෙනරත් මහතා
අධ්‍යක්ෂ

ශ්‍යාමල් මහතා නාලන්ද විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා ඇති අතර කොළඹ විශ්ව විද්‍යාලයෙන් නීති උපාධිය ලබාගෙන ඇත.

එමෙන්ම ඔහු විවෘත විශ්ව විද්‍යාලයේ වෘත්තීය ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමාව සහ ව්‍යාපාර කළමනාකරණ ජාතික ආයතනයේ අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාව සාර්ථකව අවසන් කර ඇත.

තවද ඔහු වයඹ පළාත් සභාවේ වාර 3ක් සඳහා විපක්ෂ නායකවරයාද විය.

8

### ශ්‍යාම් බෝරා මහතා
අධ්‍යක්ෂ

ඛණිජ තෙල් ක්ෂේත්‍රය තුළ වසර 26කට වැඩි පළපුරුද්ද සමඟ, බෝරා මහතාට ඉන්දියන් ඔයිල් සමාගම, ඉන්දියාමේ ජ්ලැග්ෂිජ් සමාගම සහ ෆෝචූන් 500 ග්ලෝබල් සමාගම තුළ පාරිභෝගික, ආයතනික විකුණුම්, මෙහෙයුම් සහ මනා සංවිධාන වැනි විවිධ දෙපරේතමේන්තුවල විවිධ කාර්යභාරයන්හි පුළුල් පළපුරුද්ද ඇත. ලංකා ඉන්දියන් ඔයිල් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ලෙස වැඩභාරගැනීමට පෙර ඔහු සැලකියයුතු ලෙස මෙවැනි ක්ෂේත්‍රයන්ට නිරාවරණය වී ඇති අතර, ඔහු මහාරාෂ්ඨ සහ ගෝව රාජ්‍යයේ ඉන්දියන් තෙල් සිල්ලර දෙපාර්තමේන්තුව මෙහෙයවා ඇත.

බැංගලෝර් විශ්ව විද්‍යාලයේ සිවිල් ඉංජිනේරුවෙක් වන, ගෝගෝර්න් හී කළමනාකරණ සංවර්ධන ආයතනයේ පිළිගත් ජාතික කළමනාකරණ වැඩසටහන තුළින් පශ්චාත් උපාධි කළමනාකරණ ඩිප්ලෝමාව සහ රාජස්ථාන් විශ්ව විද්‍යාලයෙන් අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධිය සහිත බෝරා මහතා ඉන්දියන් තෙල් සමාගමේ ප්‍රධාන තනතුරු කිහිපයක සේවය කර ඇත. ඔහු ක්ෂේත්‍ර මට්ටමින් දීර්ඝ සහ සාර්ථක උත්සාහයන් සහිත විවිධ අලෙවි අංශ තුනක් සඳහා අංශ ප්‍රධානියෙක් ලෙස කටයුතු කර ඇති අතර මනාසංවිධාන රැකගැනීමෙන් පසු මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ රාජකාරි කර ඇත.

# කළමනාකාර
## කණ්ඩායම



| | | |
|---|---|---|
| 1 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් හා පාලන) | පී ඩී පී ධර්මවංශ මහතා |
| 2 | වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) | ජේ ඒ යු ආර් කේ ජයලත් මහතා |
| 3 | වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඉංජිනේරු හා සහන සේවා) | ජී එම් ඒ බණ්ඩාර මහතා |
| 4 | වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මෙහෙයුම්) | එම් එස් එම් නියාස් මහතා |
| 5 | ගබඩා කළමණාකරු | එස් වික්‍රමආරච්චි මහත්මිය |
| 6 | මෙහෙයුම් කළමණාකරු (මෝටර්රථ) | ඩී ඒ ජේ එස් ධර්මප්‍රිය මහතා |
| 7 | කළමණාකරු (පරිශ්‍ර හා ඉංජිනේරු සේවා) | අජිත් විජේසූරිය මහතා |
| 8 | මෙහෙයුම් කළමණාකරු (තොග චලන හා තොග නිෂ්පාදනය) | ටී වී සරත්චන්ද්‍ර මහතා |
| 9 | කළමණාකරු (ආරක්ෂක) | එන් ජයවර්ධන මහතා |
| 10 | කළමණාකරු (ආයතන කටයුතු) | එස් එන් ගමගේ මහතා |
| 11 | මෙහෙයුම් කළමණාකරු (අක්වෙරළ) | ආර් ඒ පී ඒ රණසිංහ මහතා |

# කළමනාකාර
## කණ්ඩායම (ඉතිරි කොටස)




| | | |
|---|---|---|
| 12 | මානව සම්පත් කළමණාකරු | කේ එම් එන් ඒ සී පෙරේරා මහතා |
| 13 | කළමණාකරු (ප්‍රසම්පාදන) | ආර් එස් එස් ප්‍රේමකුමාර මහතා |
| 14 | කළමණාකරු බෙදාහැරීම් | ඩබ් එම් ටී ඩබ් ඒ බණ්ඩාර මහතා |
| 15 | කළමණාකරු (පුහුණු හා පාලන මානව සම්පත් සංවර්ධන) | ඊ ඒ ආර් ඩී බණ්ඩාර මහතා |
| 16 | ප්‍රධාන නීති නිළධාරී | එල් ඩබ් ගුණසේකර මහතා |
| 17 | වෛද්‍ය නිළධාරී | ආර් සුසිරිවර්ධන මහත්මිය |
| 18 | නියෝජ්‍ය ජ්‍යේෂ්ඨ ප්‍රධාන තොරතුරු නිළධාරී | ඩී ආර් එෆ් ඩයස් මහතා |
| 19 | වැඩබලන කළමණාකරු (විමර්ෂණ) | ආර් එම් එන් ජයතිලක මහතා |
| 20 | වැඩබලන කළමණාකරු (ගිනි හා ආරක්ෂක) | පී එම් සී පී ඩයස් මහතා |
| 21 | වැඩබලන කළමණාකරු අභ්‍යන්තර විගණන | කේ එච් එම් ජයසේකර මහතා |
| 22 | නියෝජ්‍ය කළමණාකරු රසායනාගාර | පී එච් එන් එම් චන්ද්‍රසිරි මහතා |

# කළමනාකරණ සාකච්ඡා හා විග්‍රහය

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් . සාර්ථකත්වය මත ව්‍යාප්ත වෙමින් .

# මූල්‍ය ප්‍රාග්ධනය




ඛණිජ තෙල් නිෂ්පාදන කර්මාන්තය තුළ අඛණ්ඩව පවත්නා වෙළෙඳපොල කොන්දේසිවල විවිධ අභියෝග හමුවේ රුපියල් බිලියන 13ක ආදායමක් සහ රුපියල් බිලියන 0.197ක ලාභයක් වාර්තාකළ වසර තුළ හිතකර කාර්යසාධනයක් වාර්තා කිරීමට ලැබීම පිළිබඳ අපි සතුටු වෙමු.

වසර තුළ ජල විදුලිය උත්පාදනය වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස ඉන්ධන පදනම් විදුලි නිෂ්පාදනය පහත වැටුණ අතර, ඒ නිසාම ඛණිජ තෙල් නිෂ්පාදනවල අලෙවියද 2018 දී විදුලිබල උත්පාදන ක්ෂේත්‍රය තුළ පහත වැටුණි.

### ආදායම සහ ලාභදායිතාව

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල් ලිමිටඩ් හි ආදායම ප්‍රධාන ආදායම සහ ප්‍රවාහන ආදායම තුළින් උපයනු ලබන අතර ප්‍රධාන ආදායම යනු 2018 වසර තුළ මුළු ආදායමෙන් 80%ක් වාර්තා කළ ප්‍රධාන ආදායම් මූලාශ්‍රය වේ.




සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල් ලිමිටඩ් හි ආදායම රුපියල් බිලියන 13.1 දක්වා 7.4%කින් පහත වැටුණු අතර එය රුපියල් බිලියන 3කි. මෙයට ප්‍රධාන හේතුව වූයේ ප්‍රධාන ආදායමේ ණය පොළී ප්‍රතිපූරණ සංරචකය 2018 සිට ආදායමේ අත්‍යවශ්‍ය කොටසක් නොවීම සහ විදුලි උත්පාදන ක්ෂේත්‍රයේ ඉල්ලුම තුළ සැලකියයුතු පහළ වැටීම සහ වසර තුළ 9 වරක් ඛණිජ තෙල් මිල ගණන්වල සංශෝධනය සඳහා පිරිවැය ඵලදායී මිල යාන්ත්‍රණය යොදා ගැනීමයි.




2018 වසර තුළ දළ ලාභ ආන්තිකය 40%ක් වන අතර එය 2017 දී 48%ක් විය. මෙයට ප්‍රධාන හේතුව වූයේ කාර්ය මණ්ඩල පිරිවැය වැඩිවීම සහ ණය පොලී ප්‍රතිපූරණය හේතු කොට ගෙන 2018 වසර තුළ ආදායමේ පහත වැටීම මෙන්ම ඉන්ධන පිරවුම් ආදායම 2018 සඳහා ආදායමේ කොටසක් නොවීමයි. එම හේතුව නිසාම ශුද්ධ ලාභ ආන්තිකය පිළිවෙලින් 2017 සහ 2018 වසර තුළ 20%ක් සහ 2%ක් විය.

# මූල්‍ය
## ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

ආදායම සහ දළ ලාභ ආන්තික ප්‍රවනතාව (රු. මි.)




### බදු පෙර ලාභය
ණය ගැනීම් නිරවුල් කිරීම හේතු කොට ගෙන 2018 වසර තුළ මූල්‍ය පිරිවැය නොමැත. බදු පෙර ලාභය පෙර වසරේ බදු පෙර ලාභය වන රුපියල් මිලියන 3.2730 සාපේක්ෂව මෙම වසර තුළ රුපියල් මිලියන 1,522ක් දක්වා අඩුවී ඇත.

### බදු පසු ලාභය හා වෙනත් විස්තීර්ණ ආදායම
වසර සඳහා බදු මුදල රුපියල් මිලියන 1,324ක් වූ අතර එය 2017 වසරට සාපේක්ෂව 179%කින් අඩුවිය. එයට හේතුව ආදායම් බදු සඳහා යොදාගත් අනුපාත වැඩි වී තිබීමයි. විලම්භිත බදු අයකිරීම නිසා ප්‍රධාන ලෙස බදු පෙර හා බදු පසු ආදායම අතර පරතරය විශාල විය.

සමාගමේ වෙනත් විස්තීර්ණ ආදායම (OCI) ප්‍රධාන වශයෙන් නිර්ණය කළ ප්‍රතිලාභ බැඳීම මත ආයුගණක අලාභයෙන් සමන්විත වේ.

බදු පෙර සහ බදු පසු ලාභය (රු. මි.)




### මෙහෙයුම් කාර්යසාධනය
වසර තුළ වෙනත් ආදායම් රුපියල් මිලියන 246 දක්වා 54%කින් වැඩි වී ඇති අතර, ඒ සඳහා පිරියත, දේපල හා උපකරණ බැහැරකිරීමෙන් ලද ලැබීම් වැඩිවීම හේතු විය. පරිපාලන වියදම් රුපියල් මිලියන 4,527 දක්වා 12%කින් වැඩි වූ අතර, ඒ සඳහා පෙර වසරට සාපේක්ෂව 25% කින් කාර්ය මණ්ඩල පිරිවැය වැඩිවීම හේතු විය. මෙහෙයුම් මට්ටමේදී, සමාගමේ මෙහෙයුම් ලාභය පෙර වසරේ පැවති රුපියල් මිලියන 3,2080 සාපේක්ෂව මෙම වසර තුළ රුපියල් මිලියන 1,404 දක්වා 56%කින් අඩුවී ඇත.

මෙහෙයුම් කාර්යසාධනය




### මූල්‍ය තත්ත්වය
### මුළු වත්කම්




ශේෂ පත්‍රය වඩාත් ජංගම නොවන වත්කම් කරා වන අතර එය මුළු වත්කම්වලින් 57%ක් විය.

සමාගමේ වත්කම් පදනම හා ස්කන්ධ පදනමේ ශක්තිය අඛණ්ඩ වත්කම් වර්ධනය තුළින් පිළිබිඹු කරන අතර මුළු වත්කම් 2018 දී රුපියල් බිලියන 30 දක්වා 1.1%කින් පුළුල් වූ අතර ඒ සඳහා මූලික

# මූල්‍ය
## ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

වශයෙන් මුදල් හා මුදලට සමාන දෑ, අස්පෘශ්‍ය වත්කම් සහ ජංගම නොවන අනෙකුත් මූල්‍ය වත්කම්වල වැඩිවීම හේතු විය. මුදල් තත්ත්වය වඩා ශක්තිමත්ව පැවති අතර එයට වසර අවසානයේදී කෙටි කාලීන ආයෝජනවල වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු විය. මෙහිදී පෙර වසරේ පැවති රුපියල් මිලියන 1,4740 සාපේක්ෂව රුපියල් මිලියන 3,149 දක්වා 113%ක වර්ධනයක් පෙන්නුම් කරයි.

**මුළු වත්කම් වර්ධනය (රු. මි.)**




ජංගම වත්කම් අනුපාතය සහ ක්ෂණික වත්කම් අනුපාතය යන දෙක වසර අවසානයේදී පිළිවෙලින් 6.18 ක් සහ 5.86ක් විය.

**ජංගම /ක්ෂණික වත්කම් අනුපාතය (වාර)**




### වත්කම් පිරිවැටුම් අනුපාතය
වත්කම් පිරිවැටුම් අනුපාතය මගින් විකුණුම් ඇති කිරීම සඳහා සමාගම විසින් එහි වත්කම් භාවිතයේ කාර්යක්ෂමතාව මනිනු ලබයි. මුළු වත්කම් පෙර වසරට සාපේක්ෂව 2018 දී 1.1%කින් වැඩිවී ඇති අතර ආදායම 7.4%කින් පහත වැටී ඇත. ඒ නිසාම වත්කම් පිරිවැටුම් අනුපාතය 2018 දී 44%ක් වූ අතර එය 2017 දී 49%ක් විය.

**වත්කම් පිරිවැටුම (%)**




### ස්කන්ධය සහ වගකීම්
සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල් ලිමිටඩ් රුපියල් බිලියන 24.76ක් වන කොටස්හිමියන්ගේ අරමුදල්වලින් මනාව ප්‍රාග්ධනීයකරණය කරන අතර, ඉන් සමාගමේ මුළු වත්කම්වලින් 85%ක් අරමුදල්කරණය කරයි. සමාගම 2016 දී සියලුම ණය පියවා දමා ඇති අතර, මෙම වසර තුළ කිසිදු අළුතින් ණයගැනීමක් සිදුකර නොමැත. ජංගම වත්කම් අනුපාතය සහ ක්ෂණික වත්කම් අනුපාතය යන දෙක වසර අවසානයේදී පිළිවෙලින් 6.18 ක් සහ 5.86ක් විය.
සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල් ලිමිටඩ් හි මුළු වගකීම් 2017 වසරේදී පැවති රුපියල් බිලියන 4.8 සිට රුපියල් බිලියන 5.5 දක්වා වැඩිවී ඇති අතර, ඒ සඳහා මූලික වශයෙන් විලම්භිත බදු වගකීම තුළ වැඩිවීමට හේතු විය.



# මූල්‍ය
## ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

### ස්කන්ධය මත ඉපයීම

ස්කන්ධය මත ඉපයීම පෙර වසරේ පැවති 11%ට සාපේක්ෂව 1% දක්වා අඩුවී ඇත. 2018 දී මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් ලාභදායිතාව තුළ පහත වැටීම හේතු විය.

**ස්කන්ධය මත ඉපයීම (%)**




### මුදල් ප්‍රවාහ උත්පාදනය

ලාභදායිතාව තුළ පහත වැටීම සිදුවුවද, මෙහෙයුම් කාර්යයන්ගෙන් උපයන ලද ශුද්ධ මුදල් පෙර වසරේ රුපියල් බිලියන 1.580 සාපේක්ෂව මෙම වසර තුළ රුපියල් බිලියන 2.6 දක්වා වැඩිවී ඇත. ඒ සඳහා ප්‍රධාන වශයෙන් වෙළෙඳ හා අනෙකුත් ලැබීම් ආපසු ලැබීම වැඩිවීම හේතු විය. ශුද්ධ මුදල් ප්‍රවාහය තුළ වැඩිවීමක් පැවති අතර එය පසුගිය වසරේ රුපියල් මිලියන 870ක ශුද්ධ මුදල් ප්‍රවාහයට සාපේක්ෂව රුපියල් බිලියන 2.56ක් විය.

### කොටස්හිමිකාර වටිනාකම් නිර්මාණය

| | 2018 | 2017 |
|---|---|---|
| කොටසක ඉපයීම (රු.) | 0.26 | 3.73 |
| කොටසක ශුද්ධ වත්කම් වටිනාකම (රු.) | 33 | 34 |

2018 දි කොටසක ඉපයීම 0.26ක් වූ අතර 2017 දී එය 3.73ක් විය. කොටසක ශුද්ධ වත්කම් වටිනාකම් 2018 දි වාර 34 සිට වාර 33 දක්වා අඩුවිය.

**කොටසක ඉපයීම (EPS)**




**කොටසක ශුද්ධ වත්කම් වටිනාකම (රු.)**




### තෝලනය සහ ප්‍රාග්ධන ව්‍යූහය

සමාගමේ වත්කම්වලින් 85%ක් ස්කන්ධ ප්‍රාග්ධනය තුළින් අරමුදල් සපයන අතර ඉතිරි 18% දිගුකාලින සහ කෙටිකාලීන ණයවලින් අරමුදල් සපයයි. පහත සටහනින් පෙන්වා දෙන පරිදි, ස්කන්ධ ප්‍රාග්ධනයේ දායකත්වය 2017 වසරට සාපෙක්ෂව 2018 දි තරමක් අඩුවී ඇති අතර ඒ සඳහා 2018 දි රඳවාගත් ඉපයීම්වලින් ලාභාංශ බෙදාහැරීම හේතු විය.

**අරමුදල් මූලාශ්‍ර (රු. මි.)**




**තෝලන අනුපාතය (වාර)**



# නිෂ්පාදිත
## ප්‍රාග්ධනය




සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල් ලිමිටඩ් හි මධ්‍ය ව්‍යාපාරය වන්නේ ඛණිජතෙල් නිෂ්පාදන ගබඩාකර බෙදාහැරීමයි. CPSTL හි මෙහෙයුම් සපයමින් ව්‍යාපාරයට ව්‍යාපාරයක් ලෙස (B2B) යෙදී සිටී. CPSTL හි කාර්යය වන්නේ ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියන් ඔයිල් සමාගම යන සමාගම් දෙක සඳහා ඛණිජ තෙල් නිෂ්පාදන ගබඩාකර බෙදාහැරීමයි.

කොලොන්නාව නිමාව වාර්ෂිකව පිරිපහදුකළ ඛණිජතෙල් නිෂ්පාදන ලීටර් බිලියන තුනක් පමණ ගබඩාකර බෙදාහැරීම සිදුකරයි. මෙම පරිමාවෙන් 60%ක් පමණ කොළඹ වරාය තුළින් දිවයිනට ආනයනය කරයි. පිරිපහදුකළ නිෂ්පාදන කොළඹ වරායේ ඩොල්ෆින් ටැංකි නැංගුරමේ සිට පොලොව යට නළ මාර්ග පද්ධතියක් භාවිතයෙන් කොලොන්නාව නිමාව වෙතට ප්‍රවාහනය කෙරේ.

| ආනයනකරු | ගබඩාකිරීම හා බෙදාහැරීම<br>කොලොන්නාව ඉන්ධන ස්ථාපන පහසුකම | සිල්ලර සහ තොග පාරිභෝගිකයින් |
|---|---|---|



# නිෂ්පාදිත

## ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

නළ මාර්ග පද්ධතිය වසර 65ක් පමණ පැරණි අතර විවිධ වර්ගයේ නිෂ්පාදන සඳහා විය නළ මාර්ග පහකින් සමන්විත වේ. කෙසේවෙතත්, වයස්ගතවීම හේතු කොට ගෙන ඒවායින් නළ මාර්ග 02ක් පමණක් දැනට මෙහෙයුම් තත්ත්වයේ පවතී. CPSTL විසින් හදිසි ක්‍රියාමාර්ගයක් ලෙස නළමාර්ගවල අවශ්‍යතාව සහතික කිරීමට සහ DTB හි ටැංකිවලින් ගොඩබාන කාලය අඩුකිරීමට ක්‍රමෝපායික අවශ්‍යතාවක් ලෙස තවත් නළ මාර්ගයක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇත. ඊට අමතරව, හොඳ නළමාර්ගයක් කාන්දුවීම නිසා ඇතිවන අලාභ අඩුකරන අතරම නළ මාර්ගය දිගේ ගිනි අවදානමද අඩු කරයි. අනෙක් අතට, මෙහෙයුම් තත්ත්වය තුළ අමතර නළමාර්ගයක් තිබීම මගින් කොලොන්නාව නිමාව විසින් හසුරුවන නිෂ්පාදනවලට සැලකිය යුතු කොටසක් ලබාදීම තුළින් ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති සුරක්ෂිතතාව සහතික කරයි.

ඉහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස, CPSTL විසින් මෙරට ශ්‍රමය සහ තාක්ෂණය භාවිතයෙන් අතහැර දමන ලද අඟල් 12ක විෂ්කම්භය සහිත නළමාර්ගය ප්‍රතිසංස්කරණය ආරම්භ කරන ලදී. මෙම නළ මාර්ගයේ මුළු දිග කිලෝමීටර් 5.5කි. ප්‍රතිසංස්කරණය විවෘත කැපුම් තාක්ෂණය භාවිතයෙන් ප්‍රධාන වශයෙන් සිදු කෙරේ. නවතම නළ භාවිතා කරමින් නළයේ කොටස් ඉවත් කර සවිකිරීම සිදුකරන ලදී. නළ සහ සවිකිරීම් ප්‍රසම්පාදනය, හෑරීමේ යන්ත්‍ර සහ දක්ෂ වෑල්ඩින්කරුවන් කුලියට ගැනීම, විනාශ වී නොමැති බවට පරීක්ෂණය සහ විකිරණ ලේඛණ පරීක්ෂණය පැවැත්වීම සඳහා රුපියල් මිලියන 260ක මුළු ආයෝජනයක් CPSTL විසින් සිදුකරයි. මෙම පිරිවැයට මයික්‍රෝ උමං සේවාව ද ඇතුළත්ය.



නළමාර්ගය ප්‍රතිසංස්කරණය සැබැවින්ම අභියෝගාත්මක කාර්යයක් විය. හෑරීම් මාර්ගය මහා මාර්ග, දුම්රිය මාර්ග මෙන්ම අනවසර පදිංචිකරුවන් පදිංචි වී සිටින සාමාන්‍ය ජන ප්‍රදේශ හරහා වැටී ඇත. මෙම මාර්ගයේ සම්පූර්ණ දිග කිලෝමීටර් 5.5කි. මෙම මාර්ගය ඔරුගොඩවත්තේදී ශ්‍රී ලංකාවේ උතුරු දුම්රිය මාර්ගය හරහාට ගමන් කරන අතර, එහි මෙරට උතුරු, මධ්‍යම, වයඹ සහ නැගෙනහිර කලාපයේ දුම්රිය ගමන් කිරීම සිදුකරයි. සමස්ත උතුරු දුම්රිය මාර්ග යේ මෙහෙයුම්වලට බාධාවක් වන බැවින්, විවෘත කැපීම් නළ එලීම මෙම ප්‍රදේශය සඳහා විකල්පයක් නොවේ. එමනිසා CPSTL විසින් දුම්රිය මාර්ග යට මයික්‍රෝ උමං තාක්ෂණය භාවිතා කරමින් මෙම අවධානග්‍රාහී කාර්යය සිදුකරන ලදී. මයික්‍රෝ උමං කටයුතු රුපියල් මිලියන 18ක වියදමකින් 2018 මැයිවල සිදුකරන ලදී. CPSTL විසින් ශ්‍රී ලංකා බලශක්ති හු දර්ශනයට නව මානයක් එකතු කරමින් 2018 මූල්‍ය වර්ෂය තුළ ප්‍රතිසංස්කරණ වැඩවලින් 97.5%ක් සාර්ථකව අවසන් කරන ලදී.

**කොලොන්නාව අංක 04 ටැංකිය අළුත්වැඩියා කිරීම:**

ගබඩා ටැංකිවල සම්පූර්ණත්වය පවත්වා ගැනීම CPSTL හි මූලික පරමාර්ථයකි. ටැංකිවල තත්ත්වය සහ මෙහෙයුම් යෝග්‍යතාව ඛණිජතෙල් කර්මාන්තයේ ප්‍රමිති අනුව විධිමත් පරීක්ෂණ පවත්වමින් CPSTL විසින් නියාමනය කර ඇගයීමට ලක් කෙරේ. ගබඩා කිරීමේ ටැංකි නඩත්තුව ඒ අනුව උපලේඛනගත කෙරේ. අංක 04 ටැංකිය අළුත්වැඩියා කිරීම මෙම හඳුනාගැනීමේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස සැලසුම් කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය අංක 04 ටැංකියේ වහල අළුත්වැඩියා කිරීම සඳහා ක්‍රියාත්මක කරයි. වහලය දිරායාම සහ වහලයෙන් ජලය කාන්දුවීම හේතු කොට ගෙන නිෂ්පාදන දූෂණය වීම වැලැක්වීමට අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදුකරයි. නිෂ්පාදන තත්ත්ව සහතිකය සහ ටැංකියේ සම්පූර්ණත්වය ව්‍යාපෘතිය සාර්ථකව සම්පූර්ණ කිරීම මගින් අත්කර ගනු ලබන ප්‍රධාන අරමුණු වේ. මුළු ආයෝජනය රු. 36,04,500.00 ක් වන අතර සම්පූර්ණ වැඩවලින් 15% ක් 2018 මූල්‍ය වර්ෂය අවසානයේදී සම්පූර්ණ කෙරේ.





# නිෂ්පාදිත

## ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

**LBD කුරුණෑගල පිරවුම් දොඹකරය ඉදිකිරීම**

කුරුණෑගල LBD හි පිරවුම් දොඹකරය ඉදිකිරීම CPSTL විසින් ක්‍රියාත්මක කරන ඩිපෝ පිළිසකර කිරීමේ වැඩසටහනේ කොටසක් ලෙස කරගෙන යනු ලැබේ. මෙම ඩිපෝ යටත් විජිත කාලසීමාව තුළ ඉදිරිකරන ලද ඒවා වන අතර, ඩිපෝවල යටිතල පහසුකම් නවීන ඛණිජතෙල් කර්මාන්ත ප්‍රමිති සහ ව්‍යවහාරවලට අනුකූලව පිළිසකර කිරීම අවශ්‍ය බවට CPSTL විසින් හඳුනාගෙන ඇත. මෙම යෝජනා ක්‍රමය යටතේ තෝරා ගනු ලැබූ ඩිපෝ පිළිසකර කිරීම සිදුකරයි. මෙම සන්දර්භය තුළ, ඉන්ධන ඉල්ලුමේ වැඩිවීම සපුරාලීම සඳහා මෙම පිළිසකර කිරීමේ වැඩ සමඟම කුරුණෑගල LBD සඳහා නව පිරවුම් දොඹකරයක් අවශ්‍ය බවට හඳුනාගෙන ඇත. CPSTL විසින් 2018 මූල්‍ය වසර තුළ මෙම දොඹකරය ඉදිකිරීම සාර්ථකව අවසන් කරන ලදි.





**කලාප 6 හි නළ පද්ධතිය උසස් කිරීම**

රටතුළ ඉන්ධන සඳහා ඉල්ලුමේ වාර්ෂික වර්ධනය සපුරාලීම සඳහා දොඹකරවල පිරවුම් ධාරිතාව වැඩිකිරීමට CPSTL තීරණය කර ඇත. මෙම අරමුණ සඳහා, 07 කලාපයේ දොඹකරවල පිරවුම් ධාරිතාව නව ඉහළ ධාරිතාවයේ පොම්ප ස්ථාපනය කිරීම මගින් ඉහළ දැමිය යුතු බවට CPSTL විසින් තීරණය කරන ලදී. දැනට පවත්නා පොම්පාගාරය තුළ නව පොම්ප ස්ථාපනය කිරීමට තරම් ප්‍රමාණවත් ඉඩකඩ නොමැත. එමනිසා, කොලොන්නාව නිමාවේ කලාප 06 හි නව නිෂ්පාදන පොම්පාගාරයක් ඉදිකිරීමට CPSTL තීරණය කර ඇත.

**කොලොන්නාව නිමාවේ කලාප 03 හි රෝද සහිත පිරවුම් දොඹකරය ඉදිකිරීම**

CPSTL විසින් කටුනායක බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාවේ ගුවන් ඒකකයට දුම්රිය ටැංකි තුළින් JET A-1 ගුවන් ඉන්ධන ලිටර් මිලියන 38ක් පමණ ලබා දේ. කොලොන්නාව නිමාවේ කලාප 03 හි දැනට පවත්නා ගුවන් ඉන්ධන දුම්රිය ටැංකි පිරවුම් ධාරිතාව ආවරණයක් රහිත විවෘත පිරවුම් පහසුකමක් ලෙස ක්‍රියාත්මකය. සමහර අවස්ථාවලදි අහිතකර කාලගුණ තත්ත්වයන්හි දි මෙහෙයුම් කටයුතුවලට බාධා ඇතිවේ. සමහර අවස්ථාවලදී, මාසයක දී දුම්රිය ටැංකි කට්ටල පහක් (05) පමණ පිටත් කිරීමට නොහැකි වන අතර එය ආසන්න වශයෙන් රුපියල් මිලියන 3.6ක ආවස්ථික පිරිවැයකට හේතු වේ. එබැවින් මෙම අවස්ථාව නිවැරදි කරගැනීම සඳහා ආවරණයක් සහිත දුම්රිය ටැංකි පිරවුම් දොඹකරයක් ඉදිකිරීමට යෝජනා කෙරේ.

ඊට අමතරව, මෙහෙයුම් කටයුතු සිදුකරන අවස්ථාවලදි දොඹකර පිරවුම්වල ආරක්ෂාව ද පිරවුම් දොඹකරය ඉදිකිරීම මගින් වැඩි කළ හැකිය.

මෙම සන්දර්භය තුළ, කලාප 03 හි ගුවන් ඉන්ධන පිරවුම් පහසුකම තුළ අළුත් පිරවුම් දොඹකරයක් ඉදිකිරීම සඳහා CPSTL විසින් රුපියල් මිලියන 28ක් ආයෝජනය කරන ලදී. මුළු ඉදිකිරීම් වැඩවලින් 50%ක් 2018 මූල්‍ය වර්ෂය අවසානයේදි නිමකරන ලදි.





# නිෂ්පාදිත
## ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

**කොලොන්නාව නිමාව තුළ අභ්‍යන්තර පාවෙන වහලය සහිත ඝනමීටර් 15.000ක ගබඩා ටැංකියක් ප්‍රසම්පාදනය, ඉදිකිරීම සහ ආරම්භ කිරීම.**

ශ්‍රී ලංකාවේ වාර්ෂික සාමාන්‍ය ඉන්ධන ඉල්ලුම ආසන්න වශයෙන් 4-5% අනුපාතයකට වැඩිවෙමින් පවතී. මෙම වර්ධන අනුපාතය සමග, එක් එක් ඛණිජතෙල් නිෂ්පාදන සඳහා ප්‍රමාණවත් ගබඩා පහසුකම් පවත්වා ගැනීම ශ්‍රී ලංකාවට අවශ්‍ය වේ. මෙම මායිම් ලකුණු ධාරිතාව කොලොන්නාව සහ මුතුරාජවෙල යන නිමාවන් දෙකෙහි යම් දෙන ලද අවස්ථාවක අවම වශයෙන් දින 30ක තොග පවත්වා ගැනීම සඳහාය. ශ්‍රී ලාංකීය ආර්ථිකය පශ්චාත් සිවිල් යුධ යුගය තුළ පුදුම සහගත අනුපාතයකින් වර්ධනය වෙමින් පවත්නා අතර, ශ්‍රී ලංකාව තුළ පෙට්‍රල් සඳහා ඉල්ලුම 2009 වසරේදී 90%කින් වර්ධනය වී ඇත. 1999 න් පසු කොලොන්නාව නිමාව තුළ කිසිදු නව ටැංකි ඉදිකිරීමක් සිදුවී නොමැත. මෙම සියලු කරුණු සලකා බලමින්, යම් දෙන ලද අවස්ථාවක දින 30ක තොග පවත්වා ගැනීම මගින් රටේ ඉන්ධන අවශ්‍යතාව සහතික කිරීම සඳහා CPSTL හි ප්‍රධාන නිමාවන් දෙකෙහි මෙට්‍රික් ටොන් 100,000ක අමතර ගබඩා ධාරිතාවයක් හඳුන්වාදිමට 2012 දී කැබිනට් තීරණයක් ගනු ලැබීය.

මෙම විශාල සංවර්ධන වැඩසටහනේ පළමු අදියර ලෙස, වසර එක හමාරක කාලසීමාවක් තුළ, රුපියල් මිලියන 412ක පිරිවැයට කොලොන්නාව නිමාවේදී ගෑසලින් සඳහා ඝණමීටර් 15,000ක (මෙට්‍රික් ටොන් 11,000) ගබඩා ටැංකියක් ඉදිකිරීමට CPSTL විසින් තීරණය කර ඇත. මෙම ටැංකියේ වර්ගය අභ්‍යන්තර පාවෙන වහලය සහිත පොලොවෙන් ඉහළ සිරස් වැල්ඩින් කරන ලද වානේ ගබඩා ටැංකියකි. වැල්ඩින් කරන ලද ගබඩා ටැංකිවලට අවම කාන්දුවීමේ හැකියාව ඇති අතර අභ්‍යන්තර පාවෙන වහලයට (IFR) අවම වාෂ්පීකරණ අලාභයක් ඇත. යෝජිත ටැංකිය සඳහා නිෂ්පාදන වර්ගය ගෑසලින් 92 (පෙට්‍රල් 92) වේ.

මෙම ව්‍යාපෘතිය CPSTL හි දැක්ම සහ මෙහෙවර සමඟ ගැලපෙන අතර, ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව (CPC) සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම (LIOC) වෙනුවෙන් ඛණිජතෙල් නිෂ්පාදන ගබඩාකිරීමේ සහ බෙදාහැරීමේ කටයුතු සඳහා ශ්‍රී ලංකාව තුළ පොදු පරිශීලක පහසුකමේ යටිතල පහසුකම් සංවර්ධනය වඩාත් අපේක්ෂිත සංවර්ධන වැඩසටහනකි.

මෙම ටැංකිය කොලොන්නාව නිමාවේ ගෑසලින් ගබඩා ප්‍රදේශය අභ්‍යන්තරයේ ඉදිකිරීමට යෝජනා කරන අතර, අරමුදල් මූලාශ්‍රය CPSTL හි අභ්‍යන්තර අරමුදල් වේ. ඉදිරි කොන් ඉංජිනේරුමය සැලැස්ම (FEED) CPS ඔබ හි ඉංජිනේරු කාර්යය විසින් සිදුකරන අතර, ව්‍යාපෘතිය ඉංජිනේරු, ප්‍රසම්පාදන සහ ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත් එකක් ලෙස ක්‍රියාත්මක කෙරේ. එන්ඩෝ ඊස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු වේ.

ඉදිකිරීම් කටයුතු 2017 දෙසැම්බර් 22 දින ඛණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය ගරු අර්ජුන රණතුංග විසින් උත්සවාකාරයෙන් ආරම්භ කරන ලදි.

නියමිත ඉදිකිරීම් කාලසීමාව මාස 18ක් වන අතර, 2018 මූල්‍ය වර්ෂය තුළ මෙහි සැලකියයුතු කොටසක් නිම කෙරේ. සියලුම සිවිල් කටයුතු අවසන් කරන ලදි. කොන්ක්‍රීට් කුළුණුවලින් 86ක් සිදුකරන ලද අතර පදනම සහ ටැංකි පත්ල සඳහා වැලි පිරවීම නිම කරන ලදි. රුපියල් මිලියන 170ක් සිවිල් ඉදිකිරීම් කටයුතු නිමකිරීම සඳහා ගෙවන ලද අතර 2018 මූල්‍ය වර්ෂය අවසානයේදී ව්‍යාපෘතියේ ප්‍රගතිය 40%කි.

**මුතුරාජවෙල යටිතල සංවර්ධන පහසුකම්**

අමතර ධාරිතා හඳුන්වාදිමේ ව්‍යාපාතියට සමාගාමීව, 2016 සිට 2030 දක්වා වැඩිවන ඉල්ලුම සපුරාලීම සඳහා ඉන්ධන පිරවුම් ධාරිතාව වැඩි කිරීමට CPSTL විසින් තීරණය කර ඇත. මුතුරාජවෙල පර්යන්තයේ දැනට පවත්නා පිරවුම් පහසුකම්වල උපරිම භාවිතාව සැලකිල්ලට ගනිමින් මෙම ක්‍රමෝපාය සකස් කරන ලදි. අමතර පිරවුම් ස්ථාන අටක් (08) ඇති කිරීම සඳහා දැනට පවත්නා දොඹකර ව්‍යුහය පුළුල් කිරීම, නව පොම්පාගාරයක් ඉදිකිරීම සහ අදාළ පහසුකම් සංවර්ධනය කිරීම සඳහා යෝජනා කර ඇත. යෝජිත සංවර්ධනයේ ඇස්තමේන්තු වටිනාකම රුපියල් මිලියන 550කි.

මුතුරාජවෙල පර්යන්තය අර්ධ-ස්වයංක්‍රිය පර්යන්තයක් වන අතර කොලොන්නාව සහ අනෙකුත් CPSTL හි තොග ඩිපෝ හා සැසැඳිමේදි කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව අනුව යම් වාසි කිහිපයක් ඇත. සියලූම දොඹකර පිරවුම් ස්ථාන මාර්ග ටැංකි මැදිරි 10ක් පිරවීමට හැකියාව ඇති අතර, අනෙකුත් ස්ථාපනයන්ට සාපේක්ෂව මාර්ග ටැංකි පිරවීමේ කාලය ඉතා අඩුය. ඊට අමතරව, SPBM -02 හි ගොඩබාන නිෂ්පාදන වරායන් වෙනස්වීමකට ලක් නොකරම මුතුරාජවෙල පර්යන්තය වෙත සෘජුවම මාරු කෙරේ. තවත් එක් සැලකියයුතු වාසියක් වන්නේ පර්යන්තය පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ පිවිසුමේ පිහිටා තිබීම වන අතර එය 2019 වසර වන විට මෙහෙයුම් ආරම්භ කිරීමට නියමිතව ඇත. පිටත වටරවුම් අධිවේගී මාර්ගය කොළඹින් ආරම්භවන සැම අධිවේගි මාර්ගයක්ම සම්බන්ධ කරන අතර අවම මෙහෙයුම් පිරිවැයක් සමඟ දිවයිනේ සෑම කොටසකටම ළඟාවීමට මුතුරාජවෙල පර්යන්තයට හැකියාව ඇති කරයි. භූගෝලීය ස්ථානගතවීමේ මෙම ක්‍රමෝපායික වාසිය මුතුරාජවෙල පර්යන්තයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මගින් ප්‍රශස්ථ කිරීමට අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතිය "දකුණු ආසියාවේ වඩාත්ම කාර්යක්ෂම තෙල් ක්‍රියාකරවුම් පර්යන්තය බවට පත්වීම" යන CPSTL හි දැක්ම සමඟ මනාව ස්ථානගත කෙරේ. එකී ව්‍යාපෘතිය සඳහා CPSTL හි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දි ඇති අතර ලංසු ක්‍රියාවලිය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් ද පත්කරන ලදි. කැබිනට් මණ්ඩලය විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටුව ද ස්ථාපිත කර ඇති අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මකව පවතී.



CPSTL විසින් ජාත්‍යන්තර තරඟකාරී ලංසු ක්‍රමය තුළින් ලංසු සඳහා ආරාධනය කර ඇත. ඇගයීම් ක්‍රියාවලිය 2018 මූල්‍ය වර්ෂය අවසානයේදි අවසන් අවස්ථාවේ පැවතින.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ, වඩාත් ඉක්මන් භාරදීමේ වේලාවක් සමඟ දිවයිනේ ඕනෑම කොටසකට ළඟාවීමේ තරඟකාරී වාසිය CPSTL විසින් ලබාගනී.

# නිෂ්පාදිත
## ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

**මුතුරාජවෙල පර්යන්තයේ අංක 6, 7 සහ 8 ටැංකි සඳහා අභ්‍යන්තර පාවෙන වහල සැලසුම් කිරීම, සැපයීම සහ ස්ථාපනය.**

ආයතනික දැක්ම සහ මෙහෙවරට අනුකූලව යමින්, පර්යන්ත මෙහෙයුම්වල කාර්යක්ෂමතාව වර්ධනය කිරීම කෙරෙහි CPSTL අඛණ්ඩව උත්සාහ දරයි. වාෂ්පීකරණය හේතුකොට ගෙන ඇතිවන අලාභ ඛණිජතෙල් නිෂ්පාදන මෙහෙයවීම තුළ CPSTL විසින් මුහුණපාන බරපතල ගැටළුවකි. වාෂ්පීකරණය යනු ආර්ථික අලාභයක් පමණක්ම නොව පාරිසරික දූෂණයක් ද වේ. CPSTL, ආයතනික වගකීම් සහගත පුරවැසියෙක් ලෙස, කළමනාකාරිත්වයේ අවධානය වාෂ්පීකරණ අලාභ අවම කිරීම සම්බන්ධයෙන් වර්ධනය කර ඇත.

අභ්‍යන්තර පාවෙන වහල ස්ථාපනය ස්ථිර බුම්බුලාකාර වහල ටැංකි මත වාෂ්පීකරණය අඩුකිරීම සඳහා ඇමෙරිකානු ඛණිජතෙල් ආයතනය (API) විසින් නිර්දේශිත ක්‍රමයකි.

අභ්‍යන්තර පාවෙන වහල ගෑස් වාෂ්පවීම නියාමනය කිරීමට සැලසුම් කරන අතර ආරක්ෂිත ආකාරයකින් පරිසරය තුළට වායුව වාෂ්පවීම සඳහා ඉඩ ලබා දේ. ස්ථිර වහල ගබඩාකිරීමේ ටැංකි ඇතුළත ස්ථාපිත කරන මෙම වහල ආර්ථිකමය වශයෙන් ලාභදායී විකල්පයක් ද වේ. අභ්‍යන්තර පාවෙන වහල මගින් ද්‍රව මතුපිට විශාල කොටසක් ආවරණය කරන අතර ඵලදායි මුද්‍රාවක් තුළින් විමෝචනය 98% දක්වා අඩුකළ හැක.

මුතුරාජවෙල පර්යන්තයේ වෑල්ඩින් කල වානේ, සිරස් පෙට්‍රල් ගබඩා ටැංකිවල ස්ථිර බුම්බුලාකාර වහල තුන (03) වාෂ්පීකරණ අලාභ අඩු කිරීමට අභ්‍යන්තර පාවෙන වහල ස්ථාපනය සඳහා තෝරාගෙන ඇත. අභ්‍යන්තර පාවෙන වහල ස්ථාපනය සඳහා මුළු ආයෝජනය රුපියල් මිලියන 54.5ක් වන අතර වැඩවලින් 70%ක් පමණ 2018 මූල්‍ය වර්ෂය අවසානය වන විට නිම කර ඇත. මෙම ව්‍යාපාතිය ක්‍රියාත්මක කිරීම මගින්, ඛණිජ තෙල් නිෂ්පාදන නාස්තිය අවම කිරීම පමණක් නොව මෙම අලංකාර දිවයිනේ අපගේ අගනා පරිසරය සුරක්ෂිත කිරීමට දායකවෙමින් සහ අපගේ කීර්තිනාමය ප්‍රදර්ශනය කරන බව CPSTL විශ්වාස කරයි.





# මානව
# ප්‍රාග්ධනය




දිවයින පුරා බාධා රහිත සේවාවක් ලබාදීම තුළ අභිමානවත් සමාගමක් ලෙස, සමාගමේ පරමාර්ථ අත්කර ගැනීමේදී "මානව සම්පත" වැදගත් කාර්යභාරයක් ඉටුකරන බව CPSTL අවබෝධ කර ගනී. මානව සම්පත යනු අනාගත ඵලදායිතාව සහ දිගුකාලීන තිරසාරභාවය ලබාගැනීමේ ප්‍රධාන සංරචකයක් වන අතර CPSTL හි ඉහළම වත්කමකි. එමෙන්ම CPSTL සමාන අවස්ථා සේවා යෝජකයෙක් වන අතර කිසිදු ආකාරයකින් කොන්කිරීමේ ක්‍රියාවන් සිදු නොවන බවට සහතික කරයි.

CPSTL ඉහළ අභිප්‍රේරණ කණ්ඩායම්වල කොටසක් ලෙස සේවය කිරීම සඳහා යෝග්‍ය ස්ථානයක් ලබාදෙමින් මූලිකවම එහි සේවකයින් සඳහා වටිනාකම් නිර්මාණය කරන අතර සේවක ඵලදායිතා අරමුණුවලට සහ සමාගම සේවකයින් සඳහා අගය නිර්මාණය කරන ආකාරයට සහයවීම සඳහා පාලන ව්‍යුහ, ප්‍රතිපත්ති රාමු, පද්ධති සහ ක්‍රියාපටිපාටි ක්‍රියාවේ යොදවා ඇත.

සමාගම ඉන්ධන ගබඩාකර බෙදාහැරීම මගින් පමණක් නොව සියලූම ජනවර්ග කණ්ඩායම් ආවරණය කරමින් රටේ සියලූම පුරවැසියන්ට සමාන අවස්ථා ලබාදීමේ ප්‍රතිඵලයක් ලෙස, වයස, ස්ත්‍රීපුරුෂභාවය සහ ආගම පිළිබඳ නොසලකා අපගේ ශ්‍රම බලකාය සමඟ එක්වීමට අවස්ථාවන් ලබාදෙමින් සමස්ථ රටටම සේවය ලබා දේ. මානව ප්‍රාග්ධනය වඩාත් යහපත් අයුරින් කළමනාකරණය කිරීම සඳහා සමාගම විසින් පියවර කිහිපයක් ගෙන ඇත.

### අපගේ කණ්ඩායම ගොඩනැගීම

අපගේ මානව සම්පත් පදනම සමාගමේ තරඟකාරී සහ තිරසාර ආදායම සහ වර්ධනය පවත්වා ගැනීමේදී මධ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. එමනිසා, මානව සම්පත් කළමනාකරණය CPSTL සඳහා ප්‍රධාන ක්‍රමෝපායික සලකා බැලීමකි. වසර තුළ, අපගේ කණ්ඩායම ශක්තිමත් කිරීම සඳහා පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි අපි අවධානය යොමු කළෙමු.

- අදාළ දක්ෂතා සහ හැකියාවන් සහිත සුදුසු සේවකයින් බඳවාගැනීම
- අපගේ හැකියා සංචිතය රඳවා ගැනීම
- කණ්ඩායම ශක්තිමත් කිරීම සඳහා පුහුණුව සහ සංවර්ධනය
- කාර්යසාධනය කේන්ද්‍රීය සංස්කෘතියක් ස්ථාපිත කිරීම

### සේවක කළමනාකරණය සඳහා අපගේ ප්‍රවේශය




සේවකයින් 2932ක් වන CPSTL හි කණ්ඩායම අපගේ ආයතනික ආචාරධර්ම සමඟ ජීවත්වන අපගේ ක්‍රමෝපායික සැලැස්ම පසුපස ධාවකයා වේ. සේවකයින් අපගේ අභ්‍යන්තර පාරිභෝගිකයින් වන බවත්, දිගුකාලීන සම්බන්ධතා සංවර්ධනය කර පෝෂණය කිරීමට ඔවුන් උත්සාහ ගන්නා බවත් CPSTL හි අපි විශ්වාස කරමු. අපගේ සේවක කොටස ආකර්ශණීය පාරිශ්‍රමික යෝජනා ක්‍රමයක්, පුහුණුව සහ වෘත්තිය සංවර්ධනය සඳහා අවස්ථාවන්ගෙන් නැවත තහවුරු කර ඇති අතර, සියලූම සේවකයින්ට උපකාරී, අනතුරු රහිත පරිසරයක් සහතික කරයි.

**CPSTL හි මානව සම්පත් පාලනය:**
සමාගමේ මානව සම්පත් ප්‍රතිපත්ති රාමුව එහි මව් සමාගමේ (ඛණිජ තෙල් නීතිගත සංස්ථාව) ප්‍රතිපත්ති රාමුවට පුළුල්ව ගැලපෙන අතර කම්කරු නීති පිළිබිඹුවීම සඳහා එහි අදාළත්වය අනුව සංශෝධනය කර ඇත. ක්‍රියාත්මක පාලන රාමුව පැහැදිලි රාජකාරි වෙන්කිරීම, අධිකාරිය සවිබලගැන්වීම මගින් සහ පැහැදිලි නිශ්චිත පාලන ව්‍යුහය ප්‍රවර්ධනය කරයි.

# මානව

## ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

**අපගේ හැකියා සංචිතය**
අපගේ සංචිතය සේවකයින් 2932කින් සමන්විත වන අතර ඔවුන් දක්ෂතාව සහ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අනුව විවිධාකාර වේ. අපගේ බෙදාහැරීම් ජාලයේ පුළුල් භූගෝලීය ව්‍යාප්තිය මත, සේවකයින් මෙරට සියලූම ප්‍රදේශවලින් බඳවා ගනු ලැබේ. කාන්තා නියෝජනය සාපේක්ෂව අඩුය. විශේෂයෙන් විධායක නොවන ශ්‍රේණිවල ඉතා අඩුය. නමුත් විධායක ශ්‍රේණිවල කාන්තා නියෝජනය 27කි.

### බඳවා ගැනීම සහ රඳවා ගැනීම
අපි සමාන අවස්ථා සේවා යෝජකයෙක් වන අතර, බඳවාගැනීම්, උසස්කිරීම් සහ අනෙකුත් ප්‍රතිලාභ තුළ ස්ත්‍රීපුරුෂභාවය, වයස හෝ ජනවර්ගය මත වෙනස් ලෙස නොසලකයි. අපි වයස අවුරුදු 18ට වඩා අඩු පුද්ගලයින් සේවයේ යෙදවීමක් සිදු නොකරන අතර බලාත්කාර හෝ අනිවාර්ය ශ්‍රම ව්‍යවහාර නොඉවසමු. සමාගමේ අඛණ්ඩ වර්ධනය සහතික කරමින්, CPSTL නව දක්ෂයින් බඳවා ගැනීමට උත්සාහ දරන අතර කාර්යසාධනය මත පදනම් වි උසස්වීම් සිදුකරයි.

ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන ඛණිජ තෙල් සේවා සපයන්නාගේ පරිපාලිත සමාගමක් ලෙස, CPSTL විසින් උපකාරී සේවා පරිසරයක් තුළ නිපුනතා වර්ධනයට සහ ආකල්ප සංවර්ධනයට අසමසම අවස්ථා එහි සේවකයින්ට ලබා දේ. ක්ෂේත්‍රයේ විශිෂ්ට දක්ෂයින් ආකර්ෂණය කර ගනිමින් වඩා කැමති සේවා යෝජකයා ලෙස CPSTL ස්ථානගත කිරීමට මෙය සහය වි ඇත. සියලූම බඳවාගැනීම් සහ උසස්වීම් CPSTL හි බඳවාගැනීම් සහ උසස්වීම් යෝජනා ක්‍රමය මත පදනම් වේ.




### සේවක සහභාගිත්වයන් සහ ප්‍රතිලාභ
ස්ත්‍රීපුරුෂභාවය නොසලකා සමාන ශ්‍රේණිය, වර්ගය තුළ වැටුප් පරිමාවන් හී කිසිදු වෙනසක් නොමැති බව සහතික කරමින් ගෙවීම් ව්‍යුහයන් හි විනිවිද ප්‍රතිපත්තියක් සමාගම විසින් අනුගමනය කරයි.

තවද, CPSTL හි සේවකයින් පහත දෑ ඇතුළුව ප්‍රතිලාභ සහ ශුභසාධන කටයුතු පුළුල් ලෙස භුක්තිවිඳි.

| ස්ථිර කාර්ය මණ්ඩලයට සේවක ප්‍රතිලාභ | විස්තරය | පරිවාස අයට ප්‍රතිලාභ |
|---|---|---|
| නිවාඩු | | |
| - වාර්ෂික නිවාඩු | දින 14 | |
| - අනියම් නිවාඩු | වැඩකරන දින 7 | ඔව් |
| - අසනීප නිවාඩු | වැඩකරන දින 21 | |
| - ප්‍රසූත නිවාඩු | - වැඩකරන දින 84 | |
| | - දින 84ක් සඳහා අඩවැටුප් | |
| | - දින 84ක් සඳහා වැටුප් රහිත නිවාඩු | |
| - අනතුරු නිවාඩු | රැකියාව කරන අතරතුර සේවක අනතුර | |
| - හිලව් නිවාඩු | මාසයේ සෙනසුරාදා 4 හි සේවය කරන සේවකයාට හිලව් නිවාඩු දෙකක් හා අතිකාල ගත හැක | |
| - විශේෂ නිවාඩු | විශේෂ සිදුවීම් තුල (මැතිවරණ, ඇඳිරි නීතිය යනාදී) | |
| - රාජකාරි නිවාඩු | නිල රාජකාරි අරමුණ සඳහා විශේෂ සිදුවීම් | |
| - වැටුප් රහිත නිවාඩු | විදේශ අධ්‍යයන, පුහුණු සහ වැඩමුළු යනාදිය සඳහා | |
| වැටුප් වර්ධකය | සේවකයාගේ රාජකාරි, පැමිණිම සහ හැසිරීම ඇගයීම | ඔව් |
| දීමනා | ආහාර දීමනා, සංචාර දීමනා, පර්යන්ත දීමනා, පැමිණීමේ දිරිදීමනා, සේවා මුර දීමනා, වාර්ෂික නිවාඩු දිරි දීමනා, ජීවන වියදම් දීමනා, වෘත්තීය දීමනා සති අන්ත දීමනා, කාර්යාල දුරකථන ප්‍රතිලාභ යනාදිය | ඔව් |

# මානව
## ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

| ස්ථිර කාර්ය මණ්ඩලයට සේවක ප්‍රතිලාභ | විස්තරය | පරිවාස අයට ප්‍රතිලාභ |
|---|---|---|
| ප්‍රසාද දීමනා | වෛද්‍ය නිවාඩු දිරිදීමනා, වාර්ෂික ප්‍රසාද දීමනා | ඔව් |
| ණය | | |
| - ආපදා ණය | මාස 10 ක වැටුප. සරල සහනශීලී පොලී අනුපාත. මාස 60 කින් අයකරගැනීම | නැත |
| - නිවාස ණය | ඉඩමක් හෝ නිවසක් මිලදී ගැනීම හෝ නිවාස ඉදිකිරීම සරල සහනශීලී පොලී අනුපාත, මාස 300 කින් හෝ සේවකයා ඉතිරි රාජකාරි කාලය යන දෙකෙන් අඩු කාලය තුළ අයකරගැනීම | නැත |
| - නිවාස අලුත්වැඩියා ණය | නිවාස අලුත්වැඩියා සඳහා, සරල සහනශීලී පොලී අනුපාත, මාස 120ක වාරිකවලින් අයකරගැනීම | |
| - නිවාස පහසුකම් ණය | ගෘහභාණ්ඩ මිලදී ගැනීම සඳහාග සරල සහනශීලී පොලී අනුපාත, මාස 60ක වාරිකවලින් අයකරගැනීම | |
| - සකසුරුවම් සමිති ණය | මාස 03 ක වැටුප. සරල සහනශීලී පොලී අනුපාත, මාස 60 ක වාරිකවලින් අයකරගැනීම | |
| - කාර් ණය | විධායකයින්ට පමණි. සහනශීලී පොලී අනුපාත, මාස 60 ක වාරිකවලින් අයකරගැනීම | |
| - මෝටර් සයිකල් ණය | සරල සහනශීලී පොලී අනුපාත, මාස 60 ක වාරිකවලින් අයකරගැනීම | |
| - ත්‍රී රෝද ණය | සරල සහනශීලී පොලී අනුපාත, මාස 60 ක වාරිකවලින් අයකරගැනීම | |
| අත්තිකාරම් | | |
| - උත්සව අත්තිකාරම් | පොලි නොමැත. මාස 10 කින් අයකරගැනීම | |
| - අලුත් අවුරුදු අත්තිකාරම් | පොලි නොමැත. මාස 10 කින් අයකරගැනීම | |
| - පාසල් පොත් අත්තිකාරම් | පොලි නොමැත. මාස 10 කින් අයකරගැනීම | |
| ත්‍යාග පිරිනැමීම | සේවකයාගේ සේවය මත රඳා පවතී. | |
| ශුභසාධනය ආශ්‍රිත ප්‍රතිලාභ | - CPC හෝ CPSTL හි සෑම සේවකයෙකුටම තම පවුල සමඟ දින 3ක්/රාත්‍රී 2ක් නැවතී සිටීමේ අවස්ථාව හිමිය. | |
| | - CPSTL ක්‍රීඩා සමාජ උත්සව තුළ සහභාගිත්වය | |
| | - වාර්ෂික සංචාරය | |
| | - ලේ දන්දීමේ කඳවුර | |
| | - CPSTL පරිශ්‍රයන්හි සමූපාකාර වෙළෙඳ සැළ | |
| | - - CPSTL පරිශ්‍රයන්හි පවත්වාගෙන යන ආපනශාලාව | |
| වෛද්‍ය ප්‍රතිලාභ | - CPSTL I පර්යන්තයන් හී කාර්යස්ථ වෛද්‍යවරයෙක් සහ නොමිලේ ඖෂධ සහ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය | |
| | - රෝහල්ගත කිරීම සඳහා වෛද්‍ය රක්ෂණය | |
| | - රසායනාගාර පරීක්ෂණ සඳහා ප්‍රතිපූරණය | |
| | - විශේෂ පරීක්ෂණ සඳහා අසීමිත ප්‍රතිපූරණය (CT ස්කෑන්, US ස්කෑන්, MRI, එන්ඩෝස්කොපි) | |
| මරණ ප්‍රතිලාභ | මරණ වන්දි ගෙවීම | |
| සකසුරුවම් සමිති ප්‍රතිලාභ | - මරණ පාරිතෝෂිතයට සේවකයින් සහ ආසන්න පවුල් සාමාජිකයින්ගේ මරණය ඇතුළත්ය. | |
| | - පාරිතෝෂිකය ව්‍යවස්ථාපිත පාරිතෝෂිකය මෙන් ලබා දේ. | |
| විශ්‍රාම වෙන්කිරීම | ව්‍යවස්ථාපිත පාරිතෝෂිකය | |
| වෙනත් පහසුකම් | විශේෂ රාජකාරි සඳහා නිල ඇඳුම්, රාත්‍රී සේවකයින් සඳහා ආහාර ලබාදීම | |

# මානව
## ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

### පුහුණු සහ සංවර්ධනය

ඒකාබද්ධ චින්තනය, පුද්ගල ප්‍රවීනතාව, මානසික ආදර්ශ, හුවමාරු දැක්ම සහ කණ්ඩායම් ඉගෙනුම උත්තේජනය කරමින් සමාගම විසින් ඉගෙනුම් පරිසරයක් දිරි ගන්වයි. සමාගම පුහුණු අවශ්‍යතා අඛණ්ඩව පරීක්ෂා කරමින් සේවකයින්ට පුහුණු අවශ්‍යතා ලබා දේ. ඒ සමගම, ඔවුන්ගේ සමස්ත කාර්යසාධනය වැඩි කිරීමට ඔවුන්ට අවශ්‍ය පුහුණු ක්ෂේත්‍ර කරා යොමුවීමට සේවකයින් දිරි ගන්වා අභිප්‍රේරණය කරනු ලැබේ.

CPSTL හි පුහුණුව සහ මානව සම්පත් සංවර්ධන කාර්යය අඛණ්ඩව සියලුම සේවකයින්ගේ පුහුණු අවශ්‍යතා නියාමනය කරයි. නිත්‍ය පුහුණු වැඩසටහන් තුළින් කුසලතා සහ දක්ෂතා වර්ධනය කිරීම තුළ අපගේ සේවකයින්ට අපි සහය වෙමු. අභ්‍යන්තරව පවත්වන පුහුණු වැඩසටහන්වලට අමතරව, සේවකයින්ට බාහිර පුහුණු වැඩසටහන්වලට සහභාගිවීමට සේවකයින් වෙත අවස්ථාව ලබා දේ. සමාලෝචිත වසර තුළ, සමාගම තාක්ෂණික දැනුම, මෘදු කුසලතා, නායකත්ව කුසලතා, පීඩන කළමනාකරණය පිළිබඳ සහභාගිවූවන් 1,769ක් සඳහා පුහුණු පැය 12,609ක් පවත්වා ඇත. වසර තුළ සිදුකරන ලද පුහුණු කටයුතු පිළිබඳ සාරාංශයක් පහතින් දැක්වේ.

| වැඩසටහන | සහභාගිවූවන් | පැයගණන |
|---|---|---|
| මූලික දැනුවත් කිරීමේ වැඩසටහන | 61 | 122 |
| හැකියා සංවර්ධන වැඩසටහන | 117 | 702 |
| අපද්‍රව්‍ය වර්ගීකරණය | 76 | 228 |
| ඔබගේ ගනුදෙනුකරු ප්‍රබෝධමත් කිරීම | 129 | 774 |
| සේවක සංවර්ධන වැඩසටහන | 56 | 336 |
| ඉංග්‍රීසි | 33 | 1980 |
| FIDIC ලියවිලි | 19 | 342 |
| ගිනිබටයින් සඳහා ප්‍රථමාධාර වැඩසටහන | 27 | 162 |
| හඳුන්වාදීමේ වැඩසටහන | 9 | 162 |
| අභ්‍යන්තර විනයානුකූල පරීක්ෂණ | 92 | 552 |
| නායකත්ව සහ අධීක්ෂක නිපුනතා සංවර්ධනය | 58 | 348 |
| කාර්යාල කළමනාකරණය සඳහා නෛතික අංග | 70 | 420 |
| පොම්ප 1 යාන්ත්‍රණය/කාර්යයන් | 51 | 306 |
| සේවා අනර්ඝත්වය වර්ධනය සඳහා අවධානය | 369 | 2214 |
| සංගීත චිකිත්සාව | 61 | 183 |
| කාර්යාල ආධාර සහ කාර්යාල සහයක සංවර්ධන වැඩසටහන | 43 | 258 |
| පුද්ගල සුදානම, ව්‍යාපාර සමාජ ආචාරධර්ම | 39 | 234 |
| ධනාත්මක චින්තනය හා සක්‍රීය හැසිරීම | 341 | 682 |
| පවත්නා කාර්යසාධන ඇගයීම් ක්‍රමය | 27 | 81 |
| ඵලදායිතා සංවර්ධන වැඩසටහන | 41 | 123 |
| ප්‍රසම්පාදනයට අදාළ ලියවිලි පරීක්ෂා කිරීම | 43 | 258 |
| වෑද්දුම්කරු වැඩසටහන සඳහා නිපුනතා යාවත් කිරීමේ වැඩසටහන-NVQ | 25 | 1500 |
| ක්‍රමෝපායික සැලසුම් කිරීම | 27 | 162 |
| වෑල්ඩින්කරු | 16 | 480 |
| මුළුගණන | 1769 | 12609 |





# මානව
## ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

හැකියා සංවර්ධනය සඳහා සමාගමේ ප්‍රවේශය පහත සඳහන් අරමුණු කරා අඛණ්ඩව කටයුතු කිරීම තුළ කළමනාකාරිත්වය සහ සේවකයින්ගේ අන්‍යෝන්‍ය වගකීමක් ලෙස සලකනු ලබයි.

- සුදුසුකම්ලත්, උද්යෝගිමත් සහ විශ්වාසී ශ්‍රම බලකායක් සහතික කිරීම
- සියලුම සේවකයින් සඳහා යෝග්‍ය සේවා පරිසරයක් සහ සම්පත් සහතික කිරීම
- කැමති වෘත්තිකයින් සඳහා සේවය කිරීමට ආශාකරන ස්ථානයක් ලෙස සහ වැඩිදුරටත් ප්‍රවීන සංවර්ධනය ලබාදීම සඳහා ස්ථානයක් ලෙස CPSTL තේරුම් ගැනීම
- සේවකයින් අතර ආයතනික සහ අන්‍යෝන්‍ය විශ්වාසය ප්‍රවර්ධනය කිරීම
- තම සුදුසුකම් තවදුරටත් වැඩිකර ගැනීමට සහ තම හැකියාවන් වර්ධනය කර ගැනිමට වෘත්තීමය සංවර්ධනය සඳහා සේවකයින්ට අවස්ථා ප්‍රවර්ධනය කිරීම
- සේවා ස්ථානය තුළ සමානතාව සහතික කිරීම

### වන්දි ගෙවීම, ප්‍රදානය සහ පිළිගැනීම

රාජකාරිය අතරතුර සහ රාජකාරියට යාම හෝ ආපසු පැමිණීමේදී සිදුවන අනතුරු සඳහා වන්දිගෙවීම, විශේෂිත සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් අභිනන්දනය කිරීම ඇතුළුව CPSTL විසින් ප්‍රතිලාභ රාශියක් ලබාදිම සිදුකරයි. සමාගම සෑම අවස්ථාවකදිම සේවකයින්ගේ වෘත්තිය සංවර්ධනය පිළිබඳ උනන්දුවන අතර MBA සහ අනෙකුත් පශ්චාත් උපාධි අධ්‍යයන හැදෑරීම සඳහා මූල්‍ය සහයෝගය ලබා දෙමින් උසස් අධ්‍යාපනය සඳහා ඔවුන් අභිප්‍රේරණය කරයි. ආයතනය තුළ වෘත්තිකයින් රඳවා තබා ගැනීම සඳහා, CPSTL විසින් වාර්ෂික වෘත්තීය ආයතන දායකත්වයන් ප්‍රතිපූරණය කරන අතර, සේවකයින්ට සහභාගිවීම සහ අඛණ්ඩ වෘත්තිය සංවර්ධනය ලබාගැනීමට දිරිගන්වමින් වෘත්තීය ආයතන විසින් පවත්වනු ලබන සම්මන්ත්‍රණවල ගාස්තු ද ප්‍රතිපූරණය කරයි.

උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම මගින් සමාගම සේවකයින්ගේ ළමුන් දිරිගන්වනු ලබයි. සමාලෝචිත වර්ෂය තුළ, විවිධ ක්ෂේත්‍රයන්හී උපාධි අපේක්ෂකයින් සඳහා ශිෂ්‍යත්ව 144ක් පිරිනමන ලදී.




සමාලෝචිත වර්ෂය තුළ, පහත පරිදි විශේෂිත සේවා කාලයක් සම්පූර්ණ කිරීම වෙනුවෙන් සේවකයින් 2019ක් අභිනන්දනය කරන ලදී.

| සේවා කාලය | සේවකයින් ගණන |
|---|---|
| අවුරුදු 20 | 116 |
| අවුරුදු 25 | 33 |
| අවුරුදු 30 | 46 |
| අවුරුදු 35 | 23 |
| අවුරුදු 40 | 1 |

### සේවක උත්සව අවස්ථා

- **පොසොන් බැති ගී සහ පොසොන් දන්සැල**

CPSTL හි සේවකයින්ගේ පූර්ණ සහයෝගිත්වයෙන් CPSTL හි පරිශ්‍රයේදි පොසොන් දින පොසොන් බැති ගී සහ කිරි කොපි දන්සැල පවත්වන ලදී.






# මානව
## ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

- **ලේ දන්දීමේ වැඩසටහන**

සමාගමේ සේවකයින්ගේ පූර්ණ සහ සක්‍රිය සහභාගිත්වයෙන් අඛණ්ඩව 38 වැනි වරටත් 2018 වසර තුළ වාර්ෂික ලේ දන්දීමේ වැඩසටහන සාර්ථකව පවත්වන ලදී.





- **ධනාත්මත චින්තනය තුළින් ඵලදායිතා සංවර්ධනය පිළිබඳ වැඩමුළුව**

ධනාත්මක චින්තනය තුළින් ඵලදායිතා සංවර්ධනය පිළිබඳ වැඩමුළුවක් ඛණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් රාජකාරිය සහ ජීවිතය තුළ ඵලදායිතාව ඉහළ නැංවීමේ අරමුණ ඇතිව CPSTL, ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව සහ අමාත්‍යාංශයේ කළමනාකාරිත්ව මට්ටමේ සේවකයින් සඳහා පවත්වන ලදී.





- **රන්කාසි පිරිනැමීමේ උත්සවය**

සමාගමේ වසර 25ක සේවා කාලය සාර්ථකව සම්පූර්ණ කරන ලද සේවකයින්ගේ අභිනන්දනය සඳහා රන් කාසි පිරිනැමීමේ උත්සවයක් ලංකා ඛණිජ තෙල් නිතිගත සංස්ථාවේ සහයෝගයෙන් පවත්වන ලදී. CPSTL හි සේවකයින් 33 දෙනෙක් 2018 දී අභිනන්දනය කරන ලදී.





# මානව
## ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

- **බෞද්ධ ධර්මදේශනාව**

CPSTL හි බෞද්ධ සංගමය විසින් සියලුම සේවකයින්ට සහභාගිවීම සඳහා ආරාධනය කරමින් කාර්යාල පරිශ්‍රය තුළ පෝය දින බෞද්ධ ධර්මදේශනා පවත්වනු ලබයි.





- **සේවක අභිප්‍රේරණ වැඩසටහන**

"කුණ්ඩල" නමින් හඳුන්වන සංගීතය සහිත සේවක අභිප්‍රේරණ වැඩසටහනක් CPSTL හි කලා සංගමය විසින් සියලුම ශ්‍රේණිවල සේවකයින් සඳහා පවත්වන ලදී. මෙම වැඩසටහන පවත්වනු ලැබුයේ සහෝදර චාල්ස් තෝමස් විසිනි,





- **ඵලදායිතාව තුළින් සේවා අනර්ඝත්වය වර්ධනය සඳහා අවධානය**

CPSTL හි සේවකයින් 100ක සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් මනස චිකිත්සීය අභ්‍යන්තර සහ බාහිර පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. ඉන් මනස දියුණුව තුළින් පුද්ගල සුදානම සංවර්ධනය, පීඩන අවස්ථාවනට සහන සැලසීම සහ අපගේ සේවකයින් සඳහා වටිනාකම් පදනම් පෞරුෂතාවක් නිර්මාණය කිරීම සඳහා සහයවිය.





# ස්වභාවික
## ප්‍රාග්ධනය







ස්වභාවික ප්‍රාග්ධනය යනු අපගේ වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය සඳහා ප්‍රධාන යෙදවුම වන අතර පරිසරය කෙරෙහි අපගේ බලපෑම අවම බව සහතික කිරීම සඳහා ශක්තිමත් බැඳීම අපගේ සියලුම අංශ විසින් පෙන්වා දේ.

සම්පත් හිඟය සහ කාලගුණ වෙනස බරපතල ගෝලීය ගැටළුවක් ලෙස මතු වී ඇති අතර එය ලෝවවටා ආයතනවල තිරසාරත්වයට තර්ජනයක් විය හැක. CPSTL හි අපි බලශක්ති සහ ජලයේ කාර්යක්ෂමතාව උපරිම කිරීම, නාස්තිය අවම කිරීම සහ අපගේ කාබන් පියසටහන අඩුකිරීම තුළින් අපගේ ව්‍යාපාර තිරසාරත්වය වර්ධනය කිරීමට අපි උත්සාහ ගනිමු. බලශක්ති පරිභෝජනය, බලශක්ති තීව්‍රතාව සහ අපජලය සහ අපද්‍රව්‍යවල තත්ත්වය සහ ප්‍රමාණය වැනි පාරිසරික දර්ශක මැනීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණ ක්‍රියාවට නංවා ඇත. වර්ෂය තුළ, පාරිසරිකමය රෙගුලාසි සහ නීතිවලට අනුකූල නොවීම නිසා සමාගම වෙත දඩමුදල් හෝ දඩුවම් පනවන ලද අවස්ථා නොමැත.

### බලශක්තිය

බලශක්ති සම්බන්ධ අපගේ ප්‍රධාන මූලාශ්‍ර වන්නේ විදුලිය, ඩිසල්, දැවි තෙල්ය. බලශක්තිය ප්‍රධාන වශයෙන් පර්යන්ත දෙක (කොලොන්නාව සහ මුතුරාජවෙල) තුළ පරිභෝජනය කරන අතර ඒවා වඩාත් බලශක්ති අක්වෙරළ ඒකකය සහ දිවයින පුරා ගබඩා වේ. වසර තුළ මූලාශ්‍ර තුළින් සමාගමේ බලශක්ති පරිභෝජනය පහතින් දැක්වේ.

| බලශක්ති මූලාශ්‍රය | මිණුම් ඒකකය | 2018 දී පරිභෝජනය | 2017 දී පරිභෝජනය |
|---|---|---|---|
| මිලදීගත් විදුලිය | කි.වො | 3,286,631 | 2,904,300 |
| ඩිසල් | කි.ලී | 4,457 | 4,897 |

CPSTL විසින් බලශක්ති කාර්යක්ෂමතාව වැඩි කිරීමට පියවර කිහිපයක් ගෙන ඇත.

පොම්පාගාර, පිරවුම් දොඹකර සහ ටැංකි ගොවිපල ඉදිකිරීම් සහ/හෝ ව්‍යාප්ත කිරීම් නව සංවර්ධනයන් සහ වැඩිදියුණු කිරීම් සහ එවැනි ස්ථාපනයන් සඳහා අවශ්‍ය යන්ත්‍ර සැලසුම්කළ ප්‍රමිති අනුව උපරිම ඵලදායී මෙහෙයුම් ස්ථානයක් මෙහෙයවීම සඳහා ඉංජිනේරු කාර්යය විසින් සැලසුම් කෙරේ. මෙසේ, අභ්‍යන්තර ඉංජිනේරු කණ්ඩායම විසින් සිදුකරන සැලැස්ම මගින් බලශක්ති කාර්යක්ෂමතාව අත්කර ගනි.

### ජලය

සමාගමේ මෙහෙයුම් ජලය ආශ්‍රිත නොවන අතර අපි ජලය භාවිතා කරන්නේ මූලිකවම සේවකයින්ගේ පරිභෝජනය සහ නඩත්තු කටයුතු සඳහා පමණි. අපගේ ජල අවශ්‍යතාවන් නගර සභා මාර්ගවලින් මූලික වශයෙන් ඉටු කර ගනී. සමාගමේ මුළු ජල පරිභෝජනය පහතින් දැක්වේ.

| මූලාශ්‍රය | මිණුම් ඒකකය | 2018 දී පරිභෝජනය | 2017 දී පරිභෝජනය |
|---|---|---|---|
| නාගරික ජල සැපයුම | කි.ලී | 333 | 275 |

### අමුද්‍රව්‍ය

ශ්‍රී ලංකාව පොසිල ඉන්ධන නිෂ්පාදනය නොකරන බැවින්, මූලික අමුද්‍රව්‍යය පැට්‍රෝලියම් පදනම් ඉන්ධන වන අතර ඒවා ජාත්‍යන්තර පාර්ශ්වයන්ගෙන් සම්පූර්ණයෙන්ම ලබාගනී.

# ස්වභාවික
## ප්‍රාග්ධනය (ඉතිරි කොටස)

### විමෝචන, අපද්‍රව්‍ය හා අපජලය

සියලුම ඛණිජතෙල් නිෂ්පාදන වාෂ්පශීලි වන බැවින්, ඛණිජතෙල් නිෂ්පාදන වාෂ්පීකරණය හේතු කොට ගෙන හාත්පස පැතුරුණු වායු දූෂණයක් ඇත. එමනිසා, CPSTL පරිශ්‍රය තුළ ආශ්වාස වායුවල තත්ත්වය තහවුරු කර ගැනීම සඳහා හාත්පස පැතුරුණු වායුවල තත්ත්වය මැනීම් සිදුකරන ලදී. එහි ප්‍රතිඵල අනුව, සියලුම ප්‍රතිඵල ප්‍රමිතිය විසින් පනවන ලද උපරිම සීමාවට පහළ මට්ටමේ විය.

ඛණිජතෙල් නිෂ්පාදනවල අංශුමාත්‍ර වැහිවතුර මත ඉදිරිපත්විය හැකිය. මාර්ග ටැංකි සහ දුම්රිය වැගන්වලට පිරවුම් කාලය තුළ සහ පොම්ප මෙහෙයුම් කාලය තුළ නිෂ්පාදන අහඹුලෙස අපතේ යාම මෙයට ප්‍රධාන හේතුව වේ. ඊට අමතරව, මාර්ග සෝදායැවීම සඳහා භාවිතා කරන මුහුදු වතුරවල ද ඛණිජතෙල් නිෂ්පාදනවල අංශුමාත්‍ර අඩංගු විය හැකිය. මෙම තෙල්සහිත ජලය මුදාහැරීම සඳහා අතුරුවාරක ටැංකි ක්‍රම භාවිතයෙන් ක්‍රමවේදයක් CPSTL විසින් යොදා ගනී. මෙම තෙල්සහිත ජලය සියලුම නිෂ්පාදන ටැංකි ආවරණය කරමින් ටැංකි ගොවිපල තුළ පිහිටි අතුරුවාරක හරහා ගමන් කරයි. අතුරුවාරකයේ ගුරුත්ව වෙනස මගින් ජලයෙන් තෙල් වෙන් කෙරේ. වෙන්කරන ලද තෙල් කලින් කල ගලි බව්සර් මගින් රැස් කරන අතර තෙල් රහිත ජලය තවදුරටත් නිරවුල් කිරීම සඳහා වෛකල්පිත විලකට යවනු ලැබේ.

ටැංකි පිරිසිදු කිරීමේදී ඇතිවන රොන්මඩ CPSTL සඳහා තවත් අර්ධ ද්‍රව අපද්‍රව්‍යයකි. රොන්මඩ පිරිසිදු කිරීමේ උපලේඛනයට අනුව සහ රැස්කරන රොන්මඩ ප්‍රමාණය අනුව කලින් කල බාහිර පාරිභෝගිකයින්ට විකුණනු ලැබේ. ගරාජවලින් රැස්කරන ඉවත දමන එංජින් තෙල් ද ටෙන්ඩර් ක්‍රියාපටිපාටි තුළින් බාහිර පාරිභෝගිකයින්ට විකුණනු ලැබේ. ඊට අමතරව, පරිසරය සුරැකීම සඳහා වසර තුළ පහත සඳහන් වැඩි දියුණු කිරීම් සිදුකරන ලදී.

- හදිසි අවශ්‍යතාවයක් පරිදි, අවශෝෂක නොවන තෙල් බූමයක් HSE ඒකකය යටතේ මිලදී ගන්නා ලදී. අපතේ යන තෙල් ආපසු ලබාගැනීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීමට අහඹු ඉන්ධන කාන්දුවීම් තුළ මෙම බූමය භාවිතා කිරීමට නියමිතය.
- ආපන ශාලාවේ එකතුවන කාබනික අපද්‍රව්‍ය හැරවීමට සහ එය බැක්ටීරියා පරිවෘත්තීය ක්‍රියාව තුළින් බලශක්තිය බවට පරිවර්තනය කිරීමට ජීවවායු ජෙනරේටරයක් මිලදී ගන්නා ලදී.

### නිෂ්පාදන ප්‍රවාහනය

ඛණිජතෙල් නිෂ්පාදන ප්‍රවාහනය භූමිය සහ ජල මූලාශ්‍ර දෙක දූෂණය වන ඉන්ධන පිටාරගැලීම/කාන්දුවීම/අනතුරු හේතු කොට ගෙන පාරිසරික අවදානමක් ඇති කරයි. ප්‍රවාහන කාර්ය මණ්ඩලය මනාව පුහුණු කර ඇතිබව සහ සැලසුම් නොකළ සිදුවීම් මෙහෙයවීම සහතික කිරීම තුළ පහත සඳහන් ආරක්ෂිත ක්‍රියාමාර්ග සමාගම විසින් යොදා ගනී. පිටාරගැලීම/කාන්දුවීමක් වැනි අවස්ථාවක ප්‍රමිති සහ හදිසි ප්‍රතිචාර ක්‍රම පිළිබඳ ප්‍රවාහන කණ්ඩායම් සඳහා ඉදිරියට යන පුහුණු වැඩසටහන් සහ ආදර්ශන අපි පවත්වමු. අපගේ වැඩසටහන්වලට පහත දෑ ඇතුළත්ය.

- තෙල් පටවන නැවේ සිට නැව්බඩු මුදාහැරීම තුළ බොයාව/ජැටියේදී ඉන්ධන කාන්දුවීම් වැලැක්වීම. නළ මාර්ගවල හානි නොමැති බව සහතික කිරීමට නැව්බඩු ලබාගැනිමට පෙර ලබාගැනීමේ සහ තෙල් පටවන නැවෙන් ගොඩබාන නළ දෙක පීඩන පරීක්ෂණයට ලක් කරන ලදී.
- ඉන්ධන පිටාරගැලීම සිදුවන අවස්ථාවකදී, ඉන්ධන අපකිරණ රසායනික ද්‍රව්‍ය සහ ඉන්ධන අවශෝෂක (ඉන්ධන පාදනය) සුළු ඉන්ධන පිටාර ගැලීම අවම කරන බව සහතික කිරීමට ලබාගත හැකිය.
- ජනතා වගකීම්, නිෂ්පාදන වගකීම් සහ දූෂණ වගකීම් සඳහා තෙවැනි පාර්ශ්ව රක්ෂණය.

# පාලනය සහ අනුකූලතාව

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් . සාර්ථකත්වය මත ව්‍යාප්ත වෙමින්

# ආයතනික
## පාලනය

### අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශනය

CPSTL හි අධ්‍යක්ෂ මණ්ඩලය සමාගම තුළ ආයතනික පාලන මූලධර්ම යොදා ගැනීම සඳහා දැඩිව කැපවී සිටින බවත් සහ ආයතනික පාලන වාර්තාවෙන් සමාගම තුළ ආයතනික පාලන ව්‍යවහාර පිළිබඳ සාධාරණ වාර්තාවක් සපයන බවත් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තහවුරු කිරීමට මම කැමැත්තෙමි.

ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය සහ සියලුම කාර්ය මණ්ඩලය අදාළ නියාමන සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කර ඇති බව මම ප්‍රකාශ කරමි.

**ජී. එස්. විජේසිංහ**
සභාපති



CPSTL හි ආයතනික පාලනය යහපත් සහ ඵලදායි ආයතනික සංස්කෘතියක් නිර්මාණය කිරීමට සැලසුම් කරන අතර ඉන් සෑම ගනුදෙනුවකදීම අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ කළමනාකාරිත්වයේ වගවීම, විනිවිදබව, සාධාරණත්වය ශක්තිමත් කරමින් ආයතනය පිළිබඳ ජනතා විශ්වාසය ගොඩ නැගීමට සහය වේ. ආයතනික පාලනයේ අරමුණ වන්නේ සමාගමට දිගුකාලීන සාර්ථකත්වය අත්කර දියහැකි ඵලදායී, ව්‍යවසායකත්ව සහ විචක්ෂණ කළමනාකාරණයක් ඇති කිරීමයි. පුළුල් අර්ථයෙන් එයට අයත් වන්නේ;

- දැක්ම, මෙහෙවර, පරමාර්ථ සහ ක්‍රමෝපාය සැලසුම්කර සන්නිවේදනය කරන ආකාරය
- වටිනාකම් සමඟ මනාව අනුකූල වන අකාරය
- අවදානම් කළමනාකරණය කරන ආකාරය
- විනිවිදභාවය ප්‍රවර්ධනය කරන ආකාරය
- තිරසාර ආකාරයකින් මෙහෙයුම් කළමනාකරණය කරන ආකාරය
- අනාගත නායකයින් දිරිමත් කරමින් සංවර්ධනය කරන ආකාරය
- පාර්ශ්වකාර වටිනාකම් වැඩි කිරීමට ආයතනික සංස්කෘතිය ප්‍රවර්ධනය කරන ආකාරය

ශ්‍රී ලංකාව තුළ ඛණිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදාහැරීමේ ප්‍රධාන දායකයා ලෙස, මෙම ආයතනය රටේ නියාමන ආයතන විසින් දක්වා ඇති නීතිකරණ, රෙගුලාසි සහ සංග්‍රහවලට අනුකූලව ආයතනික පාලනය පිළිබඳ මූලධර්ම ක්‍රියාත්මක කිරීමට සහතික වන අතර එය සමාගම විසින් දක්වා ඇති අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශවලටද අනුකූල වේ.

### ආයතනික පාලන රාමුව

1. අනුකූලතාව
2. අභ්‍යන්තර පාලන ව්‍යූහය
3. සහතිකවීම සහ පාලනය




| අනුකූලතාව |
|---|
| **බාහිර අවශ්‍යතා** |
| 2007 අංක 7 දරන සමාගම් පනත |
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කල ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය |
| 2003 දී මුදල් අමාත්‍යංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ |
| 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත |
| **අභ්‍යන්තර අවශ්‍යතා** |
| සාංගමික ව්‍යවස්ථාවලිය |
| අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රතිපත්ති |
| සමාගම් රෙගුලාසි |
| ව්‍යාපාර චර්යා සංග්‍රහය |
| අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය |

# ආයතනික
## පාලනය (ඉතිරි කොටස)

**01. අනුකූලතාව**
සමාගමේ ආයතනික පාලන ව්‍යවහාර පහත සඳහන් නීතිකරණ, සංග්‍රාහ සහ ස්වේච්ඡා ව්‍යවහාර අවශ්‍යතාවන්ට අනුකූල වේ.

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කල ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය
- 2003 දී මුදල් අමාත්‍යංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ.
- 2007 අංක 7 දරන සමාගම් පනත
- 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත
- සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය
- අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රතිපත්ති
- සමාගම් රෙගුලාසි
- ව්‍යාපාර චර්යා සංග්‍රහය
- අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය

**02. • අභ්‍යන්තර පාලන ව්‍යුහය**

- **අධ්‍යක්ෂ මණ්ඩලය**
සමාගමේ සියලුම කටයුතුවල ආයතනික පාලනය පිළිබඳ ඉහළම ප්‍රමිති පවත්වා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය කැප වී සිටී.

පාලනයේ අරමුණ වන්නේ ඵලදායි සහ විචක්ෂණ කළමනාකරණය තුළින් කොටස්හිමියන්ට දිගුකාලීන තිරසාරත්වය ඇති කිරීමයි.

**අධ්‍යක්ෂ මණ්ඩල වගකීම්**
අධ්‍යක්ෂ මණ්ඩලයේ මූලික වගකීම් පහත පරිදි වේ;

- ක්‍රමෝපායන් සකස් කිරීම තුළ උපදෙස් හා මගපෙන්වීම් ලබාදීම තුළින් ආයතනයේ දිගුකාලින සාර්ථකත්වය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරයි.
- ක්‍රමෝපායික මඟ පෙන්වීම ලබාදීම සහ ආයතනික ක්‍රමෝපාය සහ සමාගමේ කාර්යසාධන පරමාර්ථ ඇගයීම, සමාලෝචනය සහ අනුමත කිරීම.
- වාර්ෂික සැලසුම් සහ දිගුකාලීන ව්‍යාපාර සැලසුම් සමාලෝචනය සහ අනුමත කිරීමග
- පාලන සහ අනුකූලතා ක්‍රම නියාමනය.
- සමාගම විසින් යොදාගන්නා මූල්‍ය සහ අනෙක් වාර්තාකරණ ව්‍යවහාර අනුමත කිරීම සහ නියාමනය.
- ප්‍රධාන අත්කරගැනීම්, බැහැරකිරීම් සහ ප්‍රාග්ධන වියදම සමාලෝචනය සහ අනුමත කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ සිට විධායක මට්ටම දක්වා බෙදනු ලබන අභිමතයන්/බලාධිකාරයන් වෙත යම් වෙනස්වීම් තිරණය කිරීම.
- අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි පාලනය.

◊ **අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය**

2018 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය පහත පරිදි විය.

| අධ්‍යක්ෂවරයාගේ නම | | අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වූ දිනය | අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්වූ දිනය | තනතුර |
|---|---|---|---|---|
| 1 | අනුජ් ජයින් මහතා | 2015 ඔක්තෝබර් 14 | 2018 අගොස්තු 16 | වි.නො.අ |
| 2 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය | 2015 ඔක්තෝබර් 14 | | වි.නො.අ |
| 3 | ශ්‍යාම් බෝරා මහතා | 2015 ඔක්තෝබර් 14 | | වි.නො.අ |
| 4 | රංධීර් සින් මහතා | 2016 ජුනි 01 | 2018 මැයි 30 | වි.නො.අ |
| 5 | ධම්මික රණතුංග මහතා | 2017 ජුනි 01 | | සභාපති :වි.අ* |
| 6 | සංජීව විජේරත්න මහතා | 2016 ජුනි 01 | | කළමනාකාර අධ්‍යක්ෂ :වි.අ* |
| 7 | නිමල් ජයසුන්දර මහතා | 2016 ජුනි 01 | | වි.අ |
| 8 | යූ.එන්. ගුණවර්ධන මහතා | 2016 ජුනි 01 | | වි.නො.අ |
| 9 | සුරේෂ් පට්නේක් මහතා | 2018 මැයි 30 | | වි.නො.අ |
| 10 | ප්‍රමෝද් ජයින් මහතා | 2018 අගොස්තු 16 | | වි.නො.අ |

**වි.නො.අ** විධායක නොවන අධ්‍යක්ෂ
**වි.අ** විධායක අධ්‍යක්ෂ

වාර්ෂික වාර්තාවේ 53 සිට 54 දක්වා පිටුවල 2018 දෙසැම්බර් 31 දිනට එක් එක් අධ්‍යක්ෂවරයාගේ විස්තර මගින් සමාගමට අවශ්‍ය ක්‍රමෝපාය, කාර්යසාධනය, සම්පත් සහ ව්‍යාපාර පරිචයන් පිළිබඳ ගැටළුවලට ස්වාධීන තීරණ ලබාදීමේ පළපුරුද්ද සහ ප්‍රමාණවත් ධාරිතාව පෙන්වා දේ.

# ආයතනික
## පාලනය

◊ **අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහ තුළනය**

CPSTL හි අධ්‍යක්ෂ මණ්ඩලය තිරණ ගැනීමේ ඉහළම බලාධිකාරිය වන අතර එය අධ්‍යක්ෂවරුන් අට දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් තිදෙනෙක් විධායක අධ්‍යක්ෂවරුන් වන අතර පස්දෙනෙක් විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය.

| අධ්‍යක්ෂ | අධ්‍යක්ෂවරු ගණන |
|---|---|
| විධායක අධ්‍යක්ෂවරුන් (වි.අ) |  |
| විධායක නොවන අධ්‍යක්ෂවරුන් (වි.නො.අ) |  |

◊ **අධ්‍යක්ෂවරු පත්කිරීම**

සාංගමික ව්‍යවස්ථාවලියේ නියමයන්ට යටත්ව වාර්ෂික මහ සභා රැස්වීමක් තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරු පත් කෙරේ. අධ්‍යක්ෂධූරය සඳහා අපෙක්ෂකයින් සලකා බැලීමේදී, අනෙකුත් කරුණු අතර, පළපුරුද්ද පිළිබඳ පුළුලබව, ව්‍යාපාර සහ මූල්‍ය ගැටළු අවබෝධ කරගැනීම, මනා තීරණ ක්‍රියාත්මක කිරීමේ හැකියාව, විවිධත්වය. නායකත්වය, ජයග්‍රහන සහ ව්‍යාපාරය සහ කර්මාන්තයට බලපාන කරුණු පිළිබඳ පළපුරුද්ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලකිල්ලට ගනී.

◊ **වගකීම් බෙදාහැරීම**

සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂගේ කාර්යභාරයන් ඔවුන් අතර වගකීම් පැහැදිලිව බෙදමින් 2017 ජුනි 01 දින සිට වෙන් කර ඇති අතර ඒ තුළින් අධ්‍යක්ෂ මණ්ඩලය අතර වගවීම සහ බලය පිළිබඳ සහ ව්‍යාපාරය කරගෙන යාම සඳහා විධායකයේ වගකීම පිළිබඳ තුළනය සහතික කරයි.

සභාපති පී. එස්. විතානගේ මහතාගේ කාර්යභාරය වන්නේ ආයතනයේ කාර්යක්ෂමතාව සහ ව්‍යාපාර කාර්යයන් පවත්වා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබාදීමත්, සහ විධායක නොවන සහ විධායක අධ්‍යක්ෂවරු අතර සම්බන්ධතාවයේ අවංකකම සහ ඵලදායිත්වය සහතික කිරීමයි.

කළමනාකාර අධ්‍යක්ෂ, සංජීව විජේරත්න මහතාගේ කාර්යභාරය වන්නේ ක්‍රමෝපායික මඟ පෙන්වීම, ප්‍රතිපත්ති සකස් කිරීම, වරින් වර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ක්‍රියාපටිපාටිය මත පදනම් වී ආයතනයේ එදිනෙදා කටයුතු කළමනාකරණය කිරීමයි.

CPSTL හි මෙහෙයුම් උපවර්ගවලට බෙදිය හැකි අතර ඒවානම් කොලොන්නාව ස්ථාපනයේ මෙහෙයුම්, මුතුරාජවෙල පර්යන්තයේ මෙහෙයුම්, කොළඹ වරායේ ඉන්ධන පහසුකම් කාර්යාලයේ මෙහෙයුම් සහ දිවයින පුරා ලංකා තොග ගබඩාවල මෙහෙයුම්ය. මුතුරාජවෙල පර්යන්තයේ මෙහෙයුම් පර්යන්ත කළමනාකරු (මුතුරාජවෙල) විසින් මෙහෙයවයි. මෙහෙයුම් කළමනාකරු (අක්වෙරළ මෙහෙයුම්) කොළඹ වරායේ ඉන්ධන පහසුකමේ ප්‍රධානියා වේ. ලංකා තොග ගබඩා සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) ගේ අධීක්ෂණය යටතේ ගබඩා අධිකාරී විසින් මෙහෙයවනු ලබයි.

◊ **◊ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ පැමිණීම්**

විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පවත්වනු ලබන අතර විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවශ්‍ය විට සහ වේලාවේදී කැඳවනු ලැබේ. ජ්‍යේෂ්ඨ කළමනාකරුවන් ආරාධනාවන් මත රැ ස්වීම්වලට සහභාගි වේ.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් විධිමත් න්‍යාය පත්‍රයක් මත පවත්වන අතර අධ්‍යක්ෂවරුන් වෙත රැස්වීම්වලට පෙර ආයතනික කළමනාකරණය විසින් අදාළ සම්පූර්ණ පසුබිම් තොරතුරු ලබා දේ. 2018 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 11ක් පවත්වන ලදී.

මෙම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම පහත වගුවේ දැක්වේ;

| | අධ්‍යක්ෂවරයාගේ නම | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට පැමිණීම |
|---|---|---|
| 1 | අනුජ් ජයින් මහතා | 07/11 |
| 2 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය | 11/11 |
| 3 | ශ්‍යාම් බෝරා මහතා | 11/11 |
| 4 | රංධීර් සිංග් මහතා | 05/11 |
| 5 | ධම්මික රණතුංග මහතා | 08/11 |
| 6 | සංජීව විජේරත්න මහතා | 10/11 |
| 7 | නිමල් ජයසුන්දර මහතා | 11/11 |
| 8 | යූ.එන්. ගුණවර්ධන මහතා | 10/11 |
| 9 | සුරේෂ් පට්නේක් මහතා | 05/11 |
| 10 | ප්‍රමෝද් ජයින් මහතා | 06/11 |

* රංධීර් සිංග් මහතා අධ්‍යක්ෂධූරයෙන් ඉල්ලා අස් වූ අතර සුරේෂ් පට්නේක් මහතා 2018 මැයි 30 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කරන ලදී.

* අනුජ් ජයින් මහතා අධ්‍යක්ෂධූරයෙන් ඉල්ලා අස් වූ අතර ප්‍රමෝද් ජයින් මහතා 2018 අගෝස්තු 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කරන ලදී.

◊ **බලය බෙදීම සහ කමිටු**

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන් වූ කරුණුවලට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩලය එහි කමිටු සහ කළමනාකාරිත්වයට බලය බෙදා ඇත.

යම් විශේෂිත වගකීම් බෙදාහැර ඇති පහත සඳහන් කමිටු මගින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ;

**ආ) විගණන කමිටුව**

විගණන කමිටුව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන අතර සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. විගණන කමිටුව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කළ සමස්ත පාලන ක්‍රියාවලිය තුළ ක්‍රියාත්මක වන අතර එහි වගකීම් ඵලදායිව මුදාහැරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ.

# ආයතනික
## පාලනය (ඉතිරි කොටස)

CPSTL හි විගණන කමිටුව සාමාජිකයින් 02කින් සමන්විත වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති. විගණන කමිටුවේ සංයුතිය සහ එය විසින් කරගෙන යනු ලබන කාර්යයන් වාර්ෂික වාර්තාවේ 55 සිට 56 පිටුවේ ඉදිරිපත් කෙරේ.

**ආ) තොග සමාලෝචන කමිටුව**

තොග සමාලෝචන කමිටුව CPSTL කාර්ය මණ්ඩලය සහ CPC සහ LIOC නියෝජිතයින්ගේ සහභාගිත්වය ඇතිව සතිපතා පවත්වනු ලැබේ. තොග තත්ත්වය සමාලෝචනය කරන අතර ඉදිරි මාස තුන සඳහා අවශ්‍යතාවය කලින් සැලසුම් කරනු ලබයි. ආනයනය කළයුතු ප්‍රමාණය මෙරට අනාගත ඉල්ලුම, පිරිපහදු නිෂ්පාදන හැකියාව සහ ටැංකි ගබඩා ධාරිතාව සැලකිල්ලට ගැනීමෙන් පසු හඳුනාගනු ලබයි. විධිමත් සමීප නියාමනය රටතුල බාධා රහිත ඉන්ධන සැපයීම සහතික කිරීමට සංස්ථාවට හැකියාව ඇති කරයි.

**ඇ) තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව**

ආයතනයේ ක්‍රමෝපායික අරමුණුවලට සමගාමීව ප්‍රධාන තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති සමාලෝචනය, නියාමනය සහ ප්‍රමුඛ කිරීම සිදුකරන පරිපාලන මණ්ඩලය මෙයයි. මෙම කමිටුව CPC, LIOC හා CPSTL හි සාමාජිකයින්ගෙන් සමන්විත වන අතර සියලුම පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිලාභය සඳහා ප්‍රධාන තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගි වේ. එමෙන්ම CPSTL හි පොදු තොරතුරු තාක්ෂණ කේන්ද්‍රය සංවර්ධනය සහ පවත්වා ගැනීමට ධනාත්මකව දායක වේ.

**ඈ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව**

ප්‍රසම්පාදන කාර්යයන්හි විනිවිදභාවය සහතික කිරීම සඳහා සහ සැපයුම් ප්‍රමාද අවම කිරීමට මෙන්ම මූල්‍යමය වශයෙන් වඩාත් වාසිදායක සහ ගුණාත්මක වශයෙන් සමාගමට වඩාත් හොඳම සේවා සහ සැපයීම් ලබා ගැනිම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව සහ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව තුළින් නිෂ්පාදන, භාණ්ඩ, වැඩ සහ සේවා මිලදී ගැනීම සඳහා ජාතික ප්‍රසම්පාදන ආයතනය විසින් නිකුත් කළ මාර්ගෝපදේශ සමාගම අනුගමනය කරයි.

මෙම කමිටුව CPSTL හි සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ විසින් මෙහෙයවනු ලබන අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම් සහ ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යංශයේ නියෝජිතයින්ගෙන් සමන්විත වේ.

◊ **තොරතුරු සහ සම්පත් කරා අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රවේශය**

අධ්‍යක්ෂවරුන්ට තම රාජකාරි සහ වගකීම් ඵලදායිව කරගෙන යාම සඳහා කළමනාකරණය සහ ආයතනයේ තොරතුරු මෙන්ම සම්පත් කරා අසීමිත ප්‍රවේශය ඇත. විධායක කළමනාකරණය විසින් මෙහෙයුම් සැලසුම්, ක්‍රමෝපායන්ට අනුව ව්‍යාපාරයේ කාර්යසාධනය, මූල්‍ය කළමනාකරණය, පිරිවැයකරණය, වත්කම් කළමනාකරණය, අවදානම් කළමනාකරණය, අනුකූලතාව සහ නියාමන වෙනස්වීම් ඇතුළු කරුණු පිළිබඳ ඉදිරිපත්කිරීම් සිදුකරයි. අවශ්‍යයයි කල්පනා කරන අවස්ථාවලදී අධ්‍යක්ෂවරුන්ට සමාගමේ වියදමින් ස්වාධීන වෘත්තිය උපදෙස් සහ තොරතුරු සඳහා ප්‍රවේශය ඇත.

**සමාගම් ලේකම්වරු**

අධ්‍යක්ෂ මණ්ඩලයට එහි රාජකාරි සහ වගකීම් මුදාහැරීමට මග පෙන්වමින් සහ ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිචයන් ප්‍රවර්ධනය කරමින් එකවුන්ටින් සිස්ටම්ස් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් ලේකම්වරු ලෙස කටයුතු කරයි. සියලුම අධ්‍යක්ෂවරුන්ට සමාගමේ ලේකම් වෙත ප්‍රවේශය ඇත. සමාග මේ ලේකම් වාර්තා සහ අනෙකුත් අදාළ වාර්තා තබාගනිමින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අනෙකුත් අනු-කමිටු රැස්වීම් වේලාවන් සම්බන්ධීකරණය කරයි.

■ **සහතික කිරීම සහ පාලනය**

**මූල්‍ය වාර්තාකරණය**

මූල්‍ය ප්‍රකාශ සත්‍ය සහ සැබෑ ලෙස ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී. මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති එනම් ශ්‍රීලංමුරේ සහ ශ්‍රීලංගිප්‍රවලට අනුකූලව සකස් කරනු ලබන අතර විගණන කමිටුව විසින් මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත්කිරීමට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, යෝග්‍යතාවය සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම් සහ වැදගත් තීන්දුමය කරුණුවලට අනුකූලවීම ඇතුළුව කළමනාකරණය සහ බාහිර විගණකවරුන් සමඟ සමාලෝචනය කර සාකච්ඡා කර ඇත

.

**විනිවිදභාවය සහ අනුකූලතාව**

සියලුම ගනුදෙනුවලදී විනිවිදභාවය පවත්වා ගැනීමට සහ නීති හා රෙගුලාසිවලට අනුකූලවීම සහතික කිරීමට මෙන්ම සදාචාර ප්‍රමිති, කම්කරු හා මානව හිමිකම්, සහ සමාගමේ ප්‍රතිපත්ති ආරක්ෂා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී.

- 1961 අංක 28 දරන ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථා පනත සහ 1971 අංක 38 දරන මූල්‍ය පනතේ විධිවිධානවලට අනුකූලව සමාගමේ අභ්‍යන්තර පාලන ක්‍රමය සැලසුම් කෙරේ.
- 1971 අංක 38 දරන මූල්‍ය පනතට අනුකූලව, විගණකාධිපති විසින් ආයතනයේ අභ්‍යන්තර විගණනය සිදුකරන අතර මූල්‍ය ප්‍රකාශ වාර්ෂිකව ප්‍රකාශයට පත්කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරයි. වගවීම සහතික කිරීම සඳහා, ආයතනය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKAS) සහ අනෙකුත් අදාළ රෙගුලාසිවලට අනුකූල වේ.

◊ **අභ්‍යන්තර පාලනය**

ඵලදායිතාවය අත්කරගැනීම සහ මෙහෙයුම්වල කාර්යක්ෂමතාව, මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසීබව සහ අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල බව සහ අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් සාධාරණ සහතික කිරීම ලබාදීමට යහපත් සහ ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමයක් විධිමත් ලෙස ස්ථාපිත කර පවත්වාගෙන යන බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ. ඉන් මූල්‍ය සහ ගිණුම්කරණ තොරතුරුවල අවංකකම තහවුරු කරන අතර, මෙහෙයුම් සහ ලාභදායිතා ඉලක්ක සපුරාලමින් ආයතනය තුළ කළමනාකරණ ප්‍රතිපත්ති බාධා රහිතව ඉදිරියට යාමට ඉඩ සලසයි.

යම් අභ්‍යන්තර පාලන ක්‍රමයක් මගින් සාධාරණ සහතික කිරීමක් පමණක් නොව සාධාරණ කාලසීමාවක් තුළ දෝෂ සහ අක්‍රමිකතා ඉදිරිපත් කර සොයා අනාවරණය කරන බවද සහතික කරනු ලබන බව සඳහන් කිරීම වැදගත්ය.

# ආයතනික
## පාලනය

අභ්‍යන්තර විගණන කාර්යය විසින් ආයතනය CPSTL හි ස්ථාපිත අභ්‍යන්තර පාලන ක්‍රමය තුළ කාර්යක්ෂමව ක්‍රියාත්මක වන බව සහතික කරයි.

◊ **අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණනය අභ්‍යන්තර විගණන අංශය විසින් පවත්වාගෙන යන අතර එය කළමනාකාරිත්වයෙන් ස්වාධීන වේ. අභ්‍යන්තර විගණනයක පරමාර්ථය වන්නේ ආයතනයක සියලුම කටයුතු තුළ දැඩි පාලනය තබා ගැනීමයි. කළමනාකාරිත්වයට මූල්‍ය වාර්තාවල සත්‍යතාවය සහ ආයතනයේ මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය සහතික කිරීම අවශ්‍ය වේ. අභ්‍යන්තර විගණනයක් මෙම කරුණු දෙක ස්ථාපිත කිරීමට සහය වේ. ඒ තුළින් විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් දක්වා ඇති ක්‍රියාපටිපාටි, නීති සහ රෙගුලාසිවලට අනුකූලව ආයතනය තුළ පවත්වා ගන්නා බව සහතික කරයි.

අභ්‍යන්තර විගණන අංශයේ විෂයපථය පහත පරිදි වේ;

- සියලුම ව්‍යාපාර ගනුදෙනු සඳහා පවත්නා නීති සහ රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාත්මක කිරීමට පෙර විධිමත්ව බලය ලබා දෙන බව සහතික කිරීම

- කාර්යක්ෂම කළමනාකරණය සඳහා සියලුම ගිණුම්කරණ තොරතුරු SAP හි විධිමත්ව වාර්තාකරන බව මෙන්ම මූලික වාර්තා නිවැරදිව පවත්වාගන්නා බව සහ අදාළ සංඛ්‍යාලේඛන සහ පාලන දත්ත විධිමත්ව සැලසුම් කරන බව සහතික කිරීම
- මූල්‍ය ගිණුම්කරණ ප්‍රකාශවලින් ආයතනයේ සත්‍ය සහ සැබෑ තත්ත්වය අනාවරණය කරන බව සහතික කිරීම
- දැනට ක්‍රියාත්මක අභ්‍යන්තර පාලන ක්‍රමයේ කාර්යක්ෂමතාව තක්සේරු කිරීම.
- සමාලෝචනය සහ ඇගයීම සඳහා පද්ධති පදනම් ප්‍රවේශය යොදා ගැනීම;
- දෙපාර්තමේන්තුව විසින් කරගෙන යන වැඩසටහන් සහ අනෙකුත් මෙහෙයුම්වල ප්‍රමාණය ඇගයීමට කළමනාකාරිත්වය විසින් භාවිතා කරන මිනුම් ඇතුළුව දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් පාලනය කිරීමට අදහස් කරන සියලුම පද්ධති සහ ක්‍රියාපටිපාටිවල සැලැස්ම සහ මෙහෙයුම ප්‍රතිපත්ති පරමාර්ථ අත්කර ගැනීමේදී සාර්ථක වී ඇත.
- නීතිකරණ සහ දක්වා ඇති වෙනත් අවශ්‍යතා සහ කළමනාකරණ සැලසුම්, ක්‍රියාපටිපාටි සහ ප්‍රතිපත්තිවලට අනුකූලතා මට්ටම.
- වත්කම් අත්කර ගැනීම, බැහැරකිරීම සහ ආරක්ෂා කිරීම සහ වංචාව, දුරාචාරය සහ අක්‍රමිකතාවලින් ඇතිවන පාඩු ඇතුළුව අලාභ.
- වත්කම් ආර්ථික සහ කාර්යක්ෂමව භාවිතා කිරීම සහ නාස්තිය අවම කිරීම සඳහා වැඩපිළිවෙල.
- තීරණ ගැනීම සඳහා සහ වගවීම සඳහා ලබාදෙන තොරතුරුවල ප්‍රමාණවත්බව, විශ්වාසිබව සහ අවංකකම සහ මෙම තොරතුරු භාවිතා කරන ප්‍රමාණය.

**2017 දි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කළ ආයතනික පාලනය පිළිබඳ මනා පරිචය සංග්‍රහය සමග අනුකූලතාවය**

| යොමු අංකය | අවශ්‍යතාව | අනාවරණය | අනුකූලතාව |
|---|---|---|---|
| A | අධ්‍යක්ෂවරු | | |
| A.1 | අධ්‍යක්ෂ මණ්ඩලය | | |
| A1.1 | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම, සහ තොරතුරු සැපයීම අවම වශයෙන් කාර්තුවකට එක් වරක් | පාලනය සහ අනුකූලතාව - අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම | ඔව් |
| A1.2 | අධ්‍යක්ෂ මණ්ඩලය පහත වගකීම් භාරගනිමින් ව්‍යවසායකත්වමය නායකත්වය ලබාදිය යුතුය;<br>• ක්‍රමෝපාය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම<br>• ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ දක්ෂතාව සහ අනුප්‍රාප්තිය<br>• තොරතුරුවල අවංකකම, අභ්‍යන්තර පාලන, ව්‍යාපාර අඛණ්ඩතාවය සහ අවදානම් කළමනාකරණය<br>• නීති, රෙගුලාසි සහ සදාචාර ප්‍රමිතිවලට අනුකූලතාව<br>• තීරණ ගැනීමේ දි සියලුම පාර්ශ්වකරුවන්ගේ යහපත සලකාබැලීම<br>• තිරසාර ව්‍යාපාර සංවර්ධනය<br>• සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීම සහ මූල්‍ය රෙගුලාසිවලට අනුකූලවීම | පාලනය සහ අනුකූලතාව - අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම | ඔව් |
| A1.3 | අධ්‍යක්ෂ මණ්ඩලය සාමූහිකව සහ අධ්‍යක්ෂවරුන් තනිතනිව රටේ නීතියට අනුකූලව කටයුතු කළ යුතු අතර, අවශ්‍යනම් ස්වාධීන වෘත්තිය උපදෙස් ලබාගත යුතුය | පාලනය සහ අනුකූලතාව - අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම | ඔව් |

# ආයතනික
## පාලනය (ඉතිරි කොටස)

| යොමු අංකය | අවශ්‍යතාව | අනාවරණය | අනුකූලතාව |
|---|---|---|---|
| A1.4 | සියලුම අධ්‍යක්ෂවරුන්ට සමාගමේ ලේකම්ගේ උපදෙස් හා සේවාවන් සඳහා ප්‍රවේශය ඇත | පාලනය සහ අනුකූලතාව - අනුකූලතාව | ඔව් |
| A1.5 | සියලුම අධ්‍යක්ෂවරුන් ක්‍රමෝපාය, කාර්යසාධනය, සම්පත් සහ ව්‍යාපාර චර්යාව පිළිබඳ ස්වාධීන විනිශ්චයක් ගත යුතුය | අධ්‍යක්ෂවරුන්ට අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ කටයුතු සම්බන්ධව ස්වාධීනව ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට සමාන අවස්ථා ඇත | ඔව් |
| A1.6 | සෑම අධ්‍යක්ෂවරයෙක්ම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කරුණු පිළිබඳ ප්‍රමාණවත් කාලය කැපකළ යුතුය | පාලනය සහ අනුකූලතාව - අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ පැමිණීම | ඔව් |
| A.2 | සභාපති හා ප්‍රධාන විධායක නිලධාරියා | | |
| A.2.1 | සභාපති හා ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යභාරයන් එක් පුද්ගලයෙක්ට ප්‍රමාණ කිරීම | අදාළ නැත | අදාළ නැත |
| A.3 | සභාපතිගේ කාර්යභාරය | | |
| A.3.1 | සභාපති විධිමත් ආකාරයෙන් අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු පවත්වා ගත යුතු අතර පහත කරුණු සහතික කළ යුතුය,<br>• ඵලදායි සහභාගිත්වය සහ අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය<br>• විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් අතර බලය තුලනය<br>• සලකා බැලිම යටතේ පවත්නා කරුණු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ අදහස් නිශ්චය කිරීම<br>• සමාගමේ කටයුතු පිළිබඳ සම්පූර්ණ පාලනය අධ්‍යක්ෂ මණ්ඩලය සතුවන අතර සියලුම පාර්ශ්වකරුවන් සඳහා එහි බැඳීම පිළිබඳ අවධානය යොමු කළ යුතුය | | ඔව් |
| A.4 | මූල්‍ය නිපුනත්වය ලබාගැනිම | | |
| A.4.1 | අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍යමය කරුණු පිළිබඳ මඟ පෙන්වීම් ලබාදීමට ප්‍රමාණවත් මූල්‍ය නිපුනත්වය ලබාගතහැකි බවට සහතික කළ යුතුය | අපගේ නායකත්වය - අධ්‍යක්ෂ මණ්ඩලය | ඔව් |
| A.5 | අධ්‍යක්ෂ මණ්ඩල තුලනය | | |
| A.5.1 | අධ්‍යක්ෂ මණ්ඩලයේ අවම වශයෙන් සාමාජිකයින් 2ක් හෝ තුනෙන් එකක් යන දෙකෙන් වැඩි ගණන වාර්ෂික මහ සභා රැස්වීම අවසානයට පෙර විධායක නොවන අධ්‍යක්ෂවරු විය යුතුය. මෙම අනුපාතයට යම් වෙනස්වීම් දින 90ක් තුළ නිවැරදි කරගත යුතුය. | පාලනය සහ අනුකූලතාව අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය සහ අධ්‍යක්ෂ මණ්ඩල තුලනය | ඔව් |
| A.6 | තොරතුරු සැපයීම | | |
| A.6.1 | කළමනාකරණය විසින් සුදුසු හා කාලීන තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාදිය යුතුය | පාලනය සහ අනුකූලතාව අධ්‍යක්ෂ මණ්ඩලයට තොරතුරු සහ සම්පත් කරා ප්‍රවේශය | ඔව් |
| A.6.2 | රැස්වීමක් සඳහා අවශ්‍ය වාර්තා, න්‍යාය පත්‍ර සහ පත්‍රිකා රැස්වීමට පෙර අවම වශයෙන් දින හතකදී ලබාදිය යුතුය | පාලනය සහ අනුකූලතාව අධ්‍යක්ෂ මණ්ඩලයට තොරතුරු සහ සම්පත් කරා ප්‍රවේශය | ඔව් |
| A.7 | මණ්ඩලයට පත්විම | | |
| A.7.1 | අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරු පත්කිරීම සඳහා විධිමත් සහ විනිවිද ක්‍රියාපටිපාටියක් තිබිය යුතුය<br>සභාපති හා සාමාජිකයින් වාර්ෂික වාර්තාවේ අනාවරණය කළ යුතුය | පාලනය සහ අනුකූලතාව අධ්‍යක්ෂ මණ්ඩල සංයුතියට පත්වීම | ඔව් |

# ආයතනික
## පාලනය (ඉතිරි කොටස)

| යොමු අංකය | අවශ්‍යතාව | අනාවරණය | අනුකූලතාව |
|---|---|---|---|
| B | අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය | | |
| B.1 | විධායක සහ අධ්‍යක්ෂ පාරිශ්‍රමිකය පිළිබඳ සංවර්ධන ප්‍රතිපත්තිය සඳහා ක්‍රියාවලි ස්ථාපිත කිරීම. | | ඔව් |
| B.2 | පාරිශ්‍රමිකයේ මට්ටම සහ සකස් කිරීම | | ඔව් |
| B.3 | ගෙවන ලද එකතුකළ අධ්‍යක්ෂ මණ්ඩල පාරිශ්‍රමිකය අනාවරණය කිරීම | මූල්‍ය තොරතුරු - විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | ඔව් |
| C | පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධතා | | |
| C.1 | වාර්ෂික මහ සභා රැස්වීම (AGM) ප්‍රයෝජනවත් ලෙස භාවිතය සහ පොදු රැස්වීම් පැවැත්වීම | | ඔව් |
| C.2 | පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනය | කාලීන තොරතුරු බෙදාහැරීම පිණිස වෙනත් කොටස් හිමියන් දෙදෙනෙක් සමඟ සමාගමට විධිමත් මාර්ග ඇත | ඔව් |
| C.3 | අධ්‍යක්ෂවරු විසින් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ඇතුළුව සියලුම යෝජිත වැදගත් ගනුදෙනු පාර්ශ්වකරුවන්ට අනාවරණය කළ යුතුය | | ඔව් |
| D | වගවීම සහ විගණනය | | |
| D.1 | මූල්‍ය වාර්තාකරණය | | ඔව් |
| D1.1.1 | අධ්‍යක්ෂවරු විසින් අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ මූල්‍ය ප්‍රකාශන ඇතුළුව වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය | | ඔව් |
| D.1.2 | අධ්‍යක්ෂවරු විසින් අතුරු, වෙනත් මිල සංවේදී වාර්තා සහ වාර්තා නියාමකයින් වෙත ඉදිරිපත් කළ යුතුය | | ඔව් |
| D1.3 | මූල්‍ය වාර්තාකරණය<br>- අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් පිළිබඳ ප්‍රකාශය<br>- අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය | අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව<br>විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව | ඔව් |
| D1.4 | වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂවරුන්ගේ පහත ප්‍රකාශවලින් සමන්විත විය යුතුය,<br>• සමාගම කිසිදු නීති විරෝධි කටයුතුවල යෙදී නොමැති බව<br>• සමාගම සම්බන්ධ කොන්ත්‍රාත්වල අධ්‍යක්ෂවරුන්ගේ සියලූම වැදගත් බැඳීම්<br>• පාර්ශ්වකරුවන්ට සමානව සලකන බව<br>• ව්‍යාපාරයට අඛණ්ඩ පැවැත්මක් ඇති බව<br>• අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණය පිළිබඳ සමාලෝචනය | පාලනය සහ අනුකූලතාව<br>- අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව | ඔව් |
| D.1.5 | වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂවරුන්ගේ වගකිම පිළිබඳ ප්‍රකාශයකින් සමන්විත විය යුතුය | පාලනය සහ අනුකූලතාව<br>- අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව | ඔව් |
| D.1.6 | වාර්ෂික වාර්තාව "කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණයකින්" සමන්විත විය යුතුය | කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ | ඔව් |
| D.1.7 | ප්‍රාග්ධනයේ දැඩි අලාභ | අදාළ නැත | අදාළ නැත |
| D.1.8 | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂික වාර්තාවේ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රමාණවත්ව සහ නිවැරදිව අනාවරණය කළ යුතුය | මූල්‍ය තොරතුරු - සටහන 20 : සම්බන්ධිත පාර්ශ්ව අනාවරණය | ඔව් |

# ආයතනික
## පාලනය (ඉතිරි කොටස)

| යොමු අංකය | අවශ්‍යතාව | අනාවරණය | අනුකූලතාව |
|---|---|---|---|
| D.2.1 | අධ්‍යක්ෂවරුන් විසින් අවම වශයෙන් වාර්ෂිකව සමාගම මුහුණපාන අවදානම පිළිබඳ සහ අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායිත්වය පිළිබඳ සමාලෝචනයක් පැවැත්විය යුතුය | පාලනය සහ අනුකූලතාව - විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව | ඔව් |
| D.2.2 | අධ්‍යක්ෂවරුන් විසින් සමාගම මුහුණපාන අවදානම් විස්තර කළ යුතු අතර ඒවා පාලනය කර අවම කරන ආකාරය පිළිබඳ පැහැදිලි කළ යුතුය | පාලනය සහ අනුකූලතාව - අවදානම් කළමනාකරණය | ඔව් |
| D.2.3 | සමාගම්වලට අභ්‍යන්තර විගණන කාර්යයක් තිබිය යුතුය | පාලනය සහ අනුකූලතාව - සහතිකවීම සහ පාලනයන්: අභ්‍යන්තර විගණනය | ඔව් |
| D.2.4/ D.2.5 | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යහපත් අභ්‍යන්තර පාලන ක්‍රම පවත්වාගත යුතු අතර අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනවල ක්‍රියාවලිය සහ ඵලදායිත්වය පිළිබඳ සමාලෝචන කරගෙන යාමට සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලේඛනගත කිරීමට විගණන කමිටුවක් අවශ්‍ය ය. | පාලනය සහ අනුකූලතාව - සහතිකවීම සහ පාලනයන්: අභ්‍යන්තර පාලනයන් අභ්‍යන්තර විගණනය විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව | ඔව් |
| D.3 | විගණන කමිටුව | | |
| D.3.1 | විගණන කමිටුවක අවම වශයෙන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු දෙනෙකුගෙන් හෝ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය යුතු අතර එහි බහුතරය ස්වාධීන විය යුතුය | පාලනය සහ අනුකූලතාව - විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව | ඔව් |
| D.3.2 | විගණන කමිටුවට එහි බලය සහ රාජකාරී පිළිබඳ පැහැදිලිව දක්වා ඇති ලිඛිත විෂයපථයක් තිබිය යුතුය | පාලනය සහ අනුකූලතාව - විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව | ඔව් |

# අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය සමාගම තුළ ක්‍රමෝපායික ප්‍රමුඛතාවක් වන අතර ව්‍යාපාරය සඳහා වටිනාකම ලබාදීමේදී අත්‍යවශ්‍ය ලෙස සලකනු ලබයි. පාලනය කළ පරිසරයක් තුළ වර්ධන සැලසුම් ලබාදීමට සමාගමට සහයවන අවදානම් කළමනාකරණ හැකියාවන් සහ අභ්‍යන්තර පාලනය පිළිබඳ විධිමත් ක්‍රම CPSTL විසින් අඛණ්ඩව ගොඩ නගයි.



යහපත් අවදානම් කළමනාකරණ පරිචයන් දිගුකාලීන වර්ධනය සඳහා තීරණාත්මක බව CPSTL දැඩිව විශ්වාස කරයි. සමාගමේ පරමාර්ථය වන්නේ අඛණ්ඩතා පැවැත්මක් ලෙස මෙහෙයුම්වලට අහිතකරව බලපෑ හැකි සියලුම සාධක ඉහලයාමේ සහ පහළයාමේ හැකියාව සැලකිල්ලට ගනිමින් ආයතනයේ සියලුම කටයුතු සඳහා උපරිම තිරසාර වටිනාකමක් එකතු කිරීමයි. අවදානම් කළමනාකරණය අඛණ්ඩ සහ සංවර්ධන ක්‍රියාවලියක් වන අතර, එය ආයතනික ක්‍රමෝපාය සහ එහි ක්‍රියාත්මක කිරීම තුළ වැදගත් භූමිකාවක් ඉටු කරයි.

අවදානම් කළමනාකරණ ක්‍රමෝපාය සමාගමේ ආයතනික පාලනය, කළමනාකරණ තීරණ සහ ව්‍යාපාර ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය කොටසකි. ඒකාබද්ධ අවදානම් කළමනාකරණය ඉහළ සිට පහළ දක්වා මෙහෙයුම්වල ඵලදායි ක්‍රියාකාරිත්වය සඳහා වැදගත් වේ. ව්‍යාපාර සැලසුම් කිරීම සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියට අවදානම් කළමනාකරණ වැඩසටහන් ඇතුළත් කිරීම තුළින් සැලසුම් කිරීම, වාර්තාකරණය, විගණනය සහ කළමනාකරණ තොරතුරු පද්ධති අතර ඵලදායි ඒකාබද්ධ කිරීමක් ලබා දෙනු ඇත.

සමාගමේ ව්‍යාපාර අවදානම් සඳහා සාධක ගණනාවක් බලපාන අතර ඒවා සියල්ලම සමාගමේ පාලනය යටතේ නොමැත. ආයතනික කීර්තිනාමය, ආරක්ෂාව, පරිසරය, සෞඛ්‍යය හා ආරක්ෂිත ගැටළු, නිෂ්පාදනවල තත්ත්වය සහ තොරතුරු තාක්ෂණය වැනි සාමාන්‍ය ව්‍යාපාර අවදානම් නිරාවරණ සමඟ බාහිරින් ඇතිවන අභියෝග සමාගමේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ කොටසක් ලෙස අඛණ්ඩව සමාලෝචනය කෙරේ.

### අවදානම් පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලයට ක්‍රමෝපායික මඟපෙන්වීම් ලබාදීම සහ අවදානම් පාලනය කිරීම සඳහා අවසාන වශයෙන් වගකීම ඇත. අවදානම් සඳහා පැහැදිලි වගකීමක් සහිතව අවදානම් කාලීනව හඳුනාගැනීම පහසු කිරීමට අවදානම් පාලන ව්‍යුහයක් ඔවුන් විසින් ක්‍රියාවට නංවා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය, විගණන කමිටුව සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සමාගම තුළ කළමනාකරුවන්ට සහ සේවකයින්ට මඟ පෙන්වමින් සහ සහයවෙමින් අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය මෙහෙයවනු ලබයි.

**අධ්‍යක්ෂ මණ්ඩලය**

අවදානම් රුචිය සැකසීම, අවදානම් ක්‍රමෝපාය සන්නිවේදනය සහ අවදානම් ඵලදායි ලෙස කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිපත්ති අනුමත කිරීම සඳහා වගකීම අවසාන වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ.

**විගණන කමිටුව**

මෙම කමිටුව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන වාර්තා අගයමින් අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණත්වය සමාලෝචනය කරන අතර බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය සහ කාර්යසාධනය ඇගයීමට ලක් කරයි. එමෙන්ම මෙම කමිටුව එක් එක් දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරන අවදානම් සමාලෝචනය කරන අතර සමාගම විසින් ගනු ලබන පියවර අනුමත කරයි. එබැවින් එකී අවදානමෙන් ඇතිවන බලපෑම පාලනය කර අවම කර ගත හැක.

**ක්‍රියාත්මක ප්‍රධානීන්**

කාර්ය ප්‍රධානීන් ඔවුන්ට අයත් දෙපාර්තමේන්තුව තුළ අවදානම් පාලනය සඳහා සහ අවදානම් අවම කිරීමට සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක බවට සහ ඒවා සමාගමේ අවදානම් කළමනාකරණ ප්‍රමිති සහ අභ්‍යන්තර පාලන ක්‍රම සමඟ අනුකූල වන බවට සහතික කිරීම සඳහා මූලිකවම වගකීමට බැඳී සිටී.

**බාහිර සහ අභ්‍යන්තර විගණකවරු**

අභ්‍යන්තර විගනකවරුන්ගේ කාර්යභාරය වන්නේ ආයතනයේ අවදානම් කළමනාකරණය පාලනය සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ඵලදායිව ක්‍රියාත්මක වන බවට ස්වාධීන තහවුරු කිරීමක් ලබාදීමයි.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සහ සමාගමේ මූල්‍ය තත්ත්වය සහ කාර්යසාධනය පිළිබඳ සාධාරණ සහ සත්‍ය නියෝජනය පිළිබඳ යුක්ති සහගත සහතික කිරීමක් ලබාදීමට අභ්‍යන්තර විගනකවරු වගකීමට බැඳී සිටී.

# අවදානම්
## කළමනාකරණය (ඉතිරි කොටස)

**අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය**
අවදානම් කළමනාකරණය යනු අඛණ්ඩ ක්‍රියාවලියක් වන අතර, එය සමාගමේ කාර්යසාධන සමාලෝචනයට සහ තීරණ ගැනිමේ ක්‍රියාවලියට ඇතුළත් කර ඇත. අවදානම් කළමනාකරණයේ අරමුණ වන්නේ සිදුවිය හැකි ප්‍රශ්න සිදුවිමට පෙර හඳුනා ගැනිම වන අතර ඒ තුළින් අවදානම් මෙහෙයවීමේ කටයුතු අවශ්‍ය පරිදි සැලසුම් කර ක්‍රියාත්මක කිරීම හෝ අරමුණු අත්කර ගැනිම කෙරෙහි බලපැම් අවම කිරීමට කටයුතු කිරිමයි. අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පියවර හතරකින් සමන්විත වේ.

**01. අවදානම් ඇගයීම**
ව්‍යාපාරයට අභ්‍යන්තර හා බාහිර පරිසරයෙන් ඇතිවන වර්තමාන, අනාගත සහ සිදුවිය හැකි අවදානම් හඳුනාගැනීම, විශ්ලේෂණය කිරිම සහ ඇගයීම පිළිබඳ ක්‍රමානුකූල ක්‍රියාවලියකි.

**02. අවදානම් පිළියම/ අවදානම් අවමකිරීම**
අවදානම් කළමනාකරණය යනු අවදානමක් අවම කිරීමට ගන්නා ක්‍රියාමාර්ගයකි. සමාගම විසින් අවදානම වලක්වාගැනිම, මාරුකිරීම, අඩුකිරීම හෝ පිලිගැනීම සිදුකළද, එය අවදානමේ ස්වභාවය සහ ඇගයීම මත රඳා පවතී.

**03. නියාමනය සහ සමාලෝචනය**
අවදානම නියාමනය යනු ඉදිරියට යන අඛණ්ඩ ක්‍රියාවලියක් වන අතර ඒ තුළින් ක්‍රියාත්මකව පවත්නා අවදානම් කළමනාකරණ ක්‍රමෝපායන්ට අවශ්‍ය ගැලපීම් හඳුනාගනී.

**04. සන්නිවේදනය සහ උපදේශනය**
සන්නිවේදනය සහ උපදේශනය අවදානම කළමනාකරණය තුළ වෙනස් අවස්ථාවක් නොවන නමුත් සමස්ත ක්‍රියාවලිය තුළ ක්‍රියාත්මක වේ. ආයතනයක කාර්ය මණ්ඩලයේ සැම දෙනාම තම කාර්යභාරයට අනුව ආයතනයේ අවදානම් ක්‍රමෝපාය, අවදානම් ප්‍රමුඛතා සහ අදාළ වගකිම් පිළිබඳ දැනුවත් බවට ආයතනයක් විසින් සහතික කළ යුතුය. අනෙකුත් කරුණු අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්වලට යහපත් අභ්‍යන්තර තොරතුරු සහ සන්නිවේදනය ක්‍රියාවලිය සහතික කිරිම සහ අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය පිලිබඳ බාහිර ප්‍රචාරණය සඳහා වගකීම ඇතුළත්ය.



# අවදානම්
## කළමනාකරණය (ඉතිරි කොටස)

### අවදානම් කළමනාකරණයට සමාගමේ ප්‍රවේශය

අවදානම විධිමත්ව හඳුනාගෙන පාලනය සහ අවම කිරීම සඳහා පහත සාරාංශ කර ඇති පරිදි දෙයාකාර ආරක්ෂක ආදර්ශ සමාගම යොදා ගනී.

| 1 පෙළ ආරක්ෂක උපක්‍රමය |
|---|
| **කාර්යය ප්‍රධානීන්** |
| කාර්ය ප්‍රධානීන් ඔවුන්ගේ කාර්යයන්ට අදාළ වන අවදානම් හඳුනාගැනීම, මැනීම, නියාමනය, වාර්තාකරණය සහ කළමනාකරණය සඳහා වගකීමට බැඳී සිටී. |
| සමාගම අභ්‍යන්තර පාලනය පිළිබඳ විස්තීර්ණ ක්‍රමයක් නිර්මාණය කර ඇති අතර ඒ තුළින් අදාළ අවදානම් සොයාගැනීම, කළමනාකරණය කිරීම සහ වැළැක්වීම සඳහා අංශ ප්‍රධානීන්ට හැකියාව ඇති කරමින් සියලූම ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ආවරණය කරයි. |

| 2 පෙළ ආරක්ෂක උපක්‍රමය |
|---|
| **අභ්‍යන්තර විගණනය සහ බාහිර විගණනය** |
| අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලන රාමුවේ ප්‍රමාණතාව සහ ඵලදායිත්වය සහ විගණන කමිටුවේ වාර්තාකරණ නිදහස පිළිබඳ ස්වාධීන තක්සේරු කිරීමක් අභ්‍යන්තර විගණනය ලබා දේ. |
| බාහිර විගණකවරුන් ස්වාධීන ආයතනයක් වන අතර ඔවුන්ගේ වගකීම වන්නේ සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සහ සාධාරණ සහතික කිරීමක් ලබාදීමයි. |

### සමාගමට බලපාන මූලික අවදානම් පිළිබඳ දළ විශ්ලේෂණය

| අවදානම | මූලික ධාවකයින් | අවම කිරීමේ ක්‍රමෝපායන් |
|---|---|---|
| **ස්වභාවික උවදුරු සහ අවිනිශ්චිතතා** | | |
| අපගේ මෙහෙයුම්වලට අපගේ පාලනයෙන් තොර ස්වාභාවික ආපදා සහ වෙනත් සිදුවීම් බලපානු ලැබේ.  | • ගංවතුර, නායයාම් සහ දරුණු කුණාටුවලින් බාධා<br>• ත්‍රස්තවාදී ක්‍රියා.  | • රක්ෂණ ආවරණ හඳුනාගත් සමහර අවදානම් වලට ලබාගැනීම.<br>• මානව පිවිතයට මෙන්ම ව්‍යාපාරයට එකී සිදුවීම්වල හානිකර බලපෑම අවම කිරීම සඳහා සේවකයින් ප්‍රමාණවත්ව පුහුණු කිරීම.<br>• මෙම සමාගම ආර්ථිකයේ මර්මස්ථානයක් වන බැවින් ඉහළ ආරක්ෂිත ක්‍රියාමාර්ග හා පාලනයන් ක්‍රියාත්මක කිරීම. |
| **මෙහෙයුම් අවදානම** | | |
| මෙහෙයුමට අදාළ උවදුරු සමාගමට බලපෑ හැකිය.   | • වෘත්තිය සමිති වැඩවර්ජන අනවශ්‍ය බාධාවන් ඇති කරයි.<br>• අනපේක්ෂිත කාන්දුවීම් /නල මාර්ගවලට හානිවීම් මෙහෙයුම් ප්‍රමාදයට හේතු වේ.<br>• සැපයීම්, යටිතල පහසුකම් හෝ මිනා සංවිධානයේ බාධාවන්.<br>• අනතුරු<br>• විශාල ප්‍රමාණයේ ගිනි | • අවදානම් තර්ජනයක් ඇතිවීමට පෙර මැසිවිලි විසඳීමට අවස්ථාව උදාකරදීම.<br>• කාන්දුවීම් / හානිවීම් අවම කිරීම පිණිස නළමාර්ග විධිමත්ව සේවා කිරීම සහ නඩත්තු කිරීම.<br>• හානිකර බලපෑම අවම කිරීම සඳහා සේවකයින් ප්‍රමාණවත්ව පුහුණු කිරීම.<br>• CPSTL අභ්‍යන්තර ගිනි සේවා ඒකකයක් ස්ථාපිත කර ඇත. |

# අවදානම්
## කළමනාකරණය (ඉතිරි කොටස)

| අවදානම | මූලික ධාවකයින් | අවම කිරීමේ ක්‍රමෝපායන් |
|---|---|---|
| **තරඟකාරී අවදානම** | | |
| වඩා අඩු මිලකට සැසැදිය හැකි ගබඩා පහසුකම සමඟ අපගේ පාරිභෝගිකයින්ට සැපයීමට හැකි වෙනත් යම් අනෙකුත් පර්යන්ත සමාගම්වල තරඟය. | • CPSTL හි කොටස්හිමියන් දෙදෙනෙක් වන අනෙකුත් පර්යන්ත සමාගම් (CPC) LIOC) දෙකේ තරඟයට අපි මුහුණ දෙමු. | • බවුසර් සමුදාය වැඩිකිරීම.<br>• ගබඩා පහසුකම වැඩිකිරීම හෝ වෙනත් ආකාරයෙන් දැනට පවත්නා පර්යන්ත පුළුල් කිරීම.<br>• නිවැරදි දක්ෂතා සහිත සේවකයින් බඳවා ගැනීම පුහුණු කිරීම සහ මෙහෙයවීම මගින් ඉහළ සේවා ප්‍රමිති පවත්වා ගැනීම.<br>• අපගේ තරඟකරුවන්ට ඉදිරියෙන් සිටීම සඳහා, නව තාක්ෂණය යොදා ගනිමින් වෙනස්වන පාරිභෝගික වරණයන් සපුරාලීම සඳහා පර්යේෂණ හා සංවර්ධනය තුළින් නව්‍යකරණ කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කිරීම. |
| **නෛතික අවදානම** | | |
| අපගේ මෙහෙයුම් ශ්‍රී ලංකා නීති සහ නිෂ්පාදන තත්ත්ව පිරිවිතරවලට අදාළ රෙගුලාසිවලට යටත් වන අතර, අප බෙදාහරින සමහර නිෂ්පාදන තත්ත්ව පිරිවිතර සපුරාලීමට අසමත්වීමේ ප්‍රතිඵලයක් ලෙස අපගේ වෙළෙන්ඳන් විසින් අපට විරුද්ධව ඉදිරිපත්කරන හිමිකම් ඉල්ලීම් මත පදනම් වී අපිට අලාභවලට මුහුණ දීමට සිදුවේ. | • නිෂ්පාදන තත්ත්ව පිරිවිතර හෝ වාෂ්ප පීඩනය, සල්ෆර් අන්තර්ගතය, එතනෝල් අන්තර්ගතය සහ බයෝඩීසල් අන්තර්ගතය ඇතුළුව සම්මිශ්‍රණ අවශ්‍යතාවය මත නෛතික අවශ්‍යතාව<br>• අපගේ මෙහෙයුම් වලට අදාළවන නිෂ්පාදන තත්ත්ව නීති කඩකිරීම සැලකියයුතු දඩ සහ දණ්ඩනවලට මෙන්ම සෘණාත්මක ප්‍රචාරයට යටත් විය හැක.<br>• ජනතාවගේ භාවිතය සඳහා පිරවිතරයට අඩු (උප ප්‍රාමාණික) නිෂ්පාදන බෙදාහැරම ද්‍රව්වල ඉන්ධන කාර්යසාධනයට මෙන්ම සමහරවිට එංජින් හානිවීම සිදු වී ඇති අතර ඉන් අලාභය සහ සෘණාත්මක ප්‍රචාරය සම්බන්ධව හිමිකම් ගෙවීමකට යටත් විය හැකිය. | • සෑම වර්ගයක පෙට්‍රෝලියම් ඉන්ධන පරීක්ෂාව සඳහා නවීන රසායනාගාරයක් CPSTL සතුවන අතර නියාමනය සහ සහතික කිරීමට අනුකූලව දැඩි තත්ත්ව පාලන යාන්ත්‍රණයක් අනුගමනය කරයි. |
| **සෞඛ්‍ය, ආරක්ෂාව සහ පාරිසරික අවදානම** | | |
| සංකීර්ණ සහ නිතරම වෙනස්වන, පාරිසරික, සෞඛ්‍ය සහ ආරක්ෂක නීති සහ රෙගුලාසිවලට අනුකූලවීම තුළ අපි සැලකිය යුතු පිරිවැය සහ වගකීම් දරනු ලබයි. | • සමාගම විසින් මෙහෙයවන ප්‍රධාන නිෂ්පාදන ගිනිගන්නා සුළු බැවින් මෙහෙයුම් කටයුතු ඉහළ අවදානම යටතේ පවතී. සුළු වැරදීමක් වුවද විශාල ප්‍රමාණයේ ගින්නකට හේතු විය හැකි අතර එය සමාගමේ මෙහෙයුම් මෙන්ම රටේ ආර්ථිකය කඩාවැටීමකට හේතු වේ.<br>• ඛණිජ තෙල් නිෂ්පාදන ගබඩාකිරීම, මෙහෙයවීම සහ ප්‍රවාහනය විමෝචනයට හේතු වන අතර ඉන් පරිසරයට හානිකර ද්‍රව්‍ය සහ වායු මුදාහැරීම සිදුවිය හැක. | • CPSTL සතුව අභ්‍යන්තර ගිනි සේවා ඒකකයක් ප්‍රථමාධාර පුහුණුව, ගිනිනිවීමේ පෙරහුරු, ආරක්ෂිත පුහුණුව සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ඇත. ගිනි ආරක්ෂණ උපකරණ අඛණ්ඩව පරීක්ෂා කර සුදුසු තත්ත්වයේ ඇති බවට සහතික කරයි උදා- කලින් කල ගිනි සයිරන් නලා සේවා කර පරීක්ෂා කිරීම, කාර්යාල උපකරණ තෙල්දමා සහ නළ මාර්ග පරීක්ෂා කිරීම<br>• CPSTL විසින් කලින් කල විධිමත් ටෙන්ඩර් ක්‍රියාවලියක් තුළින් රොන්මඩ තෙල් බැහැරකරමින් අපද්‍රව්‍ය පරිසරයට හානි නොවන බව සහතික කරයි. |

# අවදානම්
## කළමනාකරණය (ඉතිරි කොටස)

| අවදානම | මූලික ධාවකයින් | අවම කිරීමේ ක්‍රමෝපායන් |
|---|---|---|
| **සෞඛ්‍ය, ආරක්ෂාව සහ පාරිසරික අවදානම** | | |
| | • අපගේ ව්‍යාපාරය අහඹු පිටාර ගැලීම, කාන්දුවීම්, බණිජතෙල් බැහැරකිරීම හෝ නිදහස් කිරීම් හෝ පරිසරයට සහ අවට ප්‍රදේශවලට උවදුරු සිදුවීම් වියහැකි අතර, ඒවා විමර්ශණය කර පිළියම් යෙදීම සඳහා සැලකියයුතු වගකීමක් දැරීමට සිදුවේ.<br>• අදාළ පාරිසරික, සෞඛ්‍ය සහ ආරක්ෂක නිති සහ රෙගුලාසිවලට අනුකූලවීමට අසමත්වීම පරිපාලන, සිවිල් හෝ සාපරාධි දණ්ඩනවලට, බලපත් අහෝසිවීමකට, අපගේ මෙහෙයුම් සියල්ල හෝ කිහිපයක් සීමා කිරීමට හෝ තහනම් කිරීමක් ඇතුළු සම්බාධකයකට යටත් විය හැකිය. | • කුමණ ආකාරයේ හෝ මුදාහැරීමේ ක්‍රමයක් අවශ්‍ය ප්‍රමිතිය තුළ අපජලයේ තත්ත්වය රඳවාගැනීමට නියාමනය කෙරේ.<br>• විධිමත් පරිදි අපද්‍රව්‍ය වෙන්කිරීමේ සහ බැහැර කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.<br>• නළමාර්ග/ අක්වෙරළ කාන්දුවීම් හැසිරවීම සඳහා මනාව පුහුණුව ලත් සේවකයින් යෙදවීම. |
| **සයිබර් අවදානම** | | |
| අපගේ වත්කම් මෙහෙයවීමට සහ අපගේ ව්‍යාපාරය කළමනාකරණය කර ගැනීමට අපි තාක්ෂණ ක්‍රම භාවිතා කරමු. අපගේ තොරතුරු තාක්ෂණ පද්ධතියේ සයිබර් ප්‍රහාරයක් හෝ වෙනත් ආරක්ෂක කඩකිරීමක් වැදගත් මෙහෙයුම් හෝ මූල්‍යමය පාලයන් කඩකිරීමකට හේතු වන අතර අපගේ මෙහෙයුම්, වාණිජමය කටයුතු හෝ මූල්‍ය ක්‍රියාවලිය කඩාකප්පල්වීමක් ඇති විය හැකිය.<br> | • හැකරුන්ගේ ඉලක්කගත ප්‍රහාරයක් හරහා සයිබර් සිදුවීමක බලපෑම, ඉලක්ක නොකළ ප්‍රහාරයක ප්‍රතිඵලයක් ලෙස එයට සමපාත අලාභය, අභ්‍යන්තර ප්‍රහාරය, අහඹු සයිබර් සිදුවීම හෝ මේවායේ එකතුවක්. | • සම්පූර්ණයෙන් ක්‍රියාත්මක ආපදා පිළියම් කළමනාකරණ මධ්‍යස්ථානය (DRMC).<br>• කාල පරාමිති ආරක්ෂාව, දත්ත අහිමිවීම, සයිබර්-ප්‍රෝඩාව, සේවා ප්‍රහාර පිළිබඳ බෙදාහැරි ප්‍රතික්ෂේප, ජංගම උපාංග පාලනය කිරීමට ජාල ආරක්ෂණ තාක්ෂණය ක්‍රියාත්මක කිරීම සහ විධිමත් පරීක්ෂාවන් සහ පාලන පිළිබඳ සහතික කිරීම් සමඟ සැකකටයුතු සයිබර් ක්‍රියා නියාමනය.<br>• උපස්ථ සර්වර් සහ පිළියම් සර්වර් |

# අවදානම්
## කළමනාකරණය (ඉතිරි කොටස)

| අවදානම | මූලික ධාවකයින් | අවම කිරීමේ ක්‍රමෝපායන් |
|---|---|---|
| **සේවක රඳවාගැනීම** | | |
| අපගේ අනාගත සාර්ථකත්වය අපගේ විධායක නිලධාරීන් සහ අනෙකුත් ප්‍රධාන කාර්ය මණ්ඩලයේ අඛණ්ඩ සේවය මත රඳා පවතී. අපගේ විධායක නිලධාරීන් සහ අනෙකුත් ප්‍රධාන කාර්ය මණ්ඩලයේ සේවකයෙක් හෝ කිහිප දෙනෙකුගේ සේවය අපට අහිමිවුවහොත්, අපගේ ව්‍යාපාරය. මෙහෙයුම් ප්‍රතිඵල සහ මූල්‍ය තත්ත්වයට හානි විය හැක. | | • කොටසක් තුළින් සේවක අභිප්‍රේරණය පවත්වා ගැනීම හා ඒ තුළින් සේවකයින් පිළිගැනීම, අගයකිරීම සහ උසස් කිරීම සිදුකරයි.<br>• පුහුණු සහ සංවර්ධනය සහ ව්‍යුහගත පුහුණු වැඩසටහන් තුළ අඛණ්ඩ ආයෝජනය මගින් සියලුම සේවකයින් ආවරණය කරයි.<br>• වෘත්තිය ප්‍රගතිය සඳහා අවස්ථාවන් |
| **ආර්ථිකමය අවදානම** | | |
| අපගේ මූල්‍ය ප්‍රතිඵල අපගේ පර්යන්ත තුළ අපි ඉටුකරනු ලබන සැහැල්ලු පිරිපහදු නිෂ්පාදන, බහුල පිරිපහදු නිෂ්පාදන, බොර තෙල් සහ අනෙකුත් අදාළ සේවා සඳහා ඉල්ලුම මත රඳා පවතී. පොදුවේ ආර්ථික පහත වැටීම් යම් තිරසාර කාලසීමාවක් සඳහා මෙම නිෂ්පාදනවල ඉල්ලුම ප්‍රධාන වශයෙන් පහල වැටීමකට හේතු විය හැකිය. අපගේ පර්යන්තවල ගබඩා භාවිතය තුළ සැලකිය යුතු අඩුවීමකට එය හේතු විය හැකි අතර එය අපගේ මුදල් ප්‍රවාහයට සහ අපගේ කොටස්හිමියන් දෙදෙනාට බෙදාහැරීම සඳහා අපගේ හැකියාව අඩුකිරීමකට මඟ පාදනු ඇත. | • බොර තෙල් සඳහා මිල ක්‍රමයේ ගම්‍යාර්ථය ගෝලීය වෙළෙඳපොල තුළ බැරලයක මිල අනුව අඛණ්ඩ ඉන්ධන මිල වෙනස්වීමකට හේතු වේ. | • කෙටි කාලීන සහ දිගුකාලීන මූල්‍ය වත්කම්වල ආයෝජන අහිතකර ආර්ථික සාධක තුළින් ඇතිවන අවිනිශ්චිත මූල්‍ය අර්බුදවලට මුහුණදීම සඳහා ක්‍රියාවට නංවා ඇත. |
| **තොග, දේපල හා උපකරණ අවදානම** | | |
| ගබඩාකළ නිෂ්පාදනවල ගිනිගැනීමේ ස්වභාවය හේතු කොට ගෙන, රක්ෂණ ආවරණවල ප්‍රමාණවත් නොවන/ව්‍යාකූල ආවරණ රක්ෂණ සමාගම් විසින් රක්ෂණ හිමිකම් අගරු කිරීමකට හේතු විය හැක. | | • යටතේ ලියාපදිංචි රක්ෂණ සමාග ම්වලින් ලබාගත් රක්ෂණය.<br>• CPSTL විසින් ගිනි හා වාණිජ රක්ෂණය, නැව්කඳ ඔප්පුව (අක්වෙරළ නළමාර්ග), නිෂ්පාදන රක්ෂණය, රථවාහන රක්ෂණය, ගබඩා ටැංකි හා උපකරණ යනාදිය වැනි ප්‍රමාණවත් රක්ෂණ ඔප්පු රැගෙන ඇත. |
| **සේවක සම්බන්ධතා** | | |
| අපි රැස්වීමේ නිදහස පිළිබඳ අයිතිය හඳුනාගෙන ඇති බැවින් අපගේ සේවකයින්ගෙන් 99%ක් පමණ වෘත්තිය සමිතිවලට අයත්ය. | | • අදාළ ගැටළු සාකච්ඡා කිරීම සඳහා සේවකයින්ට විවෘත දොර ප්‍රතිපත්තිය.<br>• ගැටළුකාරී ක්ෂේත්‍ර හඳුනාගැනීම සඳහා වෘත්තීය සමිති නියෝජිතයින් සමඟ විධිමත් ව්‍යුහගත සාකච්ඡා. |

# අවදානම්
## කළමනාකරණය (ඉතිරි කොටස)

| අවදානම | මූලික ධාවකයින් | අවම කිරීමේ ක්‍රමෝපායන් |
|---|---|---|
| **ඉන්ධන පර්යන්ත කර්මාන්තයට අදාළ විශේෂ කාර්යයන් සඳහා කොන්ත්‍රාත්කරුවන් ලබාගැනීමට නොමැතිකම/ සීමිතකම** | | |
| කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ වේගයට බලපෑම සහ ඉහළ වැඩ පිරිවැය | | • රැකියාවන් සමඟ යෙදවීම මගින් දේශිය හවුල්කරුවන් සංවර්ධනය කිරීම.<br>• දේශිය හවුල්කරුවන් සමඟ සමීප හවුල්කරුවන් ලෙස විදේශිය හැකියාව සහිත හවුල්කරුවන්ගේ සහභාගිත්වය ශක්තිමත් කිරීම. |
| **දේශිය ප්‍රජාවගේ සම්බන්ධතා** | | |
| අප ක්‍රියාත්මක ප්‍රජාවගේ සමාජ-ආර්ථික ප්‍රගතිය කරා සවිබලගැන්වීම සහ දායකවීම සමාගමේ ප්‍රතිරූපය සඳහා තීරණාත්මකය. | | • ඉහළ මට්ටමේ ප්‍රජා සහභාගිත්වය සහ අපගේ ප්‍රජාව සමඟ අර්ථවත් සම්බන්ධතා පෝෂණය කිරීම.<br>• ඉදිරියට යන ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිවල ආයෝජනය. |
| **පුහුණු සහ සංවර්ධනය** | | |
| පුහුණු හා සංවර්ධනය සේවක ඵලදායිතාව සහ ආරක්ෂාව ඇති කිරීමට සහ අපගේ සේවකයින්ගේ උපාය දැනුම වැඩි කිරීමට සෑම මට්ටමකදීම ප්‍රධාන අංගයකි. | | • සේවකයින් සඳහා ව්‍යුහගත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මකය<br>• කාර්යසාධනය මත පදනම් වි පුහුණු අවශ්‍යතා හඳුනා ගැනිම. |



# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

2007 අංක 7 දරන සමාගම් පනතේ ප්‍රතිපාදනයන්ට අනුව පිළියෙල කළ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමාග මේ කටයුතු පිළිබඳව වූ වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් ඉදිරිපත් කර සිටී.

මෙය අධ්‍යක්ෂවරුන් විසින් 2019 පෙබරවාරි 22 දින අනුමත කරන ලදී.

## ප්‍රධාන කටයුතු

සමාගමේ ප්‍රධාන කටයුතු වන්නේ ශ්‍රී ලංකාවේ ඛණිජ තෙල් තොග ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ කටයුතු පහසු කිරීම සඳහා පිහිටුවන ලද පොදු භාවිත පහසුකම් සහ 2003 ඔක්තෝබර් 13 දිනැති අංක11310-8 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ වඩාත් පූර්ණ ලෙස විස්තර කර ඇති තෙල් පර්යන්තය, ගබඩා පහසුකම්, නළ මාර්ග, සහ ඉන්ධන ප්‍රවාහන මෙහෙයුම් සමාලෝචනය සහ මූල්‍ය හුවා දැක්වීම්, වාහන යනාදියෙන් සමන්විත ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ යටිතල පහසුකම් අයිතිකාරත්වය සමග ක්‍රියාත්මක කිරීමත් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් භුක්ති විඳින මුතුරාජවෙල සහ කොලොන්නාවේ ස්ථාපිතයන් දිවයින පුරා පිහිටි තොග ගබඩා සහ අදාළ පහසුකම් කොළඹ වරායේ පිහිටි තෙල් පහසුකම් භාවිත කිරීමට අයිතිය සහ / හෝ බදු අයිතිය, ඒකස්ථාන පාවෙන බෝයාව සිට මුතුරාජවෙල ස්ථාපනය දක්වා වූ කොළඹ වරායේ සිට කොලොන්නාව ස්ථාපනය දක්වා නළ මාර්ගය ශාඛා සිට පාරිභෝගිකයින්ගේ සීමා දක්වා ගාලු වරායේ සිට මාගල්ල තොග ගබඩාව දක්වා නළ මාර්ගය ඉහත සඳහන් කළ ස්ථාපන සහ තොග තෙල් ගබඩා තුළ පිහිටි නළ මාර්ගයත් අයිති සහ /හෝ කාර්යයන් සහ/ හෝ ලංකා ඛණිජ තෙල් නීතිගත ස්ස්ථාවට අයත්ය.

## මෙහෙයුම් සමාලෝචනය සහ මූල්‍ය හුවාදැක්වීම්

රු.197,317,904ක ශුද්ධ ලාභයක් සමඟ රු. 13,130,224,803ක ආදායමක් මෙහෙයුම්වලින් පෙන්වා ඇත.

| විස්තරය | 2018 රු. | 2017 රු. |
|---|---|---|
| පිරිවැටුම් | **13,130,224,803** | 14,176,146,910 |
| බදු පෙර ඉපයීම් | **1,522,230,109** | 3,273,309,403 |
| බදු පසු ලාභය / (අලාභය) | **197,317,904** | 2,799,571,815 |

## ප්‍රකාශිත ප්‍රාග්ධනය

2018 දෙසැම්බර් 31 දිනට ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.7,500,000,000/-. කොටස් අයිතිය බෙදීයාම පහත දැක්වෙන පරිදි වේ.

| | සාමාන්‍ය කොටස් |
|---|---|
| ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව | 500,000,000 |
| ලංකා ඉන්දියන් තෙල් සමාගම | 250,000,000 |

## දේපල, පිරියත හා උපකරණ

වසර තුළ දේපල, පිරියත හා උපකරණවල වෙනස්වීම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 10 යටතේ දක්වා ඇත.

## ලාභාංශ

2018 දෙසැම්බර් දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කොටසකට රු.0.30ක අතුරු ලාභාංශයක් අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ කර ගෙවන ලදී.

## ආයතනික පරිත්‍යාග

වසර තුළදී රු. 2,160,750/=ක පරිත්‍යාග සහ අනුග්‍රාහක ගෙවීම් සමාගම සිදුකර ඇත.

## 2018 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂවරුන්

2018 දෙසැම්බර් 31 දිනට සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි විය.

- ධම්මික රණතුංග මහතා
- උදිත නිරෝෂන ගුණවර්ධන මහතා
- කුල්තොටුවගේ දෝන රෝස්මේරි ඕල්ගා මහත්මිය
- ශ්‍යාම් බෝරා මහතා
- රණවීර ආරච්චිරාලලාගේ නිමල් ජයසුන්දර මහතා
- හේරත් මුදියන්සේලාගේ සංජීව ලුෂාන්ත විජේරත්න මහතා
- සුරාජ් කුමාර් පට්නේයික් මහතා
- ප්‍රමෝද් ජේන් මහතා

## අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය

අධ්‍යක්ෂවරුන් විසින් ලබාගත් ගෙවීම් මූල්‍ය ප්‍රකාශනවල විස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත

## සම්බන්ධතා ලේඛනය

2007 අංක 7 දරන සමාගම් පනතේ ප්‍රතිපාදනයන්ට අනුව සමාගම සම්බන්ධතා ලේඛනයක් පවත්වාගෙන යයි. 2007 අංක 7 දරන සමාගම් පනතේ 192 (2) වගන්තියේ විධිවිධාන පරිදි අධ්‍යක්ෂවරුන් ප්‍රකාශයන් සිදුකර ඇත. සමාලෝචිත වර්ෂයේදී අදාළ සටහන් සම්බන්ධතා ලේඛනයේ තබා ඇත.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරු තම දැනුමේ සහ විශ්වාසයේ තරමට, සමාගම විසින් රජය සහ සේවකයින් සම්බන්ධයෙන් සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා දමා හෝ පොත්වල ප්‍රතිපාදනය කර ඇති බවට අධ්‍යක්ෂවරු සෑහීමට පත්වෙති.

## අඛණ්ඩතා පැවැත්ම

ව්‍යාපාර මෙහෙයුම් කරගෙන යාමට සමාගමට ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට අධ්‍යක්ෂවරුන්ට විශ්වාසය. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා අඛණ්ඩතා පැවැත්ම පදනම යොදා ගැනීම යෝග්‍ය බව අධ්‍යක්ෂවරු සලකා ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩලයේ
## වාර්ෂික වාර්තාව (ඉතිරි කොටස)

**ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්**

සමාගම වෙත ප්‍රමාණවත් බලපෑම් ඇති කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කළ යුතු ගැලපීම් අවශ්‍ය කරන මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 30 යටතේ දක්වා ඇති ඒවා හැර ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදු වූ වැදගත් සිදුවීම් නොමැත.

**විගණකවරු**

19 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව, සමාගමේ විගණකවරු වශයෙන් විගණකාධිපති හෝ ඔහු විසින් නම්කළ අයෙකු සමාගමට පත්කිරීම අවශ්‍ය වේ.

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ විගණනය ජාතික විගණන කාර්යාලය විසින් කරගෙන යන ලදී. මූල්‍ය ප්‍රකාශවල විස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ විගණකවරුන්ට ගෙවන ලද ගාස්තු හෙළිදරව් කර ඇත.

අධ්‍යක්ෂවරුන් දැනුවත්ව සිටින පරිදි, ඉහත හෙළිදරව්කළ පරිදි හැර විගණකවරන්ට සමාගම සමග කිසිම (විගණකවරයෙක් වශයෙන් හැර) සම්බන්ධතාවක් නොමැත. විගණනකවරුන්ට සමාගමේ හෝ සමූහයේ සමාගම්වල අයිතියක් නොමැත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ ආචාරධර්ම මාලාව අනුව ඔවුන් ස්වාධීන බවට තහවුරු කර සිටී.

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන්

පී.එස්. විතානගේ
**සභාපති**

කේ.ඩී.ආර්. ඕල්ගා
**අධ්‍යක්ෂ**

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ගිණුම්කරණ පද්ධති ලේකම් කාර්යාල සේවා (පුද්ගලික) සමාගම
**සමාගමේ ලේකම්වරු**

# විගණන හා කළමනාකරණ
## කමිටු වාර්තාව

**සංයුතිය**
විගණන හා කළමනාකරණ කමිටුව සාමාජිකයින් 03 කින් සමන්විත වන අතර, ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙති.

- කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය -සභාපතිවරිය (අමාත්‍යංශයේ නියෝජිත)
- අනුජ් ජේන් මහතා - සාමාජික (ලංකා අයිඕසී නියෝජිත 2018/06/14 දක්වා)
- ප්‍රමෝද් ජේන් මහතා - සාමාජික (ලංකා අයිඕසී නියෝජිත 2018/08/16 දක්වා)
- නිමල් ජයසුන්දර මහතා - සාමාජික (2018/01/01-2018/05/30)

රාජ්‍ය වාණිජ ව්‍යවසායන් හි විගණන හා කළමනාකරණ කමිටුව පවත්වා ගැනීම සම්බන්ධයෙන් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද PED/55 චක්‍රලේඛය සහ අනෙකුත් අදාළ චක්‍රලේඛවල දක්වා ඇති පරිදි වගකීම්, බලතල සහ විශේෂිත රාජකාරී ආවරණය කරමින් කමිටුවේ විගණන ප්‍රඥප්තිය සකස් කරන ලැබ ඇත.

**විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්ය**
කමිටුව විසින් ක්‍රියාවලින්හී විශ්වාසනියත්වය යොදාගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ක්‍රමවල අනුරූපතාව සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සහතික කිරීම සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම සහ අනාවරණයන්හි ප්‍රමාණවත්බව තුළ සමාගම විසින් යොදාගනු ලබන මූල්‍ය වාර්තාකරණ ක්‍රමය සමාලෝචනය කරයි. එමෙන්ම, මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා, සමාගම් පනතේ සහ අනෙකුත් අදාළ මූල්‍ය වාර්තාකරණ රෙගුලාසි සහ අවශ්‍යතාවල තොරතුරු අවශ්‍යතාවන්ට සමාගමේ අනුකූලතාවයද කමිටුව විසින් සමාලෝචනය කරයි. තවද, මෙම කමිටුව විසින් අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණවත්බව සමාලෝචනය කරන අතර බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය සහ කාර්යසාධනය ඇගයීමට ලක් කරයි. කමිටුව විසින් අනුමැතිය සහ සහතිකය සඳහා මූල්‍ය ප්‍රකාශන නිර්දේශ කරයි.

කමිටුව සමාගමට අනාවරණය වන අවදානම් සමාලෝචනය කර සමාගම විසින් ගනු ලබන පියවර අනුමත කරයි. එවිට එකී අවදානම්වලින් ඇතිවන බලපෑම් කළමනාකරණය කර අවම කරයි.

**අභ්‍යන්තර විගණකවරු**
වත්කම් සුරක්ෂිත බවට සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රමය මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත්කිරීම සමඟ විශ්වාසී බවට අධ්‍යක්ෂවරුන් වෙත සාධාරණ සහතිකය ලබාදීම සඳහා සැලසුම් කර ඇති ගිණුම්කරණ ක්‍රම සහ මූල්‍ය පාලනයේ ඵලදායිත්වය ඇගයීම සඳහා අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ විෂයපථය කමිටුව සමාලෝචනය කරයි. අභ්‍යන්තර විගණන කාර්යය සමාගම තුළ ස්ථාපිත කර ඇත. විගණන නිර්දේශ පසුව ක්‍රියාත්මක කරන බව සහතික කිරීමට පසු විපරම් සමාලෝචන කලින් කල පැවැත්වීමට උපලේඛන ගත කර ඇත. අවදානම පදනම් අභ්‍යන්තර විගණනය යනු අභ්‍යන්තර විගණනයේ විෂයපථය පුළුල් කිරීම සඳහා 2018 වසර තුළ අළුතින් හඳුන්වාදුන් ප්‍රවේශයකි. අවදානම ශ්‍රේණිගතකිරීම තුළින් ඉක්මන් පිළියම් ක්‍රියාමාර්ග සඳහා එවැනි ගැටළු කෙරෙහි වඩා ඉහළ අවධානයක් කළමනාකරණය වෙත ලබා දේ. අභ්‍යන්තර විගණනයේ විෂයපථය අනුමත අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය මගින් පාලනය කෙරේ.

**ව්‍යවස්ථාපිත විගණන**
2018 ජාතික විගණන පනතට අනුකූලව විගණනයේ ස්වභාවය, ප්‍රවේශය සහ විෂයපථය සමාලෝචනය කිරීමට ශ්‍රී ලංකා ජාතික විගණන කාර්යාලයේ ව්‍යවස්ථාපිත විගණකවරු සමඟ කමිටුව කටයුතු කරයි. මතුවන ගැටළුවලට සහ ක්‍රියාත්මක අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වයට ප්‍රතිචාරාත්මකව කළමනාකාරිත්වය විසින් ගනු ලබන පියවර ද සාකච්ඡා කරයි.

**රැස්වීම්**
පහත දක්වා ඇති පරිදි කමිටුව වෙත පවරන ලද කාර්ය ඉටු කිරීමට සමාලෝචිත වසර තුළ, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් දොළහක් (12) පවත්වනු ලැබ ඇත.

වසර තුළ, විගණන කමිටු රැස්වීම්වල සාමාජිකයින්ගේ සහභාගිත්වය පහත පරිදි වේ.

| අංකය | දිනය | කමිටුවේ ශක්තිය | සහභාගි වූ ගණන | සාමාජිකයින්ගේ නම් |
|---|---|---|---|---|
| 01 | 15.01.2018 | 03 | 03 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය I අනුජ් ජේන් මහතා I නිමල් ජයසුන්දර මහතා |
| 02 | 09.02.2018 | 03 | 02 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය I නිමල් ජයසුන්දර මහතා |
| 03 | 14.02.2018 | 03 | 03 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය I අනුජ් ජේන් මහතා I නිමල් ජයසුන්දර මහතා |
| 04 | 22.02.2018 | 03 | 03 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය I අනුජ් ජේන් මහතා I නිමල් ජයසුන්දර මහතා |
| 05 | 27.02.2018 | 03 | 02 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය I නිමල් ජයසුන්දර මහතා |
| 06 | 02.03.2018 | 03 | 03 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය I අනුජ් ජේන් මහතා I නිමල් ජයසුන්දර මහතා |
| 07 | 07.03.2018 | 03 | 03 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය I අනුජ් ජේන් මහතා I නිමල් ජයසුන්දර මහතා |
| 08 | 14.05.2018 | 03 | 03 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය I අනුජ් ජේන් මහතා I නිමල් ජයසුන්දර මහතා |
| 09 | 14.06.2018 | 02 | 02 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය I අනුජ් ජේන් මහතා |
| 10 | 16.08.2018 | 02 | 02 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය I ප්‍රමෝද් ජේන් මහතා |
| 11 | 19.09.2018 | 02 | 02 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය I ප්‍රමෝද් ජේන් මහතා |
| 12 | 12.10.2018 | 02 | 02 | කේ.ඩී.ආර්. ඕල්ගා මහත්මිය I ප්‍රමෝද් ජේන් මහතා |

# විගණන හා කළමනාකරණ
## කමිටු වාර්තාව (ඉතිරි කොටස)

**විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යභාරය**

ක්‍රියාත්මක කළහැකි කාර්යයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා ක්‍රමෝපායික ගැටළු පිළිබඳ තීරණ හා නිර්දේශ කිහිපයක් සිදුකර ඇත.

- අභ්‍යන්තර පාලන ක්‍රමයේ ප්‍රමාණවත් බව කළමනාකරණය, විගණකාධිපති සහ අභ්‍යන්තර විගණකවරු සමඟ සමාලෝචනය කිරීම.
  මූල්‍ය ප්‍රකාශනවල විනිවිදභාවය අවබෝධ කර ගැනීමේ හැකියාව සහ විශ්වාසනියත්වය සහතික කරමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණව ඉදිරිපත් කිරීම සහතිකකිරීමට මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පාලනය කිරීම.

- අලාභ ලබන ඒකක නැවත සකස් කිරීම සඳහා ක්ෂණික සුදුසු කාර්යයන් යෝජනා කිරීම හෝ නිර්දේශ කිරීම සඳහා දරන ලද අලාභය සඳහා හේතු සහ බලපෑම හඳුනාගැනීම සහ විස්තරාත්මක විශ්ලේෂණ සහ අධ්‍යයන කරගෙන යන ලදි.

- වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහන, සැලකියයුතු විගණන සොයාගැනීම් සහ කාර්යය සැලැස්ම සමාලෝචනය.

- අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය විස්තීර්ණ සහ ඉදිරියට යන බව සහතික කරමින් පිළිගත් මට්ටමක් දක්වා අවදානම අවම කිරීම සඳහා අවදානම් සහ පිලියම් කටයුතු හඳුනා ගැනීම

- ඉහළ සිට ආරම්භ කරමින් ශක්තිමත් සහ ඵලදායී අභ්‍යන්තර පාලනය සමඟ ආයතනය පුළුල් බැඳීමක් ඇති ආයතනයක් නිර්මාණය.

- නීති සහ රෙගුලාසි, සදාචාරය, බැඳියා පිළිගැටුම් සහ විෂමාචාරය සහ වංචාව විමර්ෂණය කිරීම සමඟ අනුකූලතාවයට අදාළ ආයතනික ප්‍රතිපත්ති සමලෝචනය.

- තත්ත්වය, ප්‍රගතිය සහ නව සංවර්ධනයන් මෙන්ම ගැටළුකාරී ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සමඟ අඛණ්ඩ සන්නිවේදනය.

**අවසන් කිරීම**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS/LKAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කෙරේ. මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම යටතේ සකස් කෙරේ. සමාගමේ කටයුතු එහි ප්‍රතිපත්ති සමඟ අනුකූලව පාලනය කරන බවට සහ සමාගමේ වත්කම් විධිමත් ලෙස ගණනය කරන බවට සහ ප්‍රමාණවත් පරිදි සුරක්ෂිත කරන බවට සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අභ්‍යන්තර පාලනය තුළින් සාධාරණ සහතිකයක් ලබා දෙන බවට විගණන කමිටුව සෑහිමට පත්වෙති.



කේ.ඩී.ආර්.ඕල්ගා
**සභාපතිණිය**

**විගණන හා කළමනාකරණ කමිටුව**

# මූල්‍ය තොරතුරු

සාර්ථකත්වය මත ව්‍යාප්ත වෙමින්
සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්

# විගනකාධිපතිගේ
## වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. POE/A/CPSTL/01/18/01
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 31 May 2019

සභාපති

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තියට අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගනකාධිපතිගේ වාර්තාව.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය අත්හැරීම**

2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි ("සමාගම") මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සමාගමේ අනුගාමී මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතයක් මම ප්‍රකාශ නොකරමි. මාගේ වාර්තාවේ මතය ඉදිරිපත්කරන කොටසේ මතය අත්හැරීම සඳහා පදනම තුළ සාකච්ඡා කරන කරුණුවල වැදගත්කම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබාගැනීමට මාහට නොහැකි වී ඇත.

**1.2 මතය අත්හැරීම සඳහා පදනම**

**(අ)** දිගු කාලසීමාවක් සඳහා පාර්ශ්වයන් 19 කට අදාළව රුපියල් මිලියන 174.7ක වෙළෙඳ ලැබීම්වල හානිකරණය සඳහා වෙන්කිරීම ප්‍රතිවර්තනය කර සමාලෝචිත වසර සඳහා ලාභාලාභ ගිණුමට අයකර තිබුණි. එසේවුවත්, එකී ප්‍රතිවර්තනයට පෙර ඒවා අයකරගැනීමේ හැකියාව ඇගයීම සඳහා යම් ඇගයීමක් සිදුකර තිබේද යන්න සහතික කිරීමට විගණනයට නොහැක. එමනිසා, එකී වෙළෙඳ ලැබීම්වල පැවැත්ම සහ නිරවද්‍යතාව අනෙකුත් සහයෝගී සාක්ෂි තුළින් විගණනය තුළ සහතික කළ නොහැක.

**(ආ) තොගය**

සමාලෝචිත වසර අවසානයේදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දක්වා ඇති රුපියල් මිලියන 657 ක් වටිනා බඩු වට්ටෝරු ඇගයීම සහ සම්පූර්ණත්වය පිළිබඳ නිරවද්‍යතාව පහත සඳහන් හේතු නිසා විගණනය තුළ විශ්වාසය තැබිය නොහැක.

(i) විශාල ප්‍රමාණයෙන් 2500කට වැඩි බඩු වට්ටෝරු අයිතම ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) ක්‍රමයට එනම් සමාගමේ SAP ට එකී බඩු වට්ටෝරු අයිතමයේ වටිනාකම සඳහන් නොකර ඇතුළත් කර තිබුණු බවට නිරීක්ෂණය විය.

(ii) සමාගමේ ව්‍යවහාරයට අනුව, ප්‍රමාදි බඩු වට්ටෝරු අයිතම සඳහා වෙන්කිරීමක් එහි ආරම්භයේ සිට එක් එක් වසර අවසානයේදී වසර 03ක කාලයක් සඳහා සමස්ත බඩු වට්ටෝරු අයිතම සඳහා සිදුකර තිබුණි. සමාගමේ වාර්තාවලට අනුව, රුපියල් මිලියන 230.2 ක් වටිනා වසර 03ක් පුරා ප්‍රමාදී සංචරනය වන අයිතම සමාලෝචිත වසර අවසානයේදී නිරීක්ෂණය වුවද, රුපියල් මිලියන 15.6ක අයිතම පමණක් ලබා දී තිබුණි. එමෙන්ම එකී වෙන්කිරීම රුපියල් මිලියන 214.6 කින් අඩුකිරීමට පෙර විධිමත් තාක්ෂණික ඇගයීම කර තිබුණු බව සහතික කිරීමට විගණනයට නොහැක.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.auditorgeneral.gov.lk

**(ඇ) අන්තර් සමාගම් ශේෂ**

සමාගම සහ ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව (CPC) සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම (LIOC) අතර අන්තර් සමාගම් ශේෂවල නිරවද්‍යතාව, වටිනාකම සහ පැවැත්ම පහත සඳහන් හේතු නිසා විගණනය තුළ සහතික කර නොමැත.

(i) ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාවෙන් ලැබියයුතු රුපියල් මිලියන 1,173ක මුදලක් එක්සිම් බැංකුවේ ණය නිරවුල් කිරීම සලකා බලමින් ලීටරයට ශත 13 ක මුළු අයකිරීම්වල ණය පොලී සංරචක ඉවත් කිරීමට ඒවායේ ගිණුම්වලින් කපාහැර තිබුණි. කෙසේවෙතත්, සමාගම විසින් මේ සම්බන්ධයෙන් කිසිදු වෙන්කිරීමක් සිදුකර නොමැත.

(ii) සමාලෝචිත වසර අවසානයේදී සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළ ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව වෙතින් ලැබියයුතු ලෙස දක්වා ඇති මුදල් සහ CPC හි මූල්‍ය ප්‍රකාශන තුළ ගෙවියයුතු ලෙස දක්වා ඇති අනුරූප මුදල අතර ඉහත (i) හි පෙන්වා දෙන මුදල ඇතුළුව රුපියල් මිලියන 2,475.8ක වෙනසක් නිරීක්ෂණය විය.

(iii) ලංකා ඉන්දියන් තෙල් සමාගම වෙතින් ලද ශේෂය තහවුරු කිරීමට අනුව, සමාගමට ගෙවියයුතු මුදල රුපියල් මිලියන 351.5ක් වූ අතර, සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව අනුරූප මුදල රුපියල් මිලියන 406.58ක් ලෙස පෙන්වන ලදී. එමනිසා, රුපියල් මිලියන 55.1 ක සැසැඳිය නොහැකි වෙනසක් එකී ශේෂ දෙක අතර නිරීක්ෂණය විය.

(ඈ) සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්නට ඇති මුළු ගෙවියයුතු ආදායම් බදු, ගෙවියයුතු අගය එකතුකළ බදු (VAT), ගෙවියයුතු උපයනවිට ගෙවීම් (PAYE), ගෙවියයුතු ආර්ථික සේවා ගාස්තු (ESC) සහ සමාලෝචිත වසර අවසානයේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන වාර්තාවල දක්වා ඇති අනුරූප ප්‍රමාණ අතර රුපියල් මිලියන 199.8ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) පිළිවෙලින් රුපියල් මිලියන 6.8 සහ රුපියල් මිලියන 8.06 ක් වන වැඩිපුර ගෙවන ලද උපයීගෙ බදු සහ යෙදවුම් වැට් පිළිවෙලින් 2008 සහ 2010 වසරවල ආපසු අයකරගෙන නොමැති බැවින් ඒවා ආපසු අයකර ගැනීමේ හැකියාව අවිනිශ්චිතය.

(ඊ) නිරවුල් නොකර දීර්ඝ කාලයක් පුරා මූල්‍ය ප්‍රකාශනයන් හී වාර්ෂිකව අඛණ්ඩව ඉදිරියට ගෙන ගොස් ඇති බැවින්, පිළිවෙලින් රුපියල් මිලියන 19.1ක් සහ රුපියල් මිලියන 13.9ක් වන රඳවාගැනීමේ බදු සහ නිමැවුම් වැට්වල ගෙවියයුතු ශේෂයේ විශ්වාසය ද අවිනිශ්චිතය.

(උ) ආසන්න වශයෙන් රුපියල් මිලියන 5,195ක් පිරිවැය වූ සම්පූර්ණයෙන් ක්ෂයකල වත්කම් ඒවායේ ඵලදායී ආර්ථික ජීවකාලය නැවත තක්සේරු නොකර සහ LKAS 16 හි 51 වගන්තියට අනුව ඒවා ගණනය නොකර සමාගම විසින් අඛණ්ඩව භාවිතා කරමින් සිටී. එමෙන්ම, සමාගම එහි ආරම්භයේ සිටම සමාගමේ වත්කම් නැවත තක්සේරු කර නොමැති අතර, මෙම අරමුණ සඳහා විධිමත් ප්‍රත්‍යාගණන ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොමැත. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ජංගම නොවන වත්කම්වලින් එවැනි වත්කම්වල සාධාරණ අගය පිළිබිඹු නොවේ.

(ඌ) 2017 වසර තුළ පුනරාවර්තන වියදම ලෙස හඳුනාගනිමින් නොනිමි ප්‍රාග්ධන ගිණුමෙන් වියදම් ගිණුමට (අළුත්වැඩියා සහ නඩත්තු) මාරු කර ඇති රුපියල් මිලියන 32.6ක මුදලක් සමාලෝචිත වසර තුළ ප්‍රතිවර්තනය කරන ලදී. කෙසේවෙතත්, එකී ප්‍රතිවර්තනය සඳහා විධිමත් පදනමක් නිරීක්ෂණය නොවුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වසර තුළ ශුද්ධ ලාභය සහ වියදම් පිළිවෙලින් සමාන මුදලකින් වැඩිපුර සහ අඩුවෙන් සඳහන් කර ඇත.

(එ) ප්‍රවාහන වියදම් සහ යාත්‍රා වියදම් කිහිපයක් මුදල් පදනම මත ගණනය කර ඇති අතර එය සමාගම විසින් LKAS හි 27 සහ 28 යන වගන්තිවලට ප්‍රතිවිරුද්ධව කටයුතු කිරීමකි.

(ඒ) 2018 සැප්තැම්බර් 08 දින මුතුරාජවෙල SPBM හි සහ 2018 ඔක්තෝබර් 12 දින කොලොන්නාව නිමාවේදි වාර්තා වූ ප්‍රධාන ඉන්ධන කාන්දුවීම් දෙක හේතුකොට ගෙන දරන ලද රුපියල් මිලියන 150කට වැඩි මුළු ඇස්තමේන්තු අලාභය සඳහා සමාගම විසින් සමාලෝචිත වසරේ මූල්‍ය ප්‍රකාශන තුළ කිසිදු වෙන්කිරීමක් සිදුකර නොමැත.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පාලනය සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ එයට වගකියයුතු අයගේ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටින අතර, වංචාව හෝ දෝෂය නිසා සැලකියයුතු අවප්‍රකාශවලින් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවීම සඳහා එකී කළමනාකරණයේ තීරණය අවශ්‍ය වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අඛණ්ඩතා පැවැත්මට අදාළ කරුණු අවශ්‍ය පරිදි අනාවරණය කරමින් අඛණ්ඩ පැවැත්මක් මත ඉදිරියට යාමට සමාගමේ හැකියාව තක්සේරු කිරීම සඳහා සහ කළමනාකරණය සමාගම ඈවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට අදහස් කරන්නේනම් හෝ එසේ කිරීම හැර වෙනත් ප්‍රායෝගික විකල්පයක් නොමැතිනම් මිස ගිණුම්කරණය පිළිබඳ අඛණ්ඩතා පැවැත්මේ පදනම භාවිතා කිරීමට කළමනාකරණය වගකීමට බැඳී සිටී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

පාලනය සඳහා වගකීම දරන පුද්ගලයින් සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පාලනය සඳහා වගකීමට බැඳී සිටී.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය පරිදි, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි එහි සියලුම ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳ විධිමත් පොත්පත් සහ වාර්තා සමාගම විසින් පවත්වා ගැනීම අවශ්‍ය වේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්**

මාගේ වගකීම වන්නේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයක් කිරීම සහ විගනකගේ වාර්තාවක් නිකුත් කිරීමයි. කෙසේවෙතත්, මතය දැක්වීමේ කොටසේ අත්හැරීම සඳහා පදනම තුළ විස්තර කර ඇති කරුණු නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතයක් සඳහා පදනමක් ලබා ගැනීමට ප්‍රමාණවත් සුදුසු සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**2. අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතා සඳහා විශේෂ විධිවිධාන ඇතුළත්ය.

- විගණනයේ අරමුණ සඳහා අවශ්‍යයයි සලකනු ලබන සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා නොගත් අතර 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (1) (ඈ) වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ අවශ්‍යතාවය පරිදි සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා තබාගෙන තිබුණේද යන්න තීරණය කිරීමට මා හට නොහැක.

- මතය දැක්වීමේ කොටසේ අත්හැරීම සඳහා පදනම තුළ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරන සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවය හා අනුකූල වේ.

- ඉදිරිපත්කර ඇති මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ අවශ්‍යතාවය පරිදි පසුගිය වසර හා අනුකූල වේ.

- ඉදිරිපත්කර ඇති මූල්‍ය ප්‍රකාශනවලට මෙම වාර්තාවේ 1.2.ආ.i, 1.2.ඇ.ii, 1.2.ඈ, 1.2.ඉ සහ 1.2.ඊ පරිච්ඡේද තුළ විස්තර කර ඇති කරුණ හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ අවශ්‍යතාවය පරිදි පසුගිය වසර තුළ මා විසින් සිදුකළ සියලුම නිර්දේශයන් ඇතුළත්ය.

  ඉටුකරන ලද ක්‍රියාපටිපාටි සහ ලබාගත් සාක්ෂිය පහත කරුණු සඳහන් කිරීම සඳහා මාගේ අවධානය යොමු කිරීමට නොව සැලකියයුතු කරුණුවලට සීමා කරන ලදී;

- සමාගමේ පාලන ආයතනයේ යම් සාමාජිකයෙක්ට සමාගම විසින් එළඹි යම් කොන්ත්‍රාත්වලට සෘජු හෝ වක්‍ර බැඳියාවක් ඇති බවත් එය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ අවශ්‍යතාවය පරිදි සාමාන්‍ය ව්‍යාපාර රටාවෙන් බැහැර වන බව

- පහත දෑ හැර සමාගම යම් අදාළ ලිඛිත නීතියක් හෝ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ අවශ්‍යතාවය පරිදි සමාගමේ පාලන ආයතනය විසින් නිකුත් කළ පොදු හෝ විශේෂ නියෝගවලට අනුකූල වී නොමැති බව

| නීති/නියෝගවලට යොමුව | විස්තරය |
|---|---|
| **(අ) 2003 ජූනි 2 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංකග PED/12 - යහපාලනය සඳහා මාර්ගෝපදේශ.** | |
| i. මාර්ගෝපදේශ 4.2.2 | ද්‍රව්‍ය ප්‍රසම්පාදනය විශේෂයෙන් මාසය තුළ මිලදී ගත් ජංගම නොවන වත්කම් සහ සේවක සංඛ්‍යා තත්ත්වයන්, නව බඳවා ගැනීම් ඇතුළුව මානව සම්පත් පිළිබඳ ප්‍රකාශනය එක් එක් මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී ඉදිරිපත් කර නොතිබුණි. |
| ii. මාර්ගෝපදේශ 4.3 | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා එවැනි රැස්වීම් තහවුරු කිරීමෙන් පසු දින 10ක් තුළ රේඛීය අමාත්‍යංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

| | |
|---|---|
| iii. මාර්ගෝපදේශ 5.1.1 | සමාගම වසර තුනක් සඳහා ආයතනික සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක සැලැස්මක් ලෙස වාර්ෂිකව එය යාවත් කළ යුතුය. මූල්‍ය වර්ෂය අරම්භ කිරීමට දින 15කට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත සැලැස්මේ පිටපත් සමඟ යාවත්කළ වාර්ෂික අයවැය රේඛීය අමාත්‍යංශය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේවෙතත්, සමාගම එම අවශ්‍යතාවය සමඟ අනුකූල වී නොමැත. |
| iv. මාර්ගෝපදේශ 5.2.2 (ආ) | අවශ්‍ය මෝටර් වාහන සඳහා රුපියල් මිලියන 10ක අමතර ප්‍රාග්ධන වියදම සඳහා අමාත්‍යංශයේ අනුමැතිය සහ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ එකඟත්වය ලබාගෙන නොතිබුණි. |
| v. මාර්ගෝපදේශ 5.2.4 සහ 5.2.5 | මූල්‍ය වර්ෂය අරම්භ කිරීමට මාස තුනකට පෙර කෙටුම්පත් අයවැය අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොමැත.<br><br>එමෙන්ම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත අවසාන වරට යාවත් කළ අයවැය පිටපත් මාර්ගෝපදේශ 5.2.5 හි දක්වා ඇති රේඛීය අමාත්‍යංශය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| vi. මාර්ගෝපදේශ 9.2 | අනුමත සේවක සංඛ්‍යාවක් සමඟ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සංවිධාන සටහනක් සමාගම සතුව නොමැත. නව අනුමත සේවක සංඛ්‍යාවක් නිර්මාණය කරන අවස්ථාවක, හෝ අධික සේවක සංඛ්‍යාවක් ඇති අවස්ථාවක, සමාගම මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ උපදේශකත්වයෙන් පියවර ගෙන නොමැත. |
| vii. මාර්ගෝපදේශ 9.3 | මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ එකඟත්වය සමඟ අධ්‍යක්ෂ මණ්ඩලය සහ අමාත්‍යංශය විසින් අනුමත බඳවාගැනීම සහ උසස්වීමේ පටිපාටි (SORAP) සමාගමේ නොතිබුණි. |
| Viii. මාර්ගෝපදේශ 9.10 | වගන්තිය පරිදි, කොන්ත්‍රාත්, අනියම් හෝ වෙනත් ආකාරයක යම් බඳවා ගැනීමක් සඳහා භාණ්ඩාගාරයේ ලේකම්ගේ අනුමැතිය තිබිය යුතුය. කොන්ත්‍රාත් සේවකයින් පත්කිරීම සඳහා සමාගම විසින් එවැනි අනුමැතිය ලබාගෙන නොතිබුණි. සමාලෝචිත වසර අවසානයේදී කොන්ත්‍රාත් පදනමේ සේවකයින් 50ක් සිටියේය. |
| (ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ - 2006 | බාහිර ප්‍රවාහකයින් (බ්‍රවුසර්) තෝරා ගැනීමේදී ටෙන්ඩර් ක්‍රියාපටිපාටියක් අනුමත කර නොමැති අතර, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ද ලබා ගෙන නොමැත. |
| (ඇ) රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ 2013 නොවැම්බර් 04 දිනැති චක්‍රලේඛ අංක FP/06/35/02/01 සහ 2016 අප්‍රේල් 29 දිනැති චක්‍රලේඛ අංක PED 03/2016 | සමාලෝචිත වසර සඳහා සේවකයින්ගේ පුද්ගලික පඩිනඩිවලින් අඩු නොකර රුපියල් මිලියන 207.8 ක් වන සේවකයින්ගේ උපයන විට ගෙවීමේ බදු (PAYE) සමාගම විසින් දරා ඇත. |
| (ඈ) මුදල් හා ක්‍රම සම්පාදන අමත්‍යාංශයේ 2017 ඔක්තෝබර් 24 දිනැති මුදල් චක්‍රලේඛ අංක 124 | ඇබැර්තු තනතුරක රාජකාරි ආවරණය කිරීම මාස 03ක කාලසීමාවකට සීමා කළ යුතුය. එසේවුවත්, නිලධාරීන් 07 දෙනෙක් මාස 03කට වැඩි කාලසීමාවක් සඳහා රාජකාරි ආවරණය කර තිබුණි. |

**(ඉ) රජයේ අනෙකුත් ආයතන වෙත ලබා දී ඇති ආයතනයේ සම්පත්**

චක්‍රලේඛවල උපදෙස් විශේෂයෙන් යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED/12, අතිගරු ජනාධිපතිතුමා විසින් නිකුත් කළ 2006 ජනවාරි 04 දිනැති අංක CSA/PI/40 සහ 2010 මැයි 14 දිනැති අංක CS/1/17/1 දරණ ලිපි සහ 2004 ජනවාරි 08 දිනැති අංක 21 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛවලට පටහැනිව, සමාගම විසින් පුද්ගලයින් 04 ක් සහ වාහනයක් වෙනත් ආයතන වෙත මුදාහැර ඇති අතර, 2018 වසර තුළ මුදාහැරි සේවකයින් වෙනුවෙන් පාරිශ්‍රමික සහ වෙනත් ගෙවීම සහ මුදාහැරි වාහන සඳහා ඉන්ධන හා නඩත්තු වියදම් ගෙවීම සඳහා රුපියල් මිලියන 1.914ක් දරා ඇත.

- පහත දැ හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ අවශ්‍යතාවය පරිදි සමාගම එහි බලතල, කාර්යයන්, සහ රාජකාරි ඉටුකර නොමැති බව සඳහන් කිරීම;

**(අ) නිරවුල් කිරීමේ ගිවිසුම්වල නියමයන් සහ කොන්දේසි මත විධිමත් නියාමන ක්‍රියාවලියක් නොමැතිකම**

ශ්‍රී ලංකා රජය සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම අතර 2007 ජනවාරි 05 දිනැති නිරවුල් කිරීමේ ගිවිසුමේ 03 වගන්තියට අනුව, මෙරට මුළු ඛණිජ තෙල් නිෂ්පාදනයෙන් සියයට 5ක උපරිමයක් දක්වා ඛණිජ තෙල් නිෂ්පාදන ලංකා ඉන්දියන් තෙල් සමාගම විසින් චීන වරාය නිමාවෙන් ලබාදීමට සහ ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව විසින් සපුගස්කන්ද පිරිපහදුව නොමැතිව සියයට 5ක උපරිමයක් දක්වා ලබාදීමට සීමා කරන ලදී. කෙසේවෙතත්, ඉහත කොන්දේසිවල අනුකූලතාවය නියාමනය කිරීමට විධිමත් ක්‍රියාවලියක් දක්නට නොමැත. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාගමේ මුළු ආදායම අහිමිවීමේ හැකියාවක් පවතී.

**(ආ කොටස් හිමිකාර ගිවිසුම කල්පැනීම හේතු කොට ගෙන මිල සූත්‍රය ප්‍රතිශෝධනයේ සහ පොදු පරිශීලක පහසුකම සඳහා කොටස් විකුණුම් මිලදී ගැනීමේ ගිවිසුම ප්‍රමාදවීම**

කොටස්හිමිකාර ගිවිසුම සහ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියන් තෙල් සමාගම සහ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් අතර පොදු පරිශීලක පහසුකම සඳහා කොටස් විකුණුම් මිලදී ගැනීමේ ගිවිසුම 2010 දෙසැම්බර් 31 දින කල් ඉකුත් විය. එසේවුවත්, දිගුකිරීමක් ලබාගෙන නොමැති අතර නව ගිවිසුමකට ඇතුළත් වී ද නොමැත. එමනිසා, අයකරගැනීම් ස්ථර ඇතුළුව මුළු අයකිරීම්, ප්‍රවාහන ආදායම් තීරණය කිරීමේ අරමුණ සඳහා භාවිතා කළ මිල සූත්‍රය 2011 සිට ප්‍රතිශෝධනය කර නොතිබුණි.

**(ඇ) ප්‍රධාන ඉන්ධන කාන්දුවීම් දෙක**

පහත සඳහන් නිරීක්ෂණ සිදුකරනු ලැබේ.

(i) විගණනය තුළ ලබාගත් තොරතුරුවලට අනුකූලව, 2018 ඔක්තෝබර් 12 දින කොලොන්නාව නිමාවේ ටැංකි දෙක අතර ඉන්ධන හුවමාරු කිරීමේදී ආසන්න වශයෙන් පෙට්‍රල් ලීටර් 196,000 ක් කාන්දු වී තිබුනු බව නිරීක්ෂණය විය. එමෙන්ම අවශ්‍ය පහසුකම් සමඟ සුවිශේෂී නිලධාරීන් පත්කර තිබුනද කාන්දුවීම් පැහිරයාම අවම කිරීමට වගකිවයුතු නිලධාරීන් විසින් කඩිනම් ක්‍රියාමාර්ග ගෙන තිබූ බව නිරීක්ෂණය නොවිය. තවද, රක්ෂණයෙන් අලාභය අයකරගැනීමට හෝ වගකිවයුතු පාර්ශ්වයන්ගෙන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාවට අයත් අඩු සල්ෆර් දැවිතෙල් (LSFO) මෙට්‍රික් ටොන් 344,222ක කාන්දුවීමක් 2018 සැප්තැම්බර් 08 දින මුතුරාජවෙල SPBM හි සිදුවී ඇත. රක්ෂණයෙන් කාන්දුවීමේ අලාභය ඉල්ලා සිටීම සඳහා අයදුම්කිරීම හෝ වගකිවයුතු පාර්ශ්වයන්ගෙන් අයකර ගැනීම සඳහා සැලකියයුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

* සමාගමේ සම්පත් කාල රාමු සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ අවශ්‍යතාවය පරිදි අදාළ නීතින්ට අනුකූලව ආර්ථික වශයෙන්, කාර්යක්ෂමව සහ ඵලදායීව ප්‍රසම්පාදනය කිරීම හෝ භාවිතා කිරීම සිදුකර නොමැතිබව සඳහන් කිරීම.

**03. අනෙකුත් විගණන නිරීක්ෂණ**

(අ) කොළඹ වරායේ සිට කොලොන්නාව ඛණිජ තෙල් නිමාව දක්වා එක් එක් නිමකළ ඛණිජ තෙල් නිෂ්පාදන මාරු කිරීමට සමාගම වර්තමානයේ නළමාර්ග දෙකක් පමණක් භාවිතා කරන බව සඳහන් විය. එනම් එක් නළ මාර්ගයක් කලු තෙල් මාරු කිරීමට භාවිතා කරන අතර අනෙක් නළ මාර්ගය සුදු තෙල් මාරුකිරීමට භාවිතා කෙරේ. මෙම නළමාර්ග දෙක වසර 50කට වැඩි කාලයක් භාවිතා කරමින් සිටී. යම් ප්‍රධාන අළුත්වැඩියාවක් සිදුවුවහොත් එක් එක් නිෂ්පාදනය සඳහා තනි නළමාර්ගයක් මත රඳා පැවත්ම ඉන්ධන බෙදාහැරීමේදී බාධා ඇති කළ හැක.

(ආ) සමාගමේ 3,248ක් වන අනුමත කාර්ය මණ්ඩලය අතුරින්, තනතුරු 1,236 නැතිනම් සියයට 38.9 ක් 2018 දෙසැම්බර් 31 දිනට ඇබෑර්තු විය. එයින් තනතුරු 62ක් නැතිනම් සියයට 22.5ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ කාර්ය මණ්ඩලය වූ අතර එයට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-මෙහෙයුම්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - සැපයීම්, ප්‍රධාන තොරතුරු නිලධාරී, කළමනාකරු -තොරතුරු, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කළමනාකරු - බෙදාහැරීම සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය ඉංජිනේරු, කළමනාකරු (ගිනි හා ආරක්ෂණ) යනාදිය ඇතුළත් විය. කෙසේ වෙතත්, අනුමත සේවක සංඛ්‍යාවෙන් පරිබාහිරව පුද්ගලයින් 944ක් බඳවාගෙන තිබූ බව අනාවරණය විය.

**(ඇ) දිගුකාලීනව පවත්නා ගෙවිය යුතු ශේෂ**

වෙළෙන්ඳන් 511කට (සිදුවීම් 872) අදාළව රුපියල් මිලියන 31.2 ක් වන දිගු කාලයක් පවත්නා ප්‍රවාහන අයකිරීම් ශේෂ සහ රුපියල් මිලියන 302.1ක් වන වෙනත් ණය ගැතියන් පිළිබඳ පවත්නා ශේෂ නිරවුල් කිරීමට හිතකර ක්‍රියාමාර්ග ගැනීමක් නොමැතිව වසර එකේ සිට වසර පහ දක්වා කාල පරාශයක නිරීක්ෂණය විය.

**(ඈ) ලිඛිත ගිවිසුම් නොමැතිකම**

ව්‍යාපාරය පහසුවෙන් කරගෙන යාම සඳහා සහ පිරිවැය අවම කර ගැනීම සඳහා ආයතනයකට යම් සහය සේවා සපයන පාර්ශ්වයන් අතර විධිමත් ගිවිසුමක් තිබීම අවශ්‍යය. එසේවුවත්, ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම සමඟ ගිවිසුමකට හෝ අවබෝධතා ගිවිසුමකට පවා ඇතුළත් වී නොමැත. එහි ප්‍රතිඵලයක් ලෙස, එක් එක් පාර්ශ්වයේ ක්‍රියාපටිපාටිය සහ කාර්යභාරයන් සහ වගකීම් විධිමත්ව තීරණය කළ නොහැක.

**(ඉ) ලිඛිත ක්‍රියාපටිපාටි අත්පොතක් නොමැතිකම**

අභ්‍යන්තර පාලන දුර්වලතා හෝ යම් සිදුවිය හැකි දෝෂ සහ සිදුවිය හැකි අක්‍රමිකතා වැලැක්වීමට සහ සොයා ගැනීමට ක්‍රියාත්මක පාලනයන් පෙන්වා දෙන ලිඛිත ක්‍රියාපටිපාටි අත්පොතක් ලබාගත නොහැකි බව නිරීක්ෂණය විය. කළමනාකරණය විස්තර කරන/නියම කරන ක්‍රියාවලිය ව්‍යාතිරේක නොමැතිව ක්‍රියාත්මත වන බව සහතික කිරීමට සමාගමේ එක් එක් ක්‍රියාවලිය සඳහා ක්‍රියාත්මක පාලනයන් පිළිබඳ වාර්තා තබාගැනීම සමාගමට වැදගත් මෙන්ම ප්‍රයෝජනවත්ය. එමෙන්ම, ක්‍රියාපටිපාටි අත්පොතක් සකස් කිරීමෙන් පසු, එහි අදාළත්වය සහතික කිරීමට සාධාරණ කාලසීමාවකදී එය කලින් කල ඇගයීමට ලක්කළ යුතුය.

**ඩබ්ලිඩ්.පී.සී. වික්‍රමරත්න**
**විගණකාධිපති**

# මූල්‍ය තත්ත්ව
## ප්‍රකාශය
2018 දෙසැම්බර් 31 දිනට

| | සටහන | 2018 රු. | 2017 රු. |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත හා උපකරණ | 10 | **16,046,854,744** | 16,754,748,458 |
| අස්පෘශ්‍ය වත්කම් | 11 | **127,341,560** | 277,797 |
| වෙනත් මූල්‍ය වත්කම් | 14.1 | **1,138,830,704** | 444,255,366 |
| | | **17,313,027,008** | 17,199,281,621 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 12 | **657,620,365** | 407,496,049 |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු | 13 | **7,679,235,133** | 9,071,571,994 |
| වෙනත් මූල්‍ය වත්කම් | 14.2 | **1,523,439,398** | 1,838,973,439 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 15 | **3,148,644,883** | 1,474,120,011 |
| | | **13,008,939,779** | 12,792,161,492 |
| **මුළු වත්කම** | | **30,321,966,787** | 29,991,443,112 |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය සහ සංචිතය** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 16 | **7,500,000,000** | 7,500,000,000 |
| ප්‍රාග්ධන සංචිතය | 16.1 | **979,000,000** | 979,000,000 |
| රඳවාගත් ඉපයීම් | | **16,287,261,312** | 16,684,197,985 |
| **මුළු හිමිකම්** | | **24,766,261,312** | 25,163,197,985 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| නිශ්චිත ප්‍රතිලාභ බැදීම් | 17 | **1,451,971,373** | 1,473,989,898 |
| විලම්භිත බදු වගකීම් | 8.1 | **1,997,626,173** | 1,017,152,375 |
| | | **3,449,597,546** | 2,491,142,273 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළෙඳ සහ වෙනත් ගෙවියයුතු දෑ | 18 | **1,815,024,740** | 1,845,584,533 |
| ගෙවියයුතු ආදායම් බදු | | **291,083,189** | 491,518,321 |
| **මුළු වගකීම්** | | **2,106,107,929** | 2,337,102,854 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **30,321,966,787** | 29,991,443,112 |

මෙම මූල්‍ය වාර්තා 2007 අංක 07 දරන සමාගම් පනතේ නියමයන්ට අනුකූල වන බව මම සහතික කරමි.

.....................................
**මුදල් කළමනාකරු**

මෙම මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැදේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරනු ලැබුයේ,

..................................... .....................................
**අධ්‍යක්ෂ** **සභාපති**

පිටු අංක 68 සිට 91 දක්වා ඇති සටහන් සහ ගිණුම් ප්‍රතිපත්ති මෙම මූල්‍ය වාර්තාවලම අඩංගු කොටසක් වේ.

**2019 පෙබරවාරි 22 දින**
**කොළඹ**

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2018 දෙසැම්බර් 31 දිනට

| | සටහන | 2018 රු. | 2017 රු. |
|---|---|---|---|
| ආදායම | 3 | **13,130,224,803** | 14,176,146,910 |
| සෘජු වියදම් | | **(7,903,351,446)** | (7,400,983,212) |
| **දළ ලාභය** | | **5,226,873,357** | 6,775,163,698 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 4 | **704,333,113** | 457,796,444 |
| පරිපාලන වියදම් | | **(4,526,853,560)** | (4,025,018,806) |
| **මෙහෙයුම් ලාභය** | | **1,404,352,910** | 3,207,941,336 |
| මූල්‍ය ආදායම | 5.1 | **117,877,199** | 189,440,805 |
| මූල්‍ය වියදම් | 5.2 | **-** | (124,072,738) |
| **බදු පෙර ලාභය** | 6 | **1,522,230,109** | 3,273,309,403 |
| ආදායම් බදු වියදම් | 7.1 | **(1,324,912,205)** | (473,737,588) |
| **වසර සඳහා ලාභය** | | **197,317,904** | 2,799,571,815 |
| **පසුගිය කාලපරිච්ඡේදයන් හි ලාභ හෝ අලාභවලට නැවත වර්ගීකරණය නොකළ යුතු වෙනත් විස්තීර්ණ ආදායම** | | | |
| නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මත වූ ආයුගණක ලාභය/ අලාභය | 17 | **75,079,946** | (94,946,584) |
| වෙනත් විස්තීර්ණ ආදායම මත බදු | 8.1 | **(18,334,523)** | 12,760,821 |
| වර්ෂය සඳහා බදු අඩුකරන ලද වෙනත් විස්තීර්ණ ආදායම | | **56,745,423** | (82,185,763) |
| **වර්ෂය සඳහා බදු අඩුකරන ලද මුළු විස්තීරණ ආදායම** | | **254,063,327** | 2,717,386,052 |
| **කොටසක ඉපයීම්** | 9.2 | **0.26** | 3.73 |

පිටු අංක 68 සිට 91 දක්වා ඇති සටහන් සහ ගිණුම් ප්‍රතිපත්ති මෙම මූල්‍ය වාර්තාවලම අඩංගු කොටසක් වේ.

# ස්කන්ධය වෙනස්වීමේ
## ප්‍රකාශය
2018 දෙසැම්බර් 31 දිනට

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය<br>රු. | ප්‍රාග්ධන සංචිතය<br>රු. | රඳවාගත් ඉපයීම්<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|
| 2017 ජනවාරි 1 දිනට ශේෂය | 7,500,000,000 | 979,000,000 | 14,371,811,934 | **22,850,811,934** |
| වසර සඳහා ලාභය | - | - | 2,799,571,815 | **2,799,571,815** |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | - | (82,185,763) | **(82,185,763)** |
| මුළු විස්තීර්ණ ආදායම | - | - | 2,717,386,052 | **2,717,386,052** |
| ගෙවූ ලාභාංශය | - | - | (405,000,000) | **(405,000,000)** |
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | 7,500,000,000 | 979,000,000 | 16,684,197,985 | **25,163,197,985** |
| වසර සඳහා ලාභය | - | - | 197,317,904 | **197,317,904** |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | - | 56,745,423 | **56,745,423** |
| මුළු විස්තීර්ණ ආදායම | - | - | 254,063,327 | **254,063,327** |
| ගෙවූ ලාභාංශය | - | - | (651,000,000) | **(651,000,000)** |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 7,500,000,000 | 979,000,000 | 16,287,261,312 | **24,766,261,312** |

පිටු අංක 68 සිට 91 දක්වා ඇති සටහන් සහ ගිණුම් ප්‍රතිපත්ති මෙම මූල්‍ය වාර්තාවලම අඩංගු කොටසක් වේ.

# මුදල් ප්‍රවාහ
## ප්‍රකාශය
2018 දෙසැම්බර් 31 දිනට

| | සටහන | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් ජනිත වූ (භාවිතා කළ) මුදල් ප්‍රවාහ** | | | |
| ආදායම් බදු වියදම්වලට පෙර ලාභය | | **1,522,230,109** | 3,273,309,403 |
| **ගැලපුම්** | | | |
| මූල්‍ය ආදායම | 5.1 | **(117,877,199)** | (189,440,805) |
| මූල්‍ය වියදම් | 5.2 | **-** | 124,072,738 |
| සේවක ණය හානිකරණය සඳහා ඉඩහැරීම් | | **-** | (2,304,574) |
| තොග හා වෙනත් ලැබියයුතු දෑ හානිකරණය සඳහා ඉඩහැරීම් | | **(301,901,998)** | 9,792,534 |
| දේපල, පිරියත හා උපකරණ විකිණීම මත අලාභය /(ලාභය) | 4 | **(26,421,610)** | (3,594,938) |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා වෙන්කිරීම | | **226,725,802** | 242,188,768 |
| ක්ෂයවීම් | 10.2 | **953,409,624** | 878,355,612 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | 11.2 | **2,478,236** | 7,331,222 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය (අලාභය)** | | **2,258,642,964** | 4,339,709,960 |
| තොගවල වැඩිවීම/ (අඩුවීම) | | **(122,887,774)** | (4,640,443) |
| වෙළෙඳ සහ වෙනත් ලැබියයුතු දෑ හි වැඩිවීම/ (අඩුවීම) | | **1,567,002,316** | (3,050,103,575) |
| වෙනත් මූල්‍ය වත්කම්වල වැඩිවීම/ (අඩුවීම) | | **(379,041,297)** | 80,969,132 |
| වෙළෙඳ සහ වෙනත් ගෙවියයුතු දෑ හි වැඩිවීම/ (අඩුවීම) | | **(30,559,793)** | 534,551,035 |
| **මෙහෙයුම්වලින් ජනිත වූ / (භාවිතා කළ) මුදල** | | **3,293,156,416** | 1,900,486,109 |
| ගෙවූ ආදායම් බදු | | **(563,208,064)** | (105,115,999) |
| ගෙවූ මූල්‍ය වියදම් | 5.2 | - | (124,072,738) |
| ගෙවූ නිශ්චිත ප්‍රතිලාභ | 17 | **(173,664,381)** | (97,216,256) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ / (භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | **2,556,283,971** | 1,574,081,117 |
| **ආයෝජන කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ** | | | |
| දේපල, පිරියත හා උපකරණ අත්කර ගැනීම් | 10.1 | **(375,230,766)** | (833,289,951) |
| දේපල, පිරියත හා උපකරණවලින් ලද මුදල් | | **26,594,468** | 3,636,025 |
| මූල්‍ය ආදායම | 5.1 | **117,877,199** | 189,440,805 |
| **ආයෝජන කාර්යයන්ගෙන් ජනිත වූ (භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහ** | | **(230,759,099)** | (640,213,121) |
| **මූල්‍ය කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ** | | | |
| ණය ආපසු ගෙවීම් | | **-** | (1,398,850,854) |
| ගෙවූ ලාභාංශ | | **(651,000,000)** | (405,000,000) |
| මූල්‍ය කාර්යයන්ගෙන් ජනිත වූ (භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහයන් | | **(651,000,000)** | (1,803,850,854) |
| **මුදල් හා මුදලට සමාන දෑ හී ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)** | | **1,674,524,872** | (869,982,860) |
| වසර ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | 15 | **1,474,120,011** | 2,344,102,871 |
| **වසර අවසානයේදී මුදල් හා මුදලට සමාන දෑ** | 15 | **3,148,644,883** | 1,474,120,011 |

පිටු අංක 68 සිට 91 දක්වා ඇති සටහන් සහ ගිණුම් ප්‍රතිපත්ති මෙම මූල්‍ය වාර්තාවලම අඩංගු කොටසක් වේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2018 දෙසැම්බර් 31 දිනට

**1. සංස්ථාපිත තොරතුරු**

**1.1 පොදු**

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ("සමාගම") යනු 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2003 ඔක්තෝබර් 08 වන දින සංස්ථාපනය කරන ලද සීමාසහිත වගකීම ඇති සමාගමක් වන අතර සමාගම ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කර ඇත. සමාගමේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, නිමාව, කොලොන්නාව යන ස්ථානයෙහිය.

**1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතු වල ස්වභාවය**

වර්ෂය තුළ, සමාගමේ මූලික ක්‍රියාකාරකම් වූයේ ඛනිජ තෙල් නිෂ්පාදනයන් ගබඩා කිරීම සහ බෙදාහැරීමයි.

**1.3 මව් අස්තිත්වය සහ අවසාන පාලන පාර්ශවය**

අධ්‍යක්ෂවරුන්ගේ මතය අනුව, සමාගමෙහි අවසාන මව් ව්‍යාපාරය වනුයේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කරන ලද ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවයි.

**1.4 නිකුත්කිරීම සඳහා බලය පවරන දිනය**

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් මූල්‍ය ප්‍රකාශණ නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතය අනුව 2019 පෙබරවාරි ooo දින බලය පවරනු ලැබීය.

**2. පිළියෙල කිරීමේ පදනම**

**2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන් වලින් සමන්විත වූ සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියමකරනු ලැබූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS/ LKASs) වලට අනුකූලව සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ නියමයන්ට අනුකූලව පිළියෙල කොට ඉදිරිපත්කර ඇත.

**2.1.1 මැනීමේ පදනම**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පහත අයිතමයන් හැර සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත.

- නිශ්චිත ප්‍රතිලාභ බැදීම් සඳහා වන වගකීම් ආයුගණක ක්‍රම අනුව තක්සේරුකර වර්තමාන අගයට හඳුනාගෙන ඇත.

**2.1.2 අඛණ්ඩ පැවැත්ම**

අඛණ්ඩ පැවැත්මක් සහිතව දිගටම පවත්වාගෙන යාමට සමාග මේ හැකියාව පිළිබඳව අධ්‍යක්ෂවරුන් තක්සේරුවක් ලබා දී ඇති අතර අනාගතයේ දැකිය හැකි නිශ්චිත කාලයක් සඳහා ව්‍යාපාරයේ අඛණ්ඩව රැඳී සිටීමට සම්පත් තිබීම පිළිබඳව තෘප්තිමත් භාවයට පත්ව ඇත. එසේම අඛණ්ඩ පැවැත්මක් සහිතව දිගටම පවත්වාගෙන යාමට සමාගමේ හැකියාව පිළිබඳ සැලකිය යුතු මට්ටමේ සැකයක් ඇතිකළ හැකිව තිබෙන යම් ප්‍රමාණාත්මක අවිනිශ්චිතභාවයක් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත්ව නොමැති අතර ඔවුන් ඈවර කිරීමට හෝ සමාගමේ මෙහෙයුම් කටයුතු නවතාලීමට අදහස් නොකරයි. එම නිසා මූල්‍ය ප්‍රකාශන දිගටම අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙල කරනු ඇත.

**2.2 ක්‍රියාකාරී සහ ඉදිරිපත්කිරීමේ මුදල් වර්ගය**

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත්තේ සමාගමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කරන මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

**2.3 සංසන්දනාත්මක තොරතුරු**

සමාගම විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සංගතතාවයෙන් යුක්තව යොදාගෙන ඇති අතර, ඒවා පසුගිය වර්ෂයේ දී භාවිතා කළ ඒවා සමග සංගතතාවයෙන් යුක්ත වේ. පසුගිය වසරේ සංඛ්‍යා සහ වාක්‍යාංශ වත්මන් ඉදිරිපත් කිරීමට අනුකූල වීම සඳහා අවශ්‍ය විට නැවත සකස් කර ඇත.

**2.4 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පන**

ගිණුම්කරණ ප්‍රතිපත්තිවල භාවිතයට සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්වල වාර්තා කරන ලද ගණන්වලට බලපාන විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පන කළමණාකරණය විසින් සිදු කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අවශ්‍ය වේ. මෙම උපකල්පනයන් හා ඇස්තමේන්තුවල අවිනිශ්චිතතාවයන් වත්කම් සහ වගකීම්වල ධාරණ වටිනාකම්වලට අනාගත කාලසීමාවන් සඳහා බලපාන සැලකියයුතු ගැලපීමක් අවශ්‍ය වන ප්‍රතිඵල ඇතිකිරීමට හේතු වනු ඇත.

ඇස්තමේන්තු හා උපකල්පනයන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සිදුකරන වෙනස් කිරීම් ඇස්තමේන්තුවට වෙනස්කිරීම් සිදුකළ කාලසීමාවේදී සහ එය බලපාන ඕනෑම අනාගත කාලවලදී හඳුනාගනු ලැබේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේ දී, සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගන්නා ලද වටිනාකම් මත වඩාත්ම සැලකියයුතු බලපෑමක් ඇති ඇස්තමේන්තු කිරීමේ, අවිනිශ්චිතතාවයේ සහ තීරණාත්මක විනිශ්චයන් සම්බන්ධ ක්ෂේත්‍රයන් පහත පරිදි වේ.

**(අ) නිශ්චිත සේවක ප්‍රතිලාභ වගකීම**

නිශ්චිත ප්‍රතිලාභ බැදීම් පාරිතෝෂිකවල පිරිවැය මෙන්ම වර්තමාන අගය ආයුගණක මිණුම් ක්‍රම භාවිතා කරමින් නිශ්චය කරනු ලැබේ. වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම්, සහ වෙනත් අදාළ දත්තයන් පිළිබඳව උපකල්පන සිදුකිරීම ආයුගණක මිනුම් ක්‍රමය තුළ ඇතුලත් වේ. සේවක ප්‍රතිලාශයන්ගේ දීර්ඝ කාලීන ස්වභාවය හේතුවෙන් එකී ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ. එසේම තවදුරටත් උපකල්පනයන්ගේ විස්තරත් සමාගම ඉහත මූලික උපකල්පනයන් සම්බන්ධයෙන් කළමනාකරණය විසින් ඒවායේ සංවේදීතාවය පිළිබඳව සිදුකරන ලද විශ්ලේෂණයක් සහ සංවේදීතා විශ්ලේෂණයේ ප්‍රතිඵල සටහන් 17.2 සහ 17.4 දක්වා ඇත.

**(ආ) වෙළෙඳ ලැබිය යුතු දෑ හානිකරණය**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට වෙළෙඳ ලැබිය යුතු දෑ හානිකරණය වී ඇති බවට විෂය මූලික සාක්ෂි පවතින්නේ ද යන්න සමාගම තක්සේරු කර බලයි. දැනට පවතින ලැබිය යුතු දෑවල දැනට පවත්නා තත්ත්වය සහ ණය අයකරගැනීම පිළිබඳ අතීත අත්දැකීම් පදනම් කරගෙන හානිකරන අලාභය ගණනය කරයි. සැබෑ සහ අපේක්ෂිත හාණිකරණ පිළිබිඹුවීමට එකී වෙන්කිරීම් කලින් කළ ගලපනු ලැබේ. වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභය 2 .5. 11 සහ 13 හි හෙළිදරව් කර ඇත.

# මූල්‍ය ප්‍රකාශන
## වලට සටහන් (ඉතිරි කොටස)

2018 දෙසැම්බර් 31 දිනට

**(ඇ) ආදායම් බදු සහ විලම්භිත බදු**

සමාගම ආදායම් බදුවලට යටත් වේ. ආදායම් බදු සඳහා වෙන් කිරීම තීරණය කිරීමේ දී සැලකිය යුතු විනිශ්චයන් අවශ්‍ය වේ. අවසාන බදු තීරණය අවිනිශ්චිත වන බොහෝ ගණුදෙනු සහ ගණනය කිරීම් ඇත. අතිරේක බදු ගෙවීමට සිදුවේද යන ඇස්තමේන්තුව මත පදනම්ව අපේක්ෂිත බදු ගැටළු මත ආයතනය බදු වගකීම් හඳුනාගනී. මෙම කරුණුවල අවසාන ප්‍රතිඵලය මුල් අවස්ථාවේ දී වාර්තාකල ගණන්වලින් වෙනස් වන විට, එවැනි වෙනස්කම් ජංගම මෙන්ම එවැනි තීරණයක් ගන්නා කාල පරිච්ඡේදයේ විලම්භිත බදු වත්කම් සහ වගකීම් වලට බලපායි. වැඩිදුර තොරතුරු සටහන් 07 සහ 08 හි හෙළිදරව් කර ඇත.

### 2.5 වැදගත් ගිණුම් ප්‍රතිපත්ති සාරාංශය

### 2.5.1 විදේශ විනිමය පරිවර්තනය

සමාගමේ ක්‍රියාත්මක සහ වාර්තා කිරීමේ මුදල වන රුපියල් වලින් මෙම මූල්‍ය වාර්තා ඉදිරිපත් කරයි. විදේශ විනිමය වලින් සිදුවෙන ගනුදෙනු, ගනුදෙනුව සිදුවන දිනයේ පැවති අනුපාතයට ක්‍රියාත්මක මුදලින් මූලිකව වාර්තා කරයි. විදේශ විනිමයවලින් දක්වා ඇති මූල්‍ය වත්කම් සහ වගකීම් වාර්තා කරන දිනයේ පවතින අනුපාතයට ක්‍රියාත්මක මුදලට හරවයි. සියලු වෙනස්කම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ගනී. විදේශ විනිමයකින් ඓතිහාසික පිරිවැයට මනිනු ලබන මූල්‍ය නොවන අයිතමයන් මූලික ගනුදෙනුව දිනයේ පැවති විනිමය අනුපාතයට පරිවර්තනය කරනු ලැබේ. විදේශ විනිමයකින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය නොවන අයිතමයන් සාධාරණ අගය තීරණය කල දිනයේ පැවති විනිමය අනුපාතයට පරිවර්තනය කරනු ලැබේ.

### 2.5.2 අයභාරය හඳුනා ගැනීම

ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒම නිශ්චිත විට සහ ආදායම විශ්වාසවන්ත ලෙස මැනිය හැකි විට අයභාරය හඳුනාගනී. ලබාගත් හෝ ලැබිය යුතු ප්‍රතිශ්ඨාවේ සාධාරණ අගයෙන් වෙළෙඳ වට්ටම්, ආපසු එවුම්, ප්‍රතිදාන සහ විකුණුම් බදු (එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බද්ද) අඩු කොට අයභාරය මනිනු ලැබේ.

ආදායම් ප්‍රමාණය විශ්වාසවන්තව මැනිය හැකිවිට, අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළට ගලා ඒමේ සම්භාවිතාවයක් ඇතිවිට සහ පහත විස්තර කර ඇති ආකාරයට සමාගමේ සෑම ක්‍රියාකාරකමක් සඳහාම අදාළ විශේෂිත ගති ලක්ෂණයන් සපුරා ඇතිවිට, සමාගම විසින් ආදායම හඳුනාගනී. විකිණීමට අදාළ සියලු අවිනිශ්චිතතාවයන් විසඳන තුරු, ආදායම් ප්‍රමාණය විශ්වාසවන්තව මැනිය හැකි සේ නොසලකයි.

**අ) සේවාවන් සැපයීම**

සේවාවන් සැපයූ හෝ ඉටුකළ ගිණුම් කාලපරිච්ඡේදය තුළ සේවාවන් සැපයීමෙන් ජනිතවන ආදායම හඳුනාගනී.

**පර්යන්ත ගාස්තුව**

ලංකා ඛනිජතෙල් සංස්ථාව, ලංකා ඉන්දියන් තෙල් සමාගම සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව අතර 2003 වර්ෂයේ දී අත්සන් කළ පසුව 2011 වර්ෂයේ දී සංශෝධනය කළ, පොදු භාවිතා කරන්නන්ගේ ගිවිසුම අනුව, අලෙවිකරණ සමාගම් වලින් අයකරවාගත් මෙහෙයුම් පිරිවැයවලින් සමන්විත වේ. එය ඔවුන්ට හිමි ඛනිජතෙල් නිෂ්පාදනයන් හුවමාරුවන අවස්ථාවේ දී හඳුනාගැනේ. විකුණනු ලබන ඛනිජතෙල් නිෂ්පාදිතයන් ලීටරයකට යන අනුපාතය යටතේ මනිනු ලැබේ.

**මෙහෙයුම් ආන්තිකය**

මිල සූත්‍රයේ පූර්ව නිශ්චිත අනුපාතයන් මත පදනම්ව මෙහෙයුම් දායකත්වය හඳුනාගැනේ. විකුණනු ලබන ඛනිජතෙල් නිෂ්පාදිතයන් ලීටරයකට යන අනුපාතය යටතේ මෙහෙයුම් දායකත්වය මනිනු ලැබේ.

**ප්‍රවාහන ආදායම**

දුම්රිය, වාහන, නළමාර්ග සහ බවුසර් ගනුදෙනුකරුවන් වෙනුවෙන් දරණ ලද ප්‍රවාහන පිරිවැය අයකර ගැනීමයි. ලීටර පරිමාව සහ ගමන් කරන ලද දුර ප්‍රමාණය මත පදනම්ව ආදායම හඳුනාගැනේ.

**ණය පොළිය**

මිල සූත්‍රයේ පූර්ව නිශ්චිත අනුපාතයන් මත පදනම්ව, සමාගම විසින් දරන ලද පොළිය යලි අයකරගැනීම මත ගණනය කරමින් ණය පොළිය හඳුනාගැනේ. විකුණනු ලබන ඛනිජතෙල් නිෂ්පාදිතයන් ලීටරයකට යන අනුපාතය යටතේ ණය පොළිය මනිනු ලැබේ.

**ආ) මූල්‍ය ආදායම**

පොළිය උපචිත වනවිට, සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් මූල්‍ය ආදායම හඳුනාගැනේ.

**ඇ) වෙනත්**

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනාගැනේ.

දේපල, පිරියත හා උපකරණ සහ ආයෝජන ඇතුළුව වෙනත් ජංගම නොවන වත්කම් විකිණීමෙන් හටගන්නා අයභාර ස්වභාවයේ ශුද්ධ ලාභ සහ අලාභ, විකිණීමෙන් ලද මුදල් වලින් වත්කම්වල ධාරණ අගය සහ ආශ්‍රිත විකිණීමේ වියදම් අඩු කිරීමෙන් පසු ආදායම් ප්‍රකාශයේ ගිණුම් තබනු ලැබේ.

අමතර ක්‍රියාකාරකම්වල සිට ප්‍රධාන ආදායම් උත්පාදනය කරන ක්‍රියාකාරකම් දක්වා සහ ප්‍රමාණාත්මක නොවන සමාන ගනුදෙනු සමූහයකින් හටගන්නා ලාභ සහ අලාභයන්, ශුද්ධ පදනම මත එකට එකතුකර වාර්තාකොට ඉදිරිපත් කරනු ලබයි.

### 2.5.3 වියදම් හඳුනාගැනීම

ව්‍යාපාරය කරගෙන යාමේදී සහ දේපල, පිරියත හා උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙන් නඩත්තු කිරීමේ දී දරන ලද සියළු වියදම් කාලසීමාව සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අයකරනු ලැබේ.

### 2.5.4 බදුකරණය

කාලපරිච්ඡේදය සඳහා වන බදු වියදම ප්‍රවර්තන සහ විලම්භිත බදුවලින් සමන්විත වේ. වෙනත් විස්තීර්ණ ආදායම් හෝ සෘජුවම ස්කන්ධයට අදාළව හඳුනාගන්නා අයිතමයන් සම්බන්ධයෙන් හැරෙන්නට බදු කාලපරිච්ඡේදය සඳහාවන ලාභයට හඳුනාගනී.

මෙහිදී බදු, පිළිවෙලින් වෙනත් විස්තීර්ණ ආදායම හා සෘජුවම ස්කන්ධයට ද හඳුනා ගනී.

**ප්‍රවර්තන බදු**

ප්‍රවර්තන සහ පෙර කාලපරිච්ඡේදයන් සඳහා ප්‍රවර්තන ආදායම් බදු වත්කම් සහ වගකීම් බදු අධිකාරීන්ගෙන් අයකර ගැනීමට අපේක්ෂිත හෝ බදු අධිකාරීන්ට ගෙවීමට ඇති ප්‍රමාණයන්ට මනිනු ලැබේ. ප්‍රමාණය ගණනය කිරීමට යොදාගන්නා බදු

අනුපාතයන් සහ බදු නීති, වාර්තාකරන දින ක්‍රියාත්මකව පවතින හෝ ප්‍රමාණාත්මකව නීතිගතකර ඇති ඒවා වේ.

ආදායම් බදු වෙන්කිරීම පදනම් ව ඇත්තේ මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති පරිදි සහ අදාළ බදු රෙගුලාසිවලට අනුකූලව ගණනය කරනු ලබන ආදායම් සහ වියදම් මූලිකාංග මතය.

සෘජුවම ස්කන්ධයට හඳුනාගන්නා ලද අයිතමයන්ට අදාළ ප්‍රවර්තන ආදායම් බද්ද ස්කන්ධය තුළම හඳුනාගත යුතු අතර විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා නොගත යුතුය.

**විලම්භිත බදු**

වත්කම් සහ වගකීම්වල බදු පදනම සහ මූල්‍ය වාර්තා කරන පරමාර්ථ සඳහා වන ධාරණීය අගයන් අතර, වාර්තා කරන දිනට පවතින තාවකාලික වෙනස මත, වගකීම් ක්‍රමය භාවිතා කරමින්, විලම්භිත බදු වෙනස් කිරීම සිදුකරයි.

ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක දී, වත්කමක් සහ වගකීමක් මූලික හඳුනාගැනීමකින් හටගන්නා විලම්භිත ආදායම් බදු වගකීම් ඇතිවිට සහ ගනුදෙනුව සිදුවන අවස්ථාවේ දී ගිණුම්කරණ ලාභයට හෝ බදු අයවන ලාභ හෝ පාඩු වලට බල නොපාන, තාවකාලික වෙනස්කම් ඇතිවිට හැර සියලුම බදු අයවන තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වගකීම් හඳුනාගනු ලබයි.

අඩුකල හැකි තාවකාලික වෙනස්කම්වලට අදාළ විලම්භිත බදු වත්කම ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක දී වත්කමක් සහ වගකීමක් මූලික හඳුනාගැනීමකින් හටගන්නේ නම් සහ ගනුදෙනුව සිදුවන කාලයේදී ගිණුම්කරණ ලාභයට හෝ බදු අයවන ලාභ හෝ පාඩුවලට බල නොපාන්නේ නම්, අඩුකලහැකි තාවකාලික වෙනස්කම්, ඉදිරියට ගෙනයනු ලබන භාවිතා නොකල බදු වත්කම් සහ භාවිතා නොකල බදු අලාභ භාවිතා කිරීම සඳහා බදු අයවන ලාභ ඇතිවීම සිදුවිය හැකි වන විට, සියලුම අඩුකල හැකි තාවකාලික වෙනස්කම්, ඉදිරියට ගෙනයනු ලබන භාවිතා නොකල බදු වත්කම් සහ භාවිතා නොකල බදු අලාභ සඳහා විලම්භිත බදු වත්කම් හඳුනාගනු ලබයි.

විලම්භිත බදු වත්කම්වල ධාරණ අගය සෑම වාර්තා කරන දිනටම සමාලෝචනය කරන අතර භාවිතා කල යුතු විලම්භිත බදු වත්කම මුළුමනින්ම හෝ කොටසක් ඉඩදීම සඳහා ප්‍රමාණවත් බදු අයවන ලාභයක් පවතින බවට තවදුරටත් සම්භාවිතාවක් නොමැති විට විලම්භිත බදු වත්කම අඩුකල යුතුය.

වත්කම උපලබ්ධි වනවිට හෝ වගකීම පියවනවිට වාර්තා කරන දිනට ක්‍රියාත්මකව පවතින හෝ ප්‍රමාණවත්ව නීතිගතකර ඇති බදු අනුපාතයන් (සහ බදු නීති) පදනම් කරගත් වර්ෂය සඳහා යොදාගන්නා බදු අනුපාතයන්ට අනුව විලම්භිත බදු වත්කම් සහ වගකීම් මනිනු ලැබේ.

**විකුණුම් බදු (එකතුකල අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බද්ද)**

අධිකාරීන්ගෙන් අයකරගත නොහැකි, වත්කම් හෝ සේවාවන් මිල දී ගැනීමේ දී දරන ලද, අදාළ පරිදි විකුණුම් බදු ඇතුලත් අගයට වත්කමේ පිරිවැයෙහි හෝ වියදම් අයිතමයෙහි කොටසක් ලෙස සහ ලැබිය යුතු සහ ගෙවිය යුතු ලෙස හඳුනාගන්නා විට හැර, අනෙකුත් විකුණුම් බදු අඩුකිරීමෙන් පසු ආදායම්, වියදම් සහ වත්කම් හඳුනාගනු ලබයි. බදු අධිකාරීන් වෙනුවෙන් ලැබිය යුතු සහ ගෙවිය යුතු විකුණුම් බදු ගණන මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ලැබිය යුතු සහ ගෙවිය යුතු දෑවල ඇතුළත් කරනු ලබයි.

### 2.5.5 මූල්‍ය සාධන පත්‍ර - මූලික හඳුනා ගැනීම සහ පසුකාලීන මැනීම

#### 2.5.5.1 මූල්‍ය වත්කම්

සමාගමේ මූල්‍ය වත්කම්වලට මුදල් හා කෙටිකාලීන තැන්පතු, වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ සහ ආශ්‍රිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ගණන් ඇතුලත් වේ.

**මූලික හඳුනාගැනීම සහ මැනීම**

ශ්‍රීලගිප්‍ර 39 හි විෂය පථය තුළ ඇති මූල්‍ය වත්කම් ලාභාලාභ තුලින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු මුදල්, කල්පිරෙන තෙක් තබාගන්නා ආයෝජන, විකිණීමට ඇති මූල්‍ය වත්කම් හෝ ඵලදායී ඉදිරි රැකුමක් ඇති ඉදිරි රැකුම් සාධන පත්‍ර ලෙස යොදවා ඇති ව්‍යුත්පන්න ලෙස සුදුසු පරිදි වර්ගීකරණය කරයි. සමාගම විසින් එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය මූලික හඳුනාගැනීමේ දී තීරණය කරයි.

සියලු මූල්‍ය වත්කම් ඒවායේ සාධාරණ වටිනාකමට හඳුනාගන්නා අතර, ලාභාලාභ තුලින් සාධාරණ අගයට නොදක්වන වත්කම් සම්බන්ධයෙන් සෘජුවම හඳුනාගත හැකි ගනුදෙනු පිරිවැය ද ඊට එකතු කරයි.

වෙළෙඳපොලේ රෙගුලාසි හෝ සම්ප්‍රදායන්ට (සාමාන්‍ය ආකාරයේ වෙළෙඳාම්) අනුව පිහිටුවා ගන්නා ලද, කාල පරාසයක් තුළ වත්කම් බෙදාහැරීම අවශ්‍යවන මූල්‍ය වත්කම් ගැනීම් හෝ විකිණීම් වලදී, ඒවා වෙළෙඳ දිනට, එනම් සමාගම වත්කම් මිලට ගැනීම් හෝ විකිණීම් සිදුකරන දිනට, හඳුනාගනු ලබයි.

**පසුකාලීන මැනීම**

මූල්‍ය වත්කම් පසුකාලීනව මැනීම, පහත දැක්වෙන ආකාරයට ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ.

**ආ) ණය සහ ලැබිය යුතු**

ණය සහ ලැබිය යුතු මුදල් ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර සක්‍රීය වෙළෙඳපොලක් තුළ ලැයිස්තුගත නොකල ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත වේ. මූලික මැනීමෙන් පසු එවැනි මූල්‍ය වත්කම් පසුකාලීනව සඵල පොළී අනුපාත ක්‍රමය (EIR) භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට හානිකරණය අඩුකර මිනුම් කරයි. අත්පත්කර ගැනීම මතවූ යම් වට්ටමක් හෝ අධිමිලක් සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය තීරණය කරනු ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම් තුළ ඇතුලත් කර හානිකරන අලාභ ආදායම් ප්‍රකාශය තුළ මූල්‍ය පිරිවැයෙහි ඇතුළත් කරයි.

**ඉවත් කිරීම**

මූල්‍ය වත්කමක් (හෝ අදාළ වන විටදී මූල්‍ය වත්කමකින් කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක්) ඉවත් කරනු ලබන්නේ:

- වත්කමෙන් මුදල් ප්‍රවාහයන් ලැබීමට ඇති හිමිකම කල් ඉකුත්ව ගොස් ඇති විට.
- සමාගම විසින් මුදල් ප්‍රවාහයන් ලැබීමට සමාගමට ඇති අයිතිය පවරා ඇති විට, හෝ මාරු කිරීම් වැඩපිළිවෙලක් යටතේ ලබාගත් මුදල් ප්‍රවාහයන් මුළුමනින්ම සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව තුන්වන පාර්ශවයක් වෙත ගෙවීමට බැඳීමක් ඇතිකරගෙන ඇතිවිටක සහ එක්කෝ (අ) සමාගම විසින් සැලකිය යුතු ලෙස වත්කම සම්බන්ධ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා ඇති විට, නැතහොත් (ආ) සමාගම විසින් සැලකිය යුතු ලෙස වත්කම සම්බන්ධ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා හෝ රඳවා තබාගෙන නොමැති වුව ද වත්කමෙහි පාලනය පවරා ඇති විට.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන් (ඉතිරි කොටස)

2018 දෙසැම්බර් 31 දිනට

සමාගම විසින් වත්කමෙන් මුදල් ප්‍රවාහයන් ලැබීමට ඇති අයිතිය පවරා ඇති විට හෝ මාරුකිරීම් වැඩ පිළිවෙලකට එළඹ සැලකිය යුතු ලෙස වත්කම සම්බන්ධ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා හෝ රඳවා තබාගෙන නොමැතිව හෝ එහි පාලනය පවරා නොමැතිව ඇති විට වත්කම හදුනාග නු ලබන්නේ ඒ සඳහා සමාගමේ අඛණ්ඩ මැදිහත්වීම් මට්ටම අනුවය.

එවැනි විටදී, සමාගම විසින් ආශ්‍රිත වගකීමක්ද හදුනාග නු ලබයි. සමාගම විසින් රඳවා තබාගත් හිමිකම් සහ බැඳීම් පෙන්නුම් වන පදනමක් මත පවරන ලද වත්කම සහ ආශ්‍රිත වගකීම මිණුම් කරනු ලබයි.

අඛණ්ඩ මැදිහත්වීම පවරන ලද වත්කම මත ඇපයක ස්වරූපයක් ගන්නා අතර, එය වත්කමෙහි මුල් ධාරණ අගය සහ ආපසු ගෙවීමට සමාගමට අවශ්‍යවන, උපරිම මුදල් ප්‍රමාණය යන අගයන්ගෙන් වඩා අඩු අගයට මිණුම් කරයි.

### මූල්‍ය වත්කම්වල අගය හානිකරණය

මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් සමූහයක අගය හානිකරණය වී තිබේ ද යන්න පිළිබඳව විෂයානුකූලව සාක්ෂි තිබේද යන්න, සමාගම සෑම වාර්තාකරන දිනකටම තක්සේරු කරයි. වත්කමෙහි මූලික හදුනාගැනීමට පසුව සිදුව ඇති සිදුවීම් එකක් හෝ කිහිපයක ප්‍රතිඵලයක් වශයෙන් (සිදුව ඇති අලාභ සිද්ධියක්) ඇතිවීමත්, එකී අලාභ සිද්ධිය සිදුවීම මගින් මූල්‍ය වත්කම හෝ මූල්‍ය වත්කම් සමූහයේ, විශ්වාස වන්තව මිනුම් කළහැකි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් මත බලපෑමක් ඇතිකරනවිට, හානිකරණය පිළිබඳ විෂයානුකූල සාක්ෂි ඇත්නම් පමණක් මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් සමූහයක හානිකරණය සිදුවී ඇතැයි සලකනු ලබයි. ණයගැනීමක් හෝ ණයගැතියන් සමූහයක් සැලකියයුතු මූල්‍ය දුෂ්කරතාවයන් අත් විඳිමින් සිටිනවිට, පොළිය හෝ මුල් මුදල නොගෙවීම, ගෙවීම පැහැර හැරීම, ඔවුන් බුන්වත්භාවයට හෝ වෙනත් මූල්‍ය අසංවිධානාත්මක තාවයන්ට පත්වනු ඇතිවිට, සහ පැහැර හැරීම සමග සහසම්බන්ධවන හිගවල හෝ ආර්ථික තත්ත්වයන්ගේ වෙනසක් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ මැනියහැකි අඩුවීමක් නිරීක්ෂණ දත්ත මගින් පෙන්නුම් කරන අවස්ථාවලදී, වැනි ඇගයීම් හානිකරණය වීම පිළිබඳ සාක්ෂිවලට ඇතුලත් කල හැක.

### ක්‍රමක්ෂය පිරිවැයට පවත්වා ගන්නා මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගන්නා මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් සමාගම විසින් පළමුව තක්සේරු කරනු ලබන්නේ, තනිතනිව සුවිශේෂවන මූල්‍ය වත්කම් සඳහා තනි තනිව හානිකරණය වීම පිළිබඳ විෂයානුකූල සාක්ෂි පවතින්නේද යන්න පිළිබඳ හෝ තනිතනිව සුවිශේෂී නොවන මූල්‍ය වත්කම් සඳහා සාමූහිකව හානිකරණය වීම පිළිබඳ විෂයානුකූල සාක්ෂි පවතින්නේද යන්න පිළිබඳවයි. තනිතනිව තක්සේරු කළ මූල්‍ය වත්කම් සඳහා හානිකරණය වීම පිළිබඳ විෂයානුකූල සාක්ෂි නොමැති බවට සමාගම විසින් නිශ්චය කර ගන්නේ නම්, ඒවා සුවිශේෂී වුවත්, නැතත්, සමාන ණය අවදානම් ගතිලක්ෂණ පවතින මූල්‍ය වත්කම් සමූහයක් එයට ඇතුලත් කොට, හානිකරණය වීම සඳහා හානිකරණ අලාභයක් ඇත්නම් හෝ එය අඛණ්ඩව පවතින බව හදුනා ගත්තේ නම්, එකී වත්කමේ හානිකරණය වීම පිළිබඳ සාමූහික තක්සේරුවට ඇතුළත් නොකරයි.

හානිකරණය වීමේ අලාභයක් ඇති බවට විෂයානුකූල සාක්ෂි ඇති විට අලාභයේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ගේ (තවමත් ඇතිවී නොමැති අනාගත අපේක්ෂිත ණය අලාභ හැර) වර්තමාන අගය අතර වෙනස මගිනි. ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගයන්, මූල්‍ය වත්කමේ සඵල පොලී අනුපාතයට වට්ටම් කරනු ලැබේ. ණයක් සඳහා විචල්‍ය පොළී අනුපාතිකයක් නැත්නම්, ඕනෑම හානිකරණය වීමේ අලාභයක් මිනුම් කිරීම සඳහා වන වට්ටම් අනුපාතය වන්නේ ප්‍රවර්තන සඵල පොළී අනුපාතයයි.

ඉඩහැරීමේ ගිණුමක් භාවිත කිරීම හරහා වත්කමේ ධාරණ අගය අඩුවන අතර අලාභය ආදායම් ප්‍රකාශයේ හදුනා ගැනේ. පොළී ආදායම, අඩුවූ ධාරණ අගය මත අඛණ්ඩව උපචිත වන අතර, හානිකරණය මැනීමේ කාර්යය අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් සඳහා භාවිත කළ පොළී අනුපාතය භාවිතයෙන් පොලිය උපචිත කිරීම සිදු කරයි. පොලී ආදායම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ කොටසක් ලෙස වාර්තා කරයි. අනාගත අයකරගැනීම සම්බන්ධයෙන් යථාර්තවාදී අපේක්ෂාවක් නොමැතිවිට සහ සියලු අතිරේක ඇප උපලබ්ධි වී හෝ සමාගමට පැවරී ඇති විට, ණය සහ ණය ආශ්‍රිත ඉඩහැරීම් සමාගම ලියාහරියි. හානිකරණය හදුනාගත් පසු ඇති වූ සිදුවීමක් නිසාවෙන්, පසු වසරකදී හානිකරණ අලාභය ඉහළයාම හෝ පහළ යාම සිදුවෙයි. අනාගත ලියාහැරීමක් පසුව නැවත අයකරගතහොත්, අයකරගැනීම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයට බැර කරයි.

### 2.5.5.2 මූල්‍ය වගකීම්

වෙළෙඳ ගෙවිය යුතු දෑ, ආශ්‍රිත පාර්ශවයන්ට ගෙවිය යුතු දෑ, බැංකු අයිරා සහ පොලි සහිත ණය ගැනීම් සමාගමේ මූල්‍ය වගකීම් වලට ඇතුලත් වේ.

### මූලික හදුනා ගැනීම සහ මැණීම

ශ්‍රීලගිප්‍ර 39 යේ විෂය පථය තුළ වූ මූල්‍ය වගකීම්, ලාභාලාභ තුලින් සාධාරණ අගයට තබාගන්නා මූල්‍ය වගකීම්, ණය සහ ණයට ගැනීම් සහ ඵලදායි ඉදිරි රැකුමක් සඳහා යොමුකරන ලද ව්‍යුත්පන්නයන්, සුදුසු පරිදි වර්ග කෙරේ. සමාගම මූලික හදුනාගැනීමේ දී මූල්‍ය වගකීම් වර්ග කිරීම තීරණය කරයි.

සියලු මූල්‍ය වගකීම් මූලිකව සාධාරණ අගයට හදුනාගන්නා අතර, ණය සහ ණයට ගැනීම් ක්‍රමක්ෂය පදනමට තබාගනී. සෘජුව හදුනාගතහැකි ගනුදෙනු පිරිවැය මීට ඇතුලත් වේ. මූලික සාධාරණ අගය සහ නාමික අගය අතර යම් වෙනසක් ඇත්නම්, එය මෙහෙයුම් කල්බදු ආදායම් කොටසක් වශයෙන් ඇතුලත් කරන අතර, අදාළ කාලසීමාව පුරාවට සරල මාර්ග ක්‍රමයට හදුනාගනු ලබයි.

පහත සඳහන් පරිදි මූල්‍ය වගකීම් මැනීම ඒවායේ වර්ගීකරණය මත රදා පවතී:

#### (අ) ණය සහ ණය ගැනීම්

මූලික හදුනාගැනීමට පසුව, පොළී සහිත ණය සහ ණය ගැනීම් සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට පසු කාලීනව මනිනු ලැබේ. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය පිරිවැය ක්‍රියාවලිය තුළ මෙන්ම වගකීම් ඉවත්කිරීම් සිදු කරනවිට ආදායම් ප්‍රකාශය තුළ ලාභ අලාභ හදුනාගැනේ.

අත්පත් කරගැනීමේ දී ඇති වූ යම් වට්ටමක් සහ අධිමිලක් සහ සඵල පොලී අනුපාතයේ සංකලනික කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ ඇතුලත් කරයි.

# මූල්‍ය ප්‍රකාශන

## වලට සටහන් (ඉතිරි කොටස)

2018 දෙසැම්බර් 31 දිනට

**ඉවත් කිරීම**

වගකීම යටතේ ඇති බැඳියාව පියවා ඇති විට හෝ අවලංගුකර ඇතිවිට හෝ කල් ඉකුත්ව ඇතිවිට මූල්‍ය වගකීමක් ඉවත් කෙරේ. සැලකිය යුතු ලෙස වෙනත් කොන්දේසි මත එම ණය දෙන්නාගෙන්ම හෝ පවතින වගකීමක කොන්දේසි සැලකිය යුතු ලෙස නවීකරණය කිරීමෙන් හෝ දැනට පවතින මූල්‍ය වගකීමක් වෙනසක් මගින් ප්‍රතිසම්පාදනය කලවිට, එවැනි හුවමාරුවක් හෝ නවීකරණයක් මුල් වගකීම ඉවත් කිරීමක් ලෙස සහ නව වගකීමක් හදුනා ගැනීමක් ලෙස සලකනු ලබන අතර අදාළ ධාරණ අගයන්ගේ වෙනස ආදායම් ප්‍රකාශයේ හදුනාගනු ලැබේ.

**2.5.6 සාධාරණ අගය මැනීම**

මැනීම කරන දිනට නිසිලෙස කරන ගනුදෙනුවක දී වෙළෙඳපොල පාර්ශවකරුවන් අතර වත්කමක් විකිණීමට ලැබෙන මුදල් හෝ වගකීමක් පැවරීමට ගෙවනු ලබන මිල සාධාරණ අගය වේ. වත්කමක් විකිණීම හෝ වගකීම පැවරීමට වන ගනුදෙනුව:

:

- වත්කම හෝ වගකීම සඳහා වන ප්‍රධාන වෙළෙඳපොලේ දී හෝ
- ප්‍රධාන වෙළෙඳපොලක් නැතිවිට දී වත්කම හෝ වගකීම සඳහා වන වඩාත්ම වාසිදායක වෙළෙඳපොලේදී

ප්‍රධාන හෝ වාසිදායක වෙළෙඳපොල සමාගමට ඇතුලත් විය හැකි වෙළෙඳපොලක් වියයුතුය.

වෙළෙඳපොලට සහභාගීවන්නන් තමන්ට ආර්ථික වශයෙන් වඩාත්ම වාසිදායක ලෙසට හැසිරේය යන උපකල්පනය කරමින් වත්කම හෝ වගකීම මිල කිරීමේ දී වෙළෙඳපොලට සහභාගීවන්නන් කරනු ලබන උපකල්පන මත පදනම්ව සාධාරණ අගය මනිනු ලැබේ.

ඉහළම හා හොඳම භාවිතය යොදාගනිමින් හෝ ඉහළම සහ හොඳම භාවිතය යොදාගනු ඇතැයි සැලකෙන වෙනත් වෙළෙඳපොලට සහභාගීවන්නෙකුට විකිණීමෙන් වෙළෙඳපොලට සහභාගීවන්නෙකුට ඇති ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමේ හැකියාව මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මැනීමේ දී සැලකිල්ලට ගනු ලැබේ.

ඇගයුම් කිරීමේ දී අදාළ නිරීක්ෂණය කලහැකි යෙදවුම් භාවිතය උපරිම කරමින් සහ නිරීක්ෂණය කල නොහැකි යෙදවුම් භාවිතය අවම කරමින් අවස්ථාවට යෝග්‍ය ශිල්පක්‍රම සමාගම යොදාගනී.

සාධාරණ අගය මනිනු ලැබූ හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරනු ලැබූ සියලුම වත්කම් හා වගකීම් සාධාරණ අගය මැනීමට සමස්තයක් වශයෙන් වැදගත් පහළම මට්ටමේ යෙදවුම් මත පදනම්ව, සාධාරණ අගය ධූරාවලිය තුළ පහත සඳහන් පරිදි වර්ග කරනු ලබයි.

- මට්ටම 1 - සමාන වත්කම් හෝ වගකීම් සඳහා ක්‍රියාකාරී වෙළෙඳපොලෙහි ලැයිස්තුගත (නොගැලපූ) මිල ගණන්
- මට්ටම 2 - සාධාරණ අගය මැනීමට වැදගත් සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කල හැකි පහළම මට්ටමේ යෙදවුම් සඳහා වන ඇගයීම් ක්‍රම
- මට්ටම 3 - සාධාරණ අගය මැනීමට වැදගත් සාධාරණ අගය හෙළිදරව් කිරීම සඳහා නිරීක්ෂණය කල නොහැකි පහළම මට්ටමේ යෙදවුම් ඉහත විස්තර කර ඇති ආකාරයට ස්වභාවය, ගුණාංග, වත්කම් හා වගකීම්වල අවධානම් සහ සාධාරණ අගය ධූරාවලියේ මට්ටම පදනම් කරගෙන සමාගම වත්කම් හා වගකීම් පන්තීන් තීරණය කර ඇත.

**2.5.7 තොග**

යල් පැන ගිය සහ සංසරණය අඩු අයිතමයන් සඳහා ප්‍රමාණවත් පරිදි වෙන්කිරීමක් කල පසු, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු වටිනාකමට තොග ආගණනය කෙරේ. සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුළ තොග සහ විකිණිය හැකි මිලක් නිම කිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදුකිරීමට අත්‍යවශ්‍ය වන ඇස්තමේන්තුගත පිරිවැය අඩුකල පසු ශුද්ධ උපලබ්ධි අගය වේ.

තොග වර්තමාන තත්ත්වයට සහ ස්ථානයට ගෙන ඒමේ දී දරන ලද පිරිවැය, සූත්‍රය භාවිතා කිරීමෙන් ගිණුම්ගත කරනු ලැබේ.

| | |
|---|---|
| පාරිභෝජන ද්‍රව්‍ය, මෝටර් රථ හා අමතර කොටස් හා අළුත්වැඩියාව සඳහා වන සාමාන්‍ය ද්‍රව්‍ය | - බරතැබූ සාමාන්‍ය පදනම මත ගැනුම් පිරිවැයට |
| නිමි තොග | - සත්‍ය ගැනුම් පිරිවැයට |

**2.5.8 දේපල, පිරියත සහ උපකරණ**

එදිනෙදා නඩත්තු කිරීමේ පිරිවැය හැර, පිරිවැයේ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණය අඩුකල පසු අගයට දේපල, පිරියත සහ උපකරණ දක්වා ඇත. හදුනාගැනීමේ නිර්මාපකය සපුරාලන්නේ නම් දේපල, පිරියත සහ උපකරණවල කොටසක් ප්‍රතිසම්පාදනය කිරීමේ පිරිවැය, දැරූවිට එවැනි පිරිවැයට ඇතුලත් වේ.

වසර අවසානයට තව දුරටත් අසම්පූර්ණ තත්ත්වයේ පවතින, භාරගත් කාර්යයන් මත ගෙවන ලද, සියලුම අගයන් කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩවලින් පෙන්නුම් කරයි.

අවිනිශ්චිත ජීව කාලයක් පවතින බවට සැලකෙන නිසාවෙන් ඉඩම් ක්ෂය නොකරයි. සෑම වත්කමකම පිරිවැය, එකී වත්කම්, භාවිතා කිරීමට හැකි තත්ත්වයට පත්වූ දින සිට ඇරඹෙන පරිදි වන ඒවායේ ඵලදායී ජීවිත කාලය ඒවායේ සුන්බුන් අගයට දක්වා බෙදාහැරීම සඳහා සරල මාර්ග ක්‍රමය මත ක්ෂයවීම් ගණනය කරයි. වත්කම් විකිණීමේ දී වත්කම ඉවත්කරන දින සිට ක්ෂයවීම් අවසාන කරයි.

වත්කම්වල සුන්බුන් අගය, ඵලදායී ජීවිත කාලයක් සහ ක්ෂය ක්‍රමය සමාලෝචනය කොට යෝග්‍ය වන්නේ නම්, අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ දීම ගලපනු ලබයි.

වත්කමක ධාරණ අගය එහි අපේක්ෂිත අයකරගත හැකි අගයට වඩා වැඩි වන්නේ නම්, වත්කමක ධාරණ අගය වහාම එහි අයකර අගය දක්වා කපා හරිනු ලබයි.

විකිණීමෙන් ලද මුදල් ධාරණ අගය සමඟ සැසදීමෙන් විකිණීම මත ලාභ අලාභ තීරණය කරනු ලබන අතර ඒවා ආදායම් ප්‍රකාශයෙහි ඇතුළත් කරනු ලබයි.

# මූල්‍ය ප්‍රකාශන
## වලට සටහන් (ඉතිරි කොටස)

### 2.5.9 අස්පෘශ්‍ය වත්කම්

**අ) ආයතන සම්පත් සැලසුම්කරන (ERP) පද්ධතිය සහ ආයතන සම්පත් සැලසුම්කරන (ERP) බලපත්‍ර ගාස්තු**

මිලට ගත් මෘදුකාංග සඳහා බලපත්‍ර ලබාගැනීමේ දී දරණ ලද පිරිවැය බලපත්‍ර ගාස්තු මගින් පෙන්නුම් කරයි. බලපත්‍ර ගාස්තු පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය අඩුකොට ගෙන යයි. බලපත්‍රවල පිරිවැය ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය වන වසර 5 පුරා බෙදාහැරීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය ගණනය කරයි.

### 2.5.10 මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල් ඉල්ලුම් තැන්පතු සහ පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි සහ වටිනාකම වෙනස්වීම සම්බන්ධයෙන් නොසැලකියයුතු තරමේ අවදානමක් සහිත, ඉහළ ද්‍රවශීලතාවයන් ඇති කෙටිකාලීන ආයෝජන වශයෙන් මුදල් හා මුදල් සමාන දෑ අර්ථකථනය කරනු ලබයි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වන්නේ අතැති මුදල් සහ පියවිය යුතු බැංකු අයිරාව අඩුකල පසු ඉතිරිවන බැංකු තැන්පතු වලිනි. මාස තුනක් හෝ ඊට අඩු කල්පිරීම් සහිත ආයෝජනද මුදල් හා මුදල් සමාන දෑ ලෙස සලකනු ලැබේ.

### 2.5.11 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

අවිනිශ්චිත ජීව කාලයක් සහිත වත්කම් ක්‍රමක්ෂය වීමට භාජනය නොකරන අතර, හානිකරණයවීම සම්බන්ධව පරීක්ෂා කරනු ලබයි.

ධාරණ අගය අයකරගැනීමට නොහැකි වනු ඇති බවට සිදුවීම් හෝ අවස්ථාවන්ගේ වෙනස්කම් පෙන්නුම් කරන විට දී, ක්‍රමක්ෂය සඳහා භාජනය වන වත්කම් හානිකරණය සඳහා සමාලෝචනය කරනු ලැබේ. වත්තමක ධාරණ අගය එහි ආපසු අයකරගත හැකි අගය ඉක්මවන ප්‍රමාණයට හානිකර අලාභය හඳුනාගනු ලැබේ. ආපසු අයකරගත හැකි අගය වන්නේ වත්කමේ සාධාරණ අගයෙන් එය විකිණීමට යන පිරිවැය අඩුකල පසු ලැබෙන අගය සහ භාවිත අගය යන දෙකෙන් වඩා වැඩි අගයයි. හානිකරණය තක්සේරු කිරීම සඳහා වෙන් වෙන්ව හඳුනාගත හැකි මුදල් ප්‍රවාහයන් (මුදල් ජනනය කරන ඒකක) ඇති පහළම මට්ටම්වලට වත්කම් කාණ්ඩ කරනු ලැබේ.

### 2.5.12 වෙන්කිරීම්

සමාගමට, අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන බැඳීමක් (නීතිමය හෝ සම්ප්‍රයුක්ත) පවතින විට, මෙම බැඳීම් නිරාකරණය කිරීමට ආර්ථික ප්‍රතිලාභ හා බැඳුණු සම්පත් පිටතට ගලායාමේ සම්භාවිතාවක් ඇති විට සහ බැඳීමේ ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක ලෙස ඇස්තමේන්තුවක් කලහැකි විටක, වෙන්කිරීම් හඳුනාගනු ලැබේ. වෙන්කිරීම මුළුමනින්ම හෝ කොටස් ප්‍රතිපූර්ණ කිරීමට සමාගම අපේක්ෂා කරනවිට, එම ප්‍රතිපූර්ණය සැබැවින්ම නිශ්චිත නම් පමණක්, එය අඩුකල පසු ලැබෙන අගයට ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලැබේ. මුදලේ කාල වටිනාකම සැලකිය යුතු වන්නේ නම්, වෙන්කිරීම් තීරණය කරනු ලබන්නේ, අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් මුදලේ කාල වටිනාකම පිළිබඳ ප්‍රවර්තන වෙළෙඳපොල තක්සේරුකිරීම් සහ යෝග්‍ය විටදී වගකීමට විශේෂිත වන අවදානම පෙන්නුම් කරන බදු පෙර අනුපාතයට වට්ටම් කිරීමෙහි වට්ටම් කිරීම භාවිතා කරන විට, කාල පරාසය හේතුවෙන් වෙන්කිරීමෙහි සිදුවන ඉහළයාම, පොළී වියදම් ලෙස හඳුනා ගැනේ.

### 2.6 සේවක ප්‍රතිලාභ

**අ) නිශ්චිත ප්‍රතිලාභ බැඳීම - පාරිතෝෂික**

'ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය' භාවිතා කරමින් සෑම මූල්‍ය වර්ෂයකදීම, ආයුගණකයකුගේ අවවාද අනුව සමාගම විසින් නිශ්චිත සැලසුමක් ලෙස සලකනු ලබන පාරිතෝෂික බැඳීම්වල පොරොන්දු වූ විශ්‍රාම ප්‍රතිලාභවල වර්තමාන අගය ගිණුම් කරනු ලබයි. ආයුගණක ලාභ සහ අලාභ ඒවා හටගන්නා කාලසීමාව තුලදී වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගනු ලබයි. වගකීම මූල්‍යනය කරනු නොලැබේ.

**ආයුගණන ලාභ සහ අලාභ හඳුනාගැනීම**

ආයුගණන ලාභ සහ අලාභ ඒවා හටගන්නා වර්ෂය තුලදී වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගනු ලබයි.

**ආ) නිශ්චිත දායක සැලසුම්**

සමාගම නිශ්චිත දායක සැලසුමක් ද ක්‍රියාත්මක කරයි. නිශ්චිත දායක සැලසුම සඳහා ගෙවිය යුතු දායකය, සේවකයන් විසින් සමාගමට සැපයූ සේවයට සමානුපාතික වන අතර,'කාර්යමණ්ඩල වියදම්' යටතේ වාර්තා කරයි. නොගෙවූ දායක මුදල් වගකීමක් ලෙස වාර්තා කරයි.

සමාගම පහත සඳහන් යෝජනාක්‍රම සඳහා දායක වේ.

**සේවක අර්ථසාධක අරමුදල**

සමාගම හා සේවකයා විසින් පිළිවෙලින් සේවකයාගේ මාසික දළ වැටුපෙන් (අතිකාල රහිතව) 15% සහ 10% බැගින් සේවක අර්ථසාධක අරමුදලට දායක වේ.

**සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල**

සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් පවත්වාගෙන යන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සේවකයාගේ මාසික දළ වැටුපෙන් (අතිකාල රහිතව) 3% ක් සමාගම දායක වේ.

**ඇ) වෛද්‍ය ප්‍රතිලාභ යෝජනාක්‍රමය**

CPSTL සේවකයින් සඳහා වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ජනශක්ති පොදු රක්ෂණ සමාගම විසින් පාලනය කෙරේ. සමාගම විසින් රක්ෂණ සමාගමට ගෙවූ රක්ෂණ වාරිකය වසර තුළ වියදමක් ලෙස හඳුනා ගනී.

### 2.7 නිකුත් කරන ලද නමුත් තවම බලාත්මක නොවන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවල බලපෑම

නව ගිණුම් ප්‍රමිත සමහරක් සහ පවතින ප්‍රමිත වලට සංශෝධන වැඩි දියුණු කිරීම් ප්‍රකාශයට පත්කොට ඇති වුවත් 2017 මාර්තු 31 ගිණුම් කාලපරිච්ඡේදය සඳහා අනිවාර්ය නොවේ. ඒවායින් කිසිවක් සමාගම විසින් පෙර භාවිතා කර නොමැත.

**ශ්‍රීලමුවාප්‍ර 9 මූල්‍ය සාධන පත්‍ර**

2014 දෙසැම්බර් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින්, මූල්‍ය සාධන පත්‍ර ව්‍යාපෘතිවල සියලුම අවධීන් ප්‍රතිබිම්බනය කරන ශ්‍රීලමුවාප්‍ර 9 මූල්‍ය සාධන පත්‍ර වල අවසාන පිටපත නිකුත් කර ඇති අතර, එය මූල්‍ය සාධන පත්‍ර හඳුනාගැනීම සහ මැණීම සඳහා වන ශ්‍රීලගිප්‍ර 39 වෙනුවට ඉදිරිපත් කර ඇත. හානිකරණය වර්ගීකරණය සහ මැණීමේ සහ මතු සුරක්ෂණ ගිණුම්කරණය පිළිබඳ නව අවශ්‍යතාවයන් ප්‍රමිතිය මගින් හඳුන්වා දී ඇත. පෙර භාවිතයට අවසර ලබාදෙමින්, 2018 ජනවාරි 01 දායින් පසුව ඇරඹෙන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා බලාත්මක වේ. අතීතයට බලපාන ලෙස භාවිත කිරීම

# මූල්‍ය ප්‍රකාශන

## වලට සටහන් (ඉතිරි කොටස)

අවශ්‍ය වේ. නමුත් සංසන්දනාත්මක තොරතුරු අනිවාර්ය නොවේ. සංශෝධන යොදා ගැනීමෙන් සමාගමේ මූල්‍ය ප්‍රකාශ වලට බලපෑමක් ඇතිවනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

**ශ්‍රීලමුවාප්‍ර 15 ගනුදෙනුකරුවන් සමග ඇති ගිවිසුම් වලින් අයභාරය**

ගණුදෙනුකරුවකු සමග ඇති ගිවිසුම් මගින් ජනනය වන ආකාරයේ සහ මුදල් ප්‍රවාහයන්ගේ ස්වභාවය, ප්‍රමාණය, කාලය සහ අවිනිශ්චිතතාවය පිළිබඳව මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට ප්‍රයෝජනවත් තොරතුරු වාර්තා කිරීම සඳහා ආයතනයක් විසින් අනුගමනය කලයුතු මූලධර්ම සකස්කිරීම මෙම ප්‍රමිතියේ අරමුණ වේ. ශ්‍රීලමුවාප්‍ර 15  2018 ජනවාර් 01 දින බලාත්මක වන අතර සමාගම ඛණිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදාහැරීම සිදුකරන බැවින් සංශෝධන යොදාගැනීම සමාගමේ විෂයපථය යටතට අයත් නොවන බව  සමාගම අපේක්ෂා කරයි.

**ශ්‍රීලමුවාප්‍ර 16 කල්බදු**

2016 ජනවාරියේ දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් කල්බදු ගිණුම්කරණය සඳහා ශ්‍රීලමුවාප්‍ර 16 කල්බදු බව ප්‍රමිතය නිකුත්කර ඇත. නව ප්‍රමිතය මගින් කල්බදු දීමනාකරුවන් සඳහා කල්බදු ගිණුම්කරණය සැලකියයුතු ලෙස වෙනස් කර නැත.

කෙසේ නමුත් කල්බදු ගිණුම් කරුවන්ට ඔවුන්ගේ ශේෂපත්‍ර වල පාවිච්චි කිරීමට ඇති අයිතිය අනුරූපිත වත්කමක් ලෙස ගෙන,වගකීම් ලෙස හදුනාගැනීමට හදුනාගත් කල්බදු සඳහා කල්බදු ගැණුම් කරුවන් විසින් එක් ආකෘතියක් යොදාගතයුතු නමුදු 'කෙටිකාලීන' කල්බදු සහ 'අඩු වටිනාකම්' සහිත වත්කම් හදුනා ගැනීමට, තෝරාගැනීමක් කල හැක. සාමාන්‍යයෙන් හදුනාගත් කල්බදු සඳහා ලාභ හෝ අලාභ හඳුනාගැනීමේ රටාව, වර්තමානයේ මූල්‍ය කල්බදු ගිණුම්කරණයට සමානවනු ඇති අතර, පොලී සහ ක්ෂය වියදම් ලාභාලාභ ප්‍රකාශයේ වෙන්වෙන්ව හදුනාගනු ලබයි.

2019 ජනවාරි 01 දායින් පසුව ඇරඹෙන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා ශ්‍රීලමුවාප්‍ර 16 බලාත්මක වේ. පෙර භාවිතයට අවසර ඇති නමුදු අයිතීත්වය විසින් ජාමුවාප්‍ර 15 භාවිතයට පෙර නොවිය යුතුය. අතීතයට බලපාන ලෙස භාවිත කිරීම හෝ වැඩි දියුණු කරන ලද ක්‍රමවේදයන් යොදා ගනිමින් ප්‍රමිතය භාවිත කිරීම සඳහා කල්බදු ගැනුම් කරුට තෝරාගත හැක. ප්‍රමිතයේ සංක්‍රාන්ති ප්‍රතිපාදනයන් යම් සහනයක් සලසයි.

ශ්‍රීලමුවාප්‍ර 16 මගින් වියහැකි බලපෑමේ ප්‍රමාණය කලමණාකරණය විසින් තීරණය කල යුතුව ඇත.

**ශ්‍රීලගිප්‍ර 07 මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සංශෝධන**

මූල්‍ය ක්‍රියාකාරකම්වල හෙලිදරව් කිරීම් වැඩිදියුණු කිරීමේ සහ වාර්තාකරන අස්ථිත්වයේ ද්‍රවශීලතා තත්ත්වය පිළිබඳව භාවිතාකරන්නන්ට හොඳින් වටහා ගැනීමට උදව් කිරීමට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් 2016 සැප්තැම්බර් මස ශ්‍රීලගිප්‍ර 07 මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සංශෝධනයක් නිකුත් කර ඇත. නව අවශ්‍යතාවයන් යටතේ මුදල් ප්‍රවාහයන් සහ මුදල් නොවන අයිතමයන්ගේ වෙනස්කම් වැනි මූල්‍ය ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන් අස්ථිත්වයන්ගේ මූල්‍ය වගකීම්වල සිදුවන වෙනස්කම් අස්ථිත්වයන් විසින් හෙළිදරව් කල යුතුය. (උදා: විදේශ විනිමය චලනයන් හේතුවෙන් ඇතිවන ලාභ සහ අලාභ) සංශෝධනයන් 2017 ජනවාරි 01 දින බලාත්මක වේ.

**අගිප්‍ර 12 ආදායම් බදු ට සංශෝධන**

2016 සැප්තැම්බර් මස දී අගිප්‍ර 12 ට සංශෝධනයන් ඉදිරිපත් කිරීම තුලින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ගිණුම්කරණය සඳහා සාධාරණ අගයටත්, බදු කටයුතු සඳහා පිරිවැයටත් මනින ලද ණය සාධන පත්‍රවල විලම්බිත බදු වත්කම් සඳහා වන ගිණුම්කරණ ක්‍රමය පැහැදිලි කරයි. සංශෝධනයන් 2017 ජනවාරි 01 දින බලාත්මක වේ. සංශෝධන යොදා ගැනීමෙන් සමාගමේ මූල්‍ය ප්‍රකාශ වලට බලපෑමක් ඇතිවනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

**2.7.1 පොදු භාවිත පහසුකම් කොටස් හිමියන්ගේ ගිවිසුම හා කොටස් විකුණුම් මිලට ගැනීමේ ගිවිසුම කල් ඉකුත් වීම**

ලංකා ඛනිජතෙල් සංස්ථාව, ලංකා ඉන්දියන් තෙල් සමාගම පීඑල්සී, සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් කොටස් හිමියන්ගේ ගිවිසුම සහ කොටස් විකුණුම් මිලට ගැනීමේ පොදු භාවිත පහසුකම් ගිවිසුම 2008 දෙසැම්බර් 31 දා කල් ඉකුත් විය. එම ගිවිසුම අලුත් කිරීම හෝ දීර්ඝ කිරීම තවම අවසන් කොට නොමැති අතර එය ගිවිසුමේ කොන්දේසි සහ සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කරන ලද යම් පසුකාලීන වෙනස්කම් සැලකිල්ලට ගැනීමෙන් පසු මෙම ගිවිසුමට අදාළ ආදායම් වියදම් මෙම මූල්‍ය ප්‍රකාශවල ගිණුම්ගත කර ඇත

# මූල්‍ය ප්‍රකාශන
## වලට සටහන් (ඉතිරි කොටස)

2018 දෙසැම්බර් 31 දිනට

| | | 2018 රු. | 2017 රු. |
|---|---|---|---|
| 3. | **ආදායම්** | | |
| 3.1 | **ප්‍රධාන ආදායම** | | |
| | පර්යන්ත ආදායම | **7,219,578,282** | 7,306,421,290 |
| | මෙහෙයුම් ආන්තිකය | **3,233,860,313** | 3,264,482,431 |
| | ප්‍රතිපූර්ණය කළහැකි ණය පොළිය | **-** | 708,163,767 |
| | | **10,453,438,595** | 11,279,067,487 |
| | **සේවා සැපයීම** | | |
| | ප්‍රවාහන ආදායම | **2,676,786,208** | 2,663,173,275 |
| | තෙල් නැව් මෙහෙයුම් | **-** | 233,906,148 |
| | | **2,676,786,208** | 2,897,079,423 |
| | **මුළු ආදායම** | **13,130,224,803** | 14,176,146,910 |
| 4 | **වෙනත් මෙහෙයුම් ආදායම** | | |
| | කාර්ය මණ්ඩල ණය සහ වෙනත් දෑ සඳහා පොලිය | **579,450,678** | 352,767,469 |
| | දේපල, පිරියත හා උපකරණ විකිණීම මත ලාභය | **26,421,610** | 3,594,938 |
| | කුලී ආදායම | **9,885,375** | 9,451,537 |
| | මුද්‍රාහැරීමේ ගාස්තු | **1,350,000** | 1,050,000 |
| | විද්‍යාගාර පරීක්ෂණ ගාස්තු | **53,680,584** | 51,377,845 |
| | පුද්ගලික බහුසර් රියදුරන්ට/පොටර්වරුන්ට පුහුණුව | **4,818,444** | 7,232,797 |
| | මිශ්‍ර ආදායම | **8,391,795** | 7,964,028 |
| | ගිනි නිවීමේ උපකරණ සේවා | **1,948,343** | 7,050,482 |
| | ක්‍රමාංකන ගාස්තු | **8,105,578** | 7,435,089 |
| | සුන්බුන් අලෙවිය | **4,122,299** | 5,725,684 |
| | සංචාරක බංගලා ආදායම | **820,184** | 840,425 |
| | ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු | **5,338,223** | 3,306,150 |
| | | **704,333,113** | 457,796,444 |
| 5. | **මූල්‍ය ආදායම සහ වියදම්** | | |
| 5.1 | **මූල්‍ය ආදායම** | | |
| | ප්‍රති ආයොජන (REPO) මත පොළිය | **40,576,962** | 164,547,193 |
| | තැන්පතු මත පොළිය | **77,300,237** | 24,893,612 |
| | | **117,877,199** | 189,440,805 |
| 5.2 | **මූල්‍ය පිරිවැය** | | |
| | බැංකු ණය පොලී | **-** | 124,072,738 |
| | | **-** | 124,072,738 |

# මූල්‍ය ප්‍රකාශන
## වලට සටහන් (ඉතිරි කොටස)

2018 දෙසැම්බර් 31 දිනට

| | | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| **6.** | **බදු පෙර ලාභය** | | |
| | **පහත දෑ අයකිරීමෙන්/බැරකිරීමෙන් පසු** | | |
| | **සෘජු වියදම්වල ඇතුළත් දෑ** | | |
| | පුද්ගලික පිරිවැය | **2,954,073,137** | 2,403,087,576 |
| | වසර සඳහා ක්ෂයවීම් ගාස්තු | **820,253,095** | 755,314,575 |
| | **පරිපාලන වියදම්වල ඇතුළත් දෑ** | | |
| | අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික | **8,539,121** | 7,479,373 |
| | අධ්‍යක්ෂවරු සඳහා ගාස්තු | **2,893,207** | 2,305,000 |
| | පුද්ගලික පිරිවැය | **3,491,632,362** | 2,783,783,740 |
| | නිශ්චිත ප්‍රතිලාභ බැඳීම : වසර සඳහා ගාස්තුව | **226,725,802** | 242,188,768 |
| | විගණන ගාස්තුව - පවත්නා වසර | **1,943,223** | 1,800,000 |
| | වසර සඳහා ක්ෂයවීම් ගාස්තු | **131,147,766** | 123,041,041 |
| | වසර සඳහා ක්‍රමක්ෂය ගාස්තු | **4,486,998** | 7,331,222 |
| | වෙළෙඳ හා අනෙකුත් ලැබීම් හි හානිකරණය සඳහා අත්තිකාරම් | **(174,665,455)** | (2,705,842) |
| | තොග සඳහා වෙන්කිරීම | **(127,236,542)** | 10,193,802 |

**7. බදු වියදම්**

2018දෙසැම්බර් 31 සහ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආදායම් බදු වියදම්වල ප්‍රධාන සංරචක පහතින් දැක්වේ:

**7.1 ආදායම් ප්‍රකාශය**

| | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| **ප්‍රවර්තන ආදායම් බද්ද** | | |
| ප්‍රවර්තන බදු වියදම් | **333,928,430** | 472,786,727 |
| පෙර වර්ෂය වෙනුවෙන් ප්‍රවර්තන බදු ඌණ / අධි වෙන්කිරීම | **28,844,501** | (23,205,120) |
| **විලම්භිත බදු;** | | |
| විලම්භිත බදු අයකිරීම /(බැර) (සටහන 8) | **962,139,274** | 24,155,981 |
| **ආදායම් ප්‍රකාශනයේ වාර්තාකරන ආදායම් බදු වියදම /(බැර)** | **1,324,912,205** | 473,737,588 |

**7.2** 2018 දෙසැම්බර් 31 සහ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා බදු වියදම හා ගිණුම්කරණ ලාභය ව්‍යවස්ථාපිත බදු අනුපාතයෙන් ගුණ කිරීමෙන් ලද ලාභය අතර සැසැඳුම පහත දැක්වේ

| | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| බදු පෙර ගිණුම්කරණ ලාභය | **1,522,230,109** | 3,273,309,403 |
| ඉඩ නොදෙන ලද සමස්ථ අයිතමයන් | **1,457,934,083** | 1,325,643,704 |
| ඉඩ දෙන ලද සමස්ථ අයිතමයන් | **(1,979,521,282)** | (1,783,288,276) |
| | **1,000,642,910** | 2,815,664,831 |
| පොළී ආදායම | **305,279,691** | 542,208,274 |
| මුළු ව්‍යවස්ථාපිත ආදායම | **1,305,922,601** | 3,357,873,104 |
| අඩුකළා : ඉදිරියට ගෙනා භාවිතාකළ බදු අලාභ | **-** | (232,124,899) |
| බදුකළහැකි ලාභය | **1,305,922,601** | 3,125,748,205 |
| බදුකළහැකි ලාභය සඳහා ආදායම් බදු | **333,928,430** | 472,786,727 |
| ප්‍රවර්ථන ආදායම් බදු වියදම් | **333,928,430** | 472,786,727 |

# මූල්‍ය ප්‍රකාශන

## වලට සටහන් (ඉතිරි කොටස)

2018 දෙසැම්බර් 31 දිනට

| | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | | විස්තීරණ ආදායම ප්‍රකාශය | | වෙනත් විස්තීරණ ආදායම | |
|---|---|---|---|---|---|---|
| | 2018 රු. | 2017 රු. | 2018 රු. | 2017 රු. | 2018 රු. | 2017 රු. |
| **විලම්භිත බදු වගකීම්** | | | | | | |
| බදු අරමුණු සඳහා ප්‍රාග්ධන දීමනා | **2,355,880,566** | 1,258,921,406 | **1,096,959,160** | 12,841,117 | **-** | - |
| අස්පෘශ්‍ය වත්කම් | **1,997,748** | 37,336 | **1,960,412** | (1,005,100) | **-** | - |
| | **2,357,878,314** | 1,258,958,742 | | | | |
| **විලම්භිත බදු වත්කම්** | | | | | | |
| තොග | **3,829,479** | 19,208,216 | **15,378,737** | (1,024,963) | **-** | - |
| වෙන්කිරීම් | **1,851,253** | 24,493,908 | **22,642,655** | 844,541 | **-** | - |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් | **354,571,409** | 198,104,242 | **(174,801,690)** | (16,275,721) | **18,334,523** | (12,760,821) |
| බදු අලාභයෙන් බලපෑම | **-** | - | **-** | 28,776,108 | **-** | - |
| | **360,252,141** | 241,806,367 | | | | |
| විලම්භිත ආදායම් බදු -ආදායම | | | | | | |
| **ශුද්ධ විලම්භිත බදු වගකීම/(වත්කම්)** | **1,997,626,173** | 1,017,152,375 | **962,139,274** | 24,155,981 | **18,334,523** | (12,760,821) |

**8.2** 24.42%ක ඵලදායි බදු අනුපාතයක් භාවිතා කරමින් විලම්භිත බදු ගණනය කර ඇත. බදු අයකළහැකි ආදායමේ වෙනස් මට්ටම්වලට භාවිතා කළ විවිධ බදු අනුපාත හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු. 980,473,797/- ක වැඩි වූ විලම්භිත බදු ඇතිකරමින්, බදු අනුපාතය 13.44% සිට 24.42% දක්වා අඩුව් ඇත.

### 9. කොටසක ඉපයීම්

**9.1** කොටසක ඉපයීම ගණනය කරනු ලබන්නේ සාමාන්‍ය ස්කන්ධ ප්‍රාග්ධන හිමිකරුවන්ට ආරෝපිත කාල පරිච්ඡේදය සඳහා වන ශුද්ධ ලාභය වර්ෂය තුළ බර තැබූ සාමාන්‍ය කොටස් ගණනින් බෙදීමෙනි. මෙම පරිච්ඡේදය සහ පෙර කාල පරිච්ඡේදය තුළ නිකුත්ව පවත්නා සාමාන්‍ය කොටස්වල සාමාන්‍ය බරතබන ලද සංඛ්‍යාව ප්‍රසාද දීමනාව වැනි මූලාශ්‍රයන්හී අනුරූප වෙනසක් නොමැතිව නිකුත්ව පවත්නා සාමාන්‍ය කොටස් සංඛ්‍යාව වෙනස් වී ඇති සිදුවීම් සඳහා ගලපනු ලැබේ.

**9.2** කොටසක ඉපයීම ගණනය කිරීම සඳහා භාවිතා කළ ආදායම් සහ කොටස් දත්ත පහත

| | 2018 රු. | 2017 රු. |
|---|---|---|
| **ලවය වශයෙන් යොදාගත් සංඛ්‍යාවන්** | | |
| කොටසක මූලික ඉපයීම් සඳහා සාමාන්‍ය කොටස් හිමියන්ට හිමිවන ශුද්ධ ලාභය | **197,317,904** | 2,799,571,815 |
| **හරය වශයෙන් යොදාගත් සාමාන්‍ය කොටස් සංඛ්‍යාව:** | | |
| මූලික කොටසක ඉපයුමට අදාළ වන නිකුත්ව ඇති බරතැබූ සාමාන්‍ය කොටස් ගණන | **750,000,000** | 750,000,000 |
| කොටසක මූලික ඉපයුම | | |
| කොටසක ඉපයුම | **0.26** | 3.73 |

# මූල්‍ය ප්‍රකාශන

## වලට සටහන් (ඉතිරි කොටස)

2018 දෙසැම්බර් 31 දිනට

| පිරිවැයට | 2018.01.0.1 දිනට ශේෂය රු. | එකතුකිරීම් රු. | බැහැරකිරීම් රු. | 2018.12.31 දිනට ශේෂය රු. |
|---|---|---|---|---|
| **10. දේපල, පිරියත හා උපකරණ** | | | | |
| **10.1 දළ ධාරණ අගය** | | | | |
| සින්නක්කර ඉඩම් | **4,497,001,663** | - | | **4,497,001,663** |
| සින්නක්කර ගොඩනැගිල්ල | **1,683,131,781** | 1,680,000 | | **1,684,811,781** |
| ගබඩා ටැංකිය | **6,541,878,129** | 487,829 | | **6,542,365,958** |
| මෝටර් රථ | **1,752,841,309** | 131,980,646 | (47,185,538) | **1,837,636,417** |
| නළ මාර්ග | **7,443,077,165** | 4,029,382 | | **7,447,106,547** |
| ලිබඩු, සවිකිරීම් හා උපකරණ | **2,192,778,730** | 67,778,317 | (103,990) | **2,260,453,057** |
| පරිගණක | **171,586,351** | 124,003,753 | | **295,590,104** |
| තනි/ ද්විත්ව ශීර්ෂ බෝයාව | **2,800,409,453** | | | **2,800,409,453** |
| පොම්ප සහ ග්‍රැන්ට් | **1,454,497,750** | 188,134 | | **1,454,685,884** |
| **ක්ෂයකළ හැකි වත්කම්වල මුළු පිරිවැය** | **28,537,202,331** | 330,148,061 | (47,289,528) | **28,820,060,864** |
| **නොනිමි ප්‍රාග්ධනය** | **719,973,606** | 242,880,832 | (327,340,127) | **635,514,312** |
| | **29,257,175,937** | 573,028,893 | (374,629,655) | **29,455,575,176** |

| පිරිවැයට | 2018.01.0.1 දිනට දිනට ශේෂය රු. | වසර සඳහා වියදම රු. | බැහැරකිරීම් රු. | 2018.12.31 දිනට ශේෂය රු |
|---|---|---|---|---|
| **10.2 ක්ෂයවීම්** | | | | |
| සින්නක්කර ගොඩනැගිල්ල | **582,686,459** | 48,794,336 | | **631,480,795** |
| ගබඩා ටැංකිය | **2,433,045,074** | 154,469,755 | | **2,587,514,829** |
| මෝටර් රථ | **1,192,414,995** | 143,562,331 | (47,087,716) | **1,288,889,610** |
| නළ මාර්ග | **2,927,988,888** | 278,019,291 | | **3,206,008,179** |
| ලිබඩු, සවිකිරීම් හා උපකරණ | **1,857,903,096** | 75,366,362 | (28,954) | **1,933,240,503** |
| පරිගණක | **155,062,435** | 8,995,831 | | **164,058,266** |
| තනි/ ද්විත්ව ශීර්ෂ බෝයාව | **2,316,017,571** | 160,547,288 | | **2,476,564,859** |
| පොම්ප සහ ග්‍රැන්ට් | **1,037,308,962** | 83,654,430 | | **1,120,963,392** |
| | **12,502,427,480** | 953,409,624 | (47,116,670) | **13,408,720,433** |

| | 2018 රු. | 2017 රු. |
|---|---|---|
| **10.3 ශුද්ධ පොත් වටිනාකම** | | |
| සින්නක්කර ඉඩම් | **4,497,001,663** | 4,497,001,663 |
| සින්නක්කර ගොඩනැගිල්ල | **1,053,330,986** | 1,100,445,323 |
| ගබඩා ටැංකිය | **3,954,851,130** | 4,108,833,054 |
| මෝටර් රථ | **548,746,807** | 560,426,315 |
| නළ මාර්ග | **4,241,098,368** | 4,515,088,277 |
| ලිබඩු, සවිකිරීම් හා උපකරණ | **327,212,554** | 334,875,634 |
| පරිගණක | **131,531,838** | 16,523,916 |
| තනි/ ද්විත්ව ශීර්ෂ බෝයාව | **323,844,594** | 484,391,882 |
| පොම්ප සහ ග්‍රැන්ට් | **333,722,492** | 417,188,788 |
| නොනිමි ප්‍රාග්ධක වැඩ | **635,514,312** | 719,973,606 |
